

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
දසවැනි පාර්ලිමේන්තුවේ
පළමුවැනි සභාවාරය

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 733

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ
දහඅටවැනි වාර්තාව

(පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින්
එහි විෂය පථය යටතට ගැනෙන ආයතනයන්හි සැලසුම්
විමර්ශනය සඳහා පත් කරනු ලැබූ IIIවැනි අනුකාරක සභාව විසින්
2026.07.07 වැනි දින සිට 2026.09.25 වැනි දින දක්වා
ආයතන 41ක් සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනයන්හි
ප්‍රථම අදියරේ වාර්තාව)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති
පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා
විසින්

2026 නොවැම්බර් මස 16 වැනි දින ඉදිරිපත් කරන ලදී

2026 නොවැම්බර් මස 16 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය
කළ යුතු යැයි නියෝග කරන ලදී.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින්
එහි විෂය පථය යටතට ගැනෙන ආයතනයන්හි සැලසුම්
විමර්ශනය සඳහා පත් කරනු ලැබූ III වැනි අනුකාරක සභාව විසින්
2026.07.07 වැනි දින සිට 2026.09.25 වැනි දින දක්වා
ආයතන 41ක් සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනයන්හි
ප්‍රථම අදියරේ වාර්තාව

අනු කාරක සභාවේ සභාපතිවරුන් වන

ගරු අසිත නිරෝෂණ එගොඩවිතාන මහතා
ගරු තිලිණ සමරකෝන් මහතා
ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා
ගරු දිනේෂ් හේමන්ත මහතා

විසින්

2026ක් වූ නොවැම්බර් මස 04වැනි දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක
සභාව වෙත ඉදිරිපත් කරන ලදුව

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් අනුමත කරන ලදී.

දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සංයුතිය

1. ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා, පා.ම., (සභාපති)
2. ගරු අර්කම් ඉල්යාස් මහතා,පා.ම., (2025.05.08 දින සිට)
3. ගරු මනෝ ගනේෂන් මහතා, පා.ම., *(2025.03.21 දින සිට.)*
4. ගරු (නීතිඥ) දයාසිරි ජයසේකර මහතා, පා.ම., *(2025.05.20 දින සිට)*
5. ගරු රෝහිත අබේගුණවර්ධන මහතා, පා.ම., *(2026.10.06 දින සිට)*
6. ගරු (නීතිඥ) අර්ජුන සුජීව සේනසිංහ මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
7. ගරු ඩී.වී. චානක මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
8. ගරු නලීන් බණ්ඩාර ජයමහ මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
9. ගරු. එස්.එම් මරික්කාර් මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
10. ගරු මුජීබුර් රහුමාන් මහතා, පා.ම., *(2025.05.20 දින සිට)*
11. ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
12. ගරු අබූබකර් අතම්බාවා මහතා, පා.ම., *(2025.05.08 දින සිට)*
13. ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා, පා.ම.,
14. ගරු (නීතිඥ) නිලන්ති කොට්ටහච්චි මහත්මිය, පා.ම., *(2025.03.21 දින සිට)*
15. ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය, පා.ම.,
16. ගරු දිලිත් ජයවීර මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
17. ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා, පා.ම., *(2025.05.08 දින සිට)*
18. ගරු සුජීව දිසානායක මහතා, පා.ම.,
19. ගරු සුදත් බලගල්ල මහතා, පා.ම.,
20. ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා, පා.ම.,
21. ගරු ලුතිනන් කමාන්ඩර්(විශ්‍රාමික)ප්‍රගීත් මධුරංග මහතා,පා.ම.,*(2025.03.21දින සිට)*
22. ගරු ජගත් මනුවර්ණ මහතා, පා.ම.,
23. ගරු රුවන් මාපලගම මහතා, පා.ම.,
24. ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.,
25. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම.,
26. ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම.,
27. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
28. ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම.,
29. ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම.,
30. ගරු (නීතිඥ) ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය, පා.ම.,
31. ගරු දිනේෂ් හේමන්ත මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*

දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය
උපායමාර්ගික සැලසුම් විමර්ශනය සඳහා පත් කරන ලද ඉදිරිපත් කිරීම් සඳහා වන 111වැනි අනු කාරක සභාවේ සංයුතිය

1. **ආයතන සැලසුම් සම්බන්ධයෙන් පත් කළ 111වැනි අනු කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරුන්ගේ සංයුතිය**

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ආයතනික සැලසුම් පරීක්ෂා කිරීම සඳහා පත් කරන ලද IIIවැනි අනු කාරක සභාව යටතේ ප්‍රථම අදියරේදී සභාපතිවරයා ඇතුළුව සමාජිකයින් 03 කින් සැදුම්ලත් අනු කාරක සභා 09ක් **2026.06.24** දින පත් කරන ලදී.

අනුකාරක සභාව III.1

අංකය	මන්ත්‍රීවරයාගේ නම	තනතුර
1	**ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා, පා.ම.**	**සභාපති**
2	ගරු මනෝ ගනේෂන් මහතා, පා.ම.	සාමාජික
3	ගරු අර්කම් ඉල්යාස් මහතා, පා.ම.	සාමාජික

අනුකාරක සභාව III.2

අංකය	මන්ත්‍රීවරයාගේ නම	තනතුර
1	**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය, පා.ම.**	**සභාපති**
2	ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා, පා.ම.	සාමාජික
3	ගරු අබූබකර් අතම්බාවා මහතා, පා.ම.	සාමාජික

අනුකාරක සභාව III.3

අංකය	මන්ත්‍රීවරයාගේ නම	තනතුර
1	**ගරු සුජීව දිසානායක මහතා, පා.ම.**	**සභාපති**
2	ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා, පා.ම.	සාමාජික
3	ගරු රුවන් මාපලගම මහතා, පා.ම.	සාමාජික

අනුකාරක සභාව III.4

අංකය	මන්ත්‍රීවරයාගේ නම	තනතුර
1	**ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය, පා.ම.**	**සභාපති**
2	ගරු ඩී. වී. චානක මහතා, පා.ම.	සාමාජික
3	ගරු සුදත් බලගල්ල මහතා, පා.ම.	සාමාජික

අනුකාරක සභාව III.5

අංකය	මන්ත්‍රීවරයාගේ නම	තනතුර
1	**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම.**	**සභාපති**
2	ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා, පා.ම.	සාමාජික
3	ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා, පා.ම.	සාමාජික

අනුකාරක සභාව III.6

අංකය	මන්ත්‍රීවරයාගේ නම	තනතුර
1	**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම.**	**සභාපති**
2	ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා, පා.ම.	සාමාජික
3	ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා, පා.ම.	සාමාජික

අනුකාරක සභාව III.7

අංකය	මන්ත්‍රීවරයාගේ නම	තනතුර
1	**ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම.**	**සභාපති**
2	ගරු එස්. එම්. මරික්කාර් මහතා, පා.ම.	සාමාජික
3	ගරු ජගත් මනුවර්ණ මහතා, පා.ම.	සාමාජික

අනුකාරක සභාව III.8

අංකය	මන්ත්‍රීවරයාගේ නම	තනතුර
1	**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම.**	**සභාපති**
2	ගරු මුජිබුර් රහුමාන් මහතා, පා.ම.	සාමාජික
3	ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.	සාමාජික

අනුකාරක සභාව III.9

අංකය	මන්ත්‍රීවරයාගේ නම	තනතුර
1	**ගරු දිනේෂ් හේමන්ත මහතා, පා.ම.**	**සභාපති**
2	ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම.	සාමාජික
3	ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය, පා.ම.	සාමාජික

2. **<u>ආයතන සැලසුම් සම්බන්ධයෙන් පත් කළ 111වැනි අනු කාරක සභා සාමාජික මන්ත්‍රීවරුන්ගේ සංයුතිය සංශෝධනය කිරීම - 2026.09.23</u>**

111වැනි අනු කාරක සභාව සඳහා නම් කරන ලද සභාපතිවරයාට සහභාගී වීමට අපහසු අවස්ථාවලදී අනෙක් ඕනෑම සාමාජික මන්ත්‍රීවරයෙකු සභාපති ලෙස පත්කර ගත හැකිවීමෙන් අනු කාරක සභා රැස්වීම් සුමටව පැවැත්වීමට හැකි වන පරිදි සභාපති ඇතුළුව සාමාජික මන්ත්‍රීවරුන් 5දෙනා බැගින් වූ අනුකාරක සභා 4ක් 2026.09.23 දින පහත පරිදි පත් කරන ලදී.

අංකය	සාමාජිකයන්	කාර්යභාරය
අනු කාරක සභා III.1		
1.	**ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම.,**	**සභාපති**
2.	ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා, පා.ම.,	සාමාජික
3.	ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.,	සාමාජික
4.	ගරු සුදත් බලගල්ල මහතා, පා.ම.,	සාමාජික
5.	ගරු එස්. එම්. මරික්කාර් මහතා, පා.ම.,	සාමාජික
අනු කාරක සභා III.2		
1.	**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම.,**	**සභාපති**
2.	ගරු ජගත් මනුවර්ණ මහතා, පා.ම.,	සාමාජික
3.	ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය, පා.ම.,	සාමාජික
4.	ගරු රුවන් මාපලගම මහතා, පා.ම.,	සාමාජික
5.	ගරු (නීතිඥ) දයාසිරි ජයසේකර මහතා, පා.ම.,	සාමාජික
අනු කාරක සභා III.3		
1.	**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම.,**	**සභාපති**
2.	ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා, පා.ම.,	සාමාජික
3.	ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය, පා.ම.,	සාමාජික
4.	ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා, පා.ම.,	සාමාජික
5.	ගරු මුජිබුර් රහුමාන් මහතා, පා.ම.,	සාමාජික
අනු කාරක සභා III.4		
1.	**ගරු දිනේෂ් හේමන්ත මහතා, පා.ම.,**	**සභාපති**
2.	ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය, පා.ම.,	සාමාජික
3.	ගරු සුජීව දිසානායක මහතා, පා.ම.,	සාමාජික
4.	ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම.,	සාමාජික
5.	ගරු ඩී. වී. චානක මහතා, පා.ම.,	සාමාජික

කාරක සභාවේ උපදේශකවරුන්

- උපදේශක, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව } සරත් මායාදුන්නේ මහතා
- උපදේශක, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව - පියසේන රණසිංහ මහතා

කාරක සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වත්මන් කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

- සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) - එම්.කේ.එස්.ඩී. අල්විස් මිය
- ප්‍රධාන නිලධාරි - එච්. රූපානි ද සොයිසා මිය
- නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී - ලක්ෂාන් චික්‍රම මයා
- පාර්ලිමේන්තු නිලධාරී - ජී. වී. එස්. කේ. කුමාරි මිය
- පාර්ලිමේන්තු නිලධාරී - අයි. එස්. ගෝමස් මිය
- පාර්ලිමේන්තු නිලධාරී - ජී. එල්. ඩී. ප්‍රනාන්දු මිය
- පාර්ලිමේන්තු නිලධාරී - එම්. එන්. පී. පෙරේරා මෙය
- විශ්ව විද්‍යාල ආධුනික -එස්. ඒ. ජීවන්ත ඉඳුනිල් මයා

පටුන

		පිටු අංක
1.	සභාපතිතුමාගේ සටහන	9
2.	විධායක සාරාංශය	11
3.	111වැනි අනුකාරක සභාව පත් කිරීමේ අරමුණ	14
4.	විමර්ශනය කරන ලද ආයතනයන්ට අදාළ කරුණු	15
5.	ප්‍රගති සමාලෝචන රැස්වීම	124
6.	ඇමුණුම 01: ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120 - පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව 131 - කාරක සභා සඳහා පොදු රීති	129

.

සභාපතිතුමාගේ සටහන

රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධව පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන ගිණුම්, විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අරමුණ වුවත්, අප රටේ රාජ්‍ය ව්‍යාපාර නිසි පරිදි සැලසුම් සකස්කරනවාද, එසේම එම සැලසුම්වලට අනුගත වනවාද යන්න පිළිබඳව පූර්ව ඇගයීම් ක්‍රමවේදයක් ඇතිකිරීම මගින් ඒ ඒ ආයතනයන්හි කාර්යසාධනය ඉහළ නැංවීම අරමුණුකරගනිමින් නව ක්‍රමවේදයන් හඳුන්වා දීම තුලින්, එම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අනු කමිටු පත්කිරීම මා විසින් සිදු කරන ලදී. ඒ අනුව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව යටතේ IIIවැනි අනුකාරක සභාව පිහිටුවන ලද අතර එහි ප්‍රථම අදියරේදී අනු කොටස් 9ක් අනු කාරක සභා සභාපතිවරු 9ක් යටතේ හා ඉන් පසුව ක්‍රියාත්මක වීමේ පහසුව පිණිස අනු කොටස් 04ක් අනු කාරක සභා සභාපතිවරු 04ක් යටතේ සංවිධානය කරන ලදී.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ IIIවැනි අනුකාරක සභාවේ පළමු වාරයේ කටයුතු 2026.07.07වැනි දින සිට 2026.09.25 වැනි දින දක්වා ආයතන 41ක් සම්බන්ධයෙන්, රාජ්‍ය ව්‍යවසායන්හි ආයතනික සැලසුම්, ක්‍රියාකාරී සැලසුම්, ප්‍රසම්පාදන සැලසුම් සහ අයවැය සැලසුම් පිළිබඳව විධිමත් ඇගයීමක් සිදු කිරීම අරමුණු කර ගනිමින් අදාළ ආයතනවල ඉදිරිපත් කිරීම් හා සාකච්ඡා පවත්වන ලදී.

මෙම ක්‍රියාවලියේ ප්‍රධාන අරමුණ වූයේ එක් එක් ආයතනයේ ආයතනික අරමුණු, උපායමාර්ගික දිශානතිය, අපේක්ෂිත ප්‍රතිඵල සහ කාර්යසාධනය මැනීම සඳහා යොදාගනු ලබන ප්‍රධාන කාර්යසාධන දර්ශක (Key Performance Indicators – KPIs) පිළිබඳව ගැඹුරු ඇගයීමක් සිදු කිරීමයි. ඒ අනුව, 2026 සැප්තැම්බර් මස 25වැනි දින දක්වා අනුකාරක සභාව වෙත ඉදිරිපත් කිරීම් සිදු කළ ආයතන සම්බන්ධයෙන්, අදාළ ආයතනවල ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුනා ගැනීම හා ඒවායේ ප්‍රගතිය ඇගයීම සඳහා විශේෂ සාකච්ඡාවක් 2026.10.22වැනි දින පාර්ලිමේන්තුවේදී පවත්වන ලදී.

එමෙන්ම, අනුකාරක සභාවේ සාමාජිකයන්ගේ නිරීක්ෂණ හා නිර්දේශ මෙන්ම ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන්ගේ සහ මහා භාණ්ඩාගාරයේ නිලධාරීන්ගේ වෘත්තීයමය අදහස් හා දායකත්වය ද මෙම ඇගයීම් ක්‍රියාවලිය වඩාත් ශක්තිමත් කිරීමට ඉවහල් විය.

මෙම වැදගත් කාර්යභාරය සාර්ථක කර ගැනීම සඳහා කැපවීමෙන් දායක වූ අනුකාරක සභාවේ සියලුම සභාපතිවරු හා ගරු සාමාජික මන්ත්‍රීවරයන්ටත්, කථානායකතුමා ප්‍රධාන පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයෙන් සහ කාරක සභාවේ උපදේශකවරු දෙදෙනාටත්, ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන්ටත්, මහා භාණ්ඩාගාරයේ නිලධාරීන්ටත්, අදාළ රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් ඇතුළු සියලුම නිලධාරීන්ටත් මාගේ අවංක ස්තුතිය හා ප්‍රශංසාව පිරිනමමි.

රාජ්‍ය ව්‍යවසායන්හි කාර්යක්ෂමතාව, ඵලදායීතාව, මූල්‍ය විනය සහ යහපාලනය තහවුරු කිරීම සඳහා මෙවැනි ක්‍රමානුකූල හා ප්‍රතිඵල කේන්ද්‍රීය ඇගයීම් ක්‍රියාවලියක් අතිශයින් වැදගත් වන බව මාගේ විශ්වාසයයි. එබැවින්, මෙම අනුකාරක සභාවේ කටයුතු තුළින් ඉදිරිපත් වන නිරීක්ෂණ හා නිර්දේශ අදාළ ආයතනවල කාර්යසාධනය වැඩිදියුණු කිරීමටත්, මහජන මුදල් වඩාත් වගකීමෙන් හා ඵලදායීව භාවිත කිරීමටත් දායක වනු ඇතැයි අපේක්ෂා කරමි.

වෛද්‍ය නිශාන්ත සමරවීර
සභාපති
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

විධායක සාරාංශය

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ IIIවැනි අනුකාරක සභාව පිහිටුවීමේ මූලික අරමුණ වූයේ රාජ්‍ය ව්‍යවසායන්හි සැලසුම්කරණය, කළමනාකරණය, කාර්යසාධනය සහ මූල්‍ය විනය පිළිබඳව වඩාත් ක්‍රමානුකූල හා ප්‍රතිඵල කේන්ද්‍රීය අධීක්ෂණ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීමයි.

ඒ අනුව, අදාළ රාජ්‍ය ව්‍යවසායයන්හි ආයතනික සැලසුම් (Corporate Plans), ක්‍රියාකාරී සැලසුම් (Action Plans), ප්‍රසම්පාදන සැලසුම් (Procurement Plans) සහ අයවැය සැලසුම් (Budget Plans) විධිමත්ව පරීක්ෂා කර ඇගයීම මෙම අනුකාරක සභාවේ ප්‍රධාන කාර්යභාරය විය. එමගින් එක් එක් ආයතනයේ උපායමාර්ගික අරමුණු, අපේක්ෂිත ප්‍රතිඵල, සම්පත් වෙන් කිරීම සහ සැලසුම්ගත කාර්යසාධනය අතර පවතින සම්බන්ධතාව ඇගයීමට ලක් කරන ලදී.

මෙම කාර්යභාරය ඉටු කිරීම සඳහා ප්‍රථම අදියර සඳහා විවිධ ආර්ථික හා සේවා ක්ෂේත්‍ර නියෝජනය කරනු ලබන රාජ්‍ය ව්‍යවසායයන් 41ක් අනුකාරක සභාව වෙත කැඳවා, ඒවායේ සැලසුම් හා අදාළ ක්‍රියාකාරකම් පිළිබඳව කරුණු විමසීම සහ සාකච්ඡා කිරීම සිදු කරන ලදී. එම ආයතනවල නම් සහ අනුකාරක සභාව වෙත කැඳවනු ලැබූ දිනයන් පහත වගුවෙහි දක්වා ඇත.

වගුව 01 – අනුකාරක සභාව වෙත කැඳවනු ලැබූ රාජ්‍ය ව්‍යවසායයන්

අනු අංකය	ආයතනයේ නම	කැඳවූ දිනය
01	මහජන බැංකුව	2026.07.07
02	ජාතික ආරක්ෂක විද්‍යායතනය	2026.07.07
03	පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය	2026.07.07
04	මාර්ග සංවර්ධන අධිකාරිය	2026.07.07
05	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය	2026.07.09
06	BOC Travels (පුද්ගලික සමාගම)	2026.07.09
07	රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	2026.07.10
08	සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය	2026.07.10
09	ලෝහෝර් ආර්යා ණය මුදල	2026.07.21
10	ලංකා විදුලි (පුද්ගලික) සමාගම	2026.07.21
11	කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය	2026.07.21

12	රක්නා ආරක්ෂණ ලංකා සමාගම	2026.07.23
13	ලංකා හොස්පිටල් කෝපරේෂන් පී.එල්.සී	2026.07.23
14	ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය	2026.07.24
15	කැලණිය විශ්වවිද්‍යාලය	2026.07.24
16	සංවර්ධන ලොතරැයි මණ්ඩලය	2026.08.04
17	ලංකා බැංකුව	2026.08.04
18	ජාතික ලොතරැයි මණ්ඩලය	2026.08.04
19	ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම	2026.08.06
20	ශ්‍රී ලන්කන් කේටරින් සමාගම	2026.08.07
21	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව	2026.08.07
22	සීමාසහිත ලංකා පොහොර සමාගම	2026.08.18
23	සීමාසහිත මිල්කෝ පෞද්ගලික සමාගම	2026.08.18
24	ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය	2026.08.18
25	ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	2026.08.18
26	ශ්‍රී ලංකා නීති ආධාර කොමිසම	2026.08.20
27	ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය	2026.08.20
28	නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව	2026.08.21
29	ලංකා ලුණු සමාගම	2026.08.21
30	පිපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී	2026.09.08
31	ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය	2026.09.08
32	ජාතික අධ්‍යාපන ආයතනය	2026.09.08
33	රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව	2026.09.08
34	ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය	2026.09.10
35	ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය	2026.09.10
36	ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය	2026.09.11
37	වී අලෙවි මණ්ඩලය	2026.09.11
38	ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව	2026.09.22
39	ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම	2026.09.22
40	පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය	2026.09.22
41	නාගරික සංවර්ධන අධිකාරිය	2026.09.22

අනුකාරක සභාවේ විමර්ශන ක්‍රියාවලිය තුළ අදාළ ආයතනයන්හි සැලසුම්වල අන්තර්ගතය, ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා පවතින ආයතනික සූදානම, මූල්‍ය හා මානව සම්පත් කළමනාකරණය, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විධිමත්භාවය

සහ අපේක්ෂිත කාර්යසාධන ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීමේ හැකියාව පිළිබඳව විශේෂ අවධානය යොමු කරන ලදී.

තවද, අදාළ ආයතනවල කාර්යසාධනය මැනීම සහ ඇගයීම සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශක (Key Performance Indicators – KPIs) හඳුනාගැනීම මෙම ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස සැලකුණි. ඒ අනුව, 2026 සැප්තැම්බර් මස 25 වැනි දින දක්වා අනුකාරක සභාව වෙත ඉදිරිපත් කිරීම් සිදු කළ ආයතනවල කාර්යසාධන දර්ශක හඳුනාගැනීම සහ ඒවායේ මැනිය හැකි ඉලක්ක පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා විශේෂ රැස්වීමක් 2026.10.22වැනි දින පාර්ලිමේන්තුවේදී පවත්වන ලදී.

එමෙන්ම, හඳුනාගනු ලබන කාර්යසාධන දර්ශක පදනම් කර ගනිමින් ඉදිරි කාලසීමාවන් තුළ රාජ්‍ය ව්‍යවසායන්හි ප්‍රගතිය අඛණ්ඩව අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ද මෙම ක්‍රියාවලිය මගින් අවශ්‍ය පසුබිම නිර්මාණය කර ඇත.

111වැනි අනු කාරක සභාව පත් කිරීමේ අරමුණ

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් මෙතෙක් ප්‍රධාන වශයෙන් විගණකාධිපතිවරයාගේ වාර්තා පදනම් කර ගනිමින් රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය හා මෙහෙයුම් කාර්යසාධනය පරීක්ෂා කිරීම සිදු කරන ලදී. එම ක්‍රියාවලියට අමතරව, ආයතනවල අනුමත ආයතනික සැලසුම්, ක්‍රියාකාරී සැලසුම්, ප්‍රසම්පාදන සැලසුම් සහ වාර්ෂික අයවැය සැලසුම් පදනම් කරගත් පූර්ව ඇගයීම් ක්‍රමවේදයක් හඳුන්වා දීමේ අරමුණින් මෙම අනුකාරක සභාව පත් කිරීමට තීරණය කරන ලදී.

ඒ අනුව, අදාළ රාජ්‍ය ව්‍යවසායන්හි ප්‍රධානීන් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ඉහත සැලසුම් පිළිබඳ ඉදිරිපත් කිරීම් හා කරුණු විමසීම් සිදු කිරීමටත්, එක් ආයතනයක් සඳහා පැය 1ක කාලයක් වෙන් කරමින් විනාඩි 20ක් ඉදිරිපත් කිරීම සඳහා ද විනාඩි 40ක් ප්‍රශ්න කිරීම් සඳහා ද වෙන් කිරීමටත් සැලසුම් කරන ලදී.

මෙම වැඩපිළිවෙළ මගින් රාජ්‍ය ව්‍යවසායන්හි සැලසුම්ගත කාර්යසාධනය ඇගයීම, මූල්‍ය විනය හා ආයතනික වගවීම ශක්තිමත් කිරීම සහ මහජන දැනුවත්භාවය වර්ධනය කිරීම අපේක්ෂා කරන ලදී. ඒ අනුව, 2026 ජූලි මස 07 වැනි දින සිට ක්‍රියාවලිය ආරම්භ කිරීමටත්, පරීක්ෂණ කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව සිදු කිරීම සඳහා 111වැනි අනුකාරක සභාව පත් කිරීමටත් කාරක සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් එහි විෂය පථය යටතට ගැනෙන ආයතනයන්හි සැලසුම් විමර්ශනය සඳහා පත් කරනු ලැබූ 111වැනි අනුකාරක සභාව විසින් 2026.07.07 දින සිට 2026.09.25 දින දක්වා ආයතන 41ක් සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනයන්ට අදාළ තොරතුරු පහත පරිදිය.

1. මහජන බැංකුව

(මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දින - 2026 ජූලි 07 දින

පැමිණ සිටි:
ගරු (වෛද්‍ය.) නිශාන්ත සමරවීර මහතා (සභාපති), පා.ම.,
ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා,පා.ම.,
ගරු (නීතිඥ) නිලන්ති කොට්ටහච්චි මහත්මිය,පා.ම.,
ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය, පා.ම.,
ගරු සුදත් බලගල්ල මහතා, පා.ම.,
ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.,
ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම.,
ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම.,
ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම.,
ගරු දිනේෂ් හේමන්ත මහතා පා.ම.,

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

- **ස්ථාපිත කිරීම සහ ව්‍යාප්තිය:** 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ මහජන බැංකුව ස්ථාපිත කරන ලදී. බැංකුවේ දැක්ම වන්නේ පරිවර්තනීය වර්ධනයක් කරා ජාතිය දිරිමත් කිරීමයි.
  බැංකුව සතුව ශාඛා සහ සේවා මධ්‍යස්ථාන 745ක් ඇත (ඉන් 230ක් කිසිදු පෞද්ගලික බැංකුවක් නොමැති දුෂ්කර ප්‍රදේශවල වේ). ජනගහනයෙන්

10 දෙනෙකුගෙන් 7 දෙනෙකු ගනුදෙනු කරයි. මුළු වත්කම් ට්‍රිලියන 3.7කි; ඩිජිටල් පාරිභෝගිකයන් සංඛ්‍යාව මිලියන 4.7කි.

- **මූල්‍ය කාර්යසාධනය:** බදු පසු ලාභය 2020 දී රු. බිලියන 10.1 සිට 2023 දී බිලියන 40.2 දක්වා 4 ගුණයකින් වැඩි වී ඇත. තැන්පතු පදනම ට්‍රිලියන 3.2 දක්වා වර්ධනය වී ඇති අතර රජයේ ආයෝජන ප්‍රතිලාභය (ROI) 29%කි. අක්‍රිය ණය (NPL) 1.5%කි.
- **ඩිජිටල්කරණය:** මුළු ගනුදෙනු වලින් 84%ක් (මාසිකව මිලියන 19ක්) ඩිජිටල් මාධ්‍ය හරහා සිදුවේ. මෙයින් අතිරේක සේවකයන් 3,000ක පමණ අවශ්‍යතාවය මඟහරවා ගෙන ඇත.

2. <u>කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම</u>

- **ණය කළඹේ වෙනස:** මීට පෙර රජයට ලබා දී තිබූ ණය ප්‍රමාණය 56% සිට 18% දක්වා (රු. ට්‍රිලියනයක සිට බිලියන 350ට) අඩු කර, එම ප්‍රතිපාදන රටේ සංවර්ධනයට අත්‍යවශ්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ පුද්ගලික අංශය වෙත යොමු කර තිබුණි.
- **සංයුක්ත සැලසුම:** වත්මන් සැලැස්ම 2026-2028 දක්වා වසර 3කට සකසා ඇතත්, රජයේ ප්‍රතිපත්තිවලට අනුව 2026 ඔක්තෝබර් වන විට 2026-2030 වසර පහක දිගුකාලීන සැලැස්මක් සකසා ඉදිරිපත් කිරීමට ආයතනය එකඟ විය.
- **කාර්ය සාධන දර්ශක:** අධ්‍යක්ෂ මණ්ඩලයේ සිට ශාඛා මට්ටම දක්වා ගලා යන පරිදි කාර්ය සාධන දර්ශක (Cascading KPIs) සකසා, ජනවාරි මාසය වන විට සෑම නිලධාරියෙකුම දැනුවත් කර වගවීම තහවුරු කර තිබුණි.

- **විගණන හා මානව සම්පත්:** අභ්‍යන්තර විගණන අංශයට නව නිලධාරීන් 20 දෙනෙකු බඳවා ගැනීමට සහ ඩිජිටල් විගණන (Digital Auditing) ක්‍රම හඳුන්වා දීමට කටයුතු කරමින් තිබේ. සේවක සුබසාධනය අනෙකුත් රාජ්‍ය බැංකු මට්ටමේ පවතී.

3. <u>කාරක සභාවේ නිර්දේශ</u>

රාජ්‍ය ව්‍යාපාර නිසි ඉලක්ක සහගත මෙහෙයුම් ක්‍රියාවලියකට යොමු කිරීමේ වැදගත්කම කාරක සභාව අවධාරණය කළ අතර, සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී පාරිභෝගිකයා සහ බැංකු අතර පවතින දුරස්ථභාවය අවම කිරීමට පියවර ගන්නා ලෙස දන්වන ලදී.

2. ජාතික ආරක්ෂක විද්‍යායතනය
(ආරක්ෂක අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දින - 2026 ජූලි 07 දින

පැමිණ සිටි:
ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා (සභාපති),
පා.ම., ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා, පා.ම.,
ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය, පා.ම.,
ගරු සුදත් බලගල්ල මහතා, පා.ම.,
ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.,
ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම.,
ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම.,
ගරු දිනේෂ් හේමන්ත මහතා, පා.ම.

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

- **පිහිටුවීම සහ අරමුණ:** ජාතික ආරක්ෂක විද්‍යාතනය 2016 කැබිනට් අනුමැතිය මත 2021 නොවැම්බර් 11 දින ආරම්භ විය. ජාතික ආරක්ෂාව හා උපායමාර්ගික අධ්‍යයනය පිළිබඳ නායකයින් හා ප්‍රතිපත්ති සම්පාදකයින් (ත්‍රිවිධ හමුදා හා සිවිල් නිලධාරීන්) පුහුණු කිරීම ආයතනයේ ප්‍රමුඛ අරමුණ වේ.

- **පාඨමාලා ව්‍යුහය:** 'ජාතික ආරක්ෂාව සහ උපායමාර්ගික අධ්‍යයනය' ප්‍රධාන පාඨමාලාව අධ්‍යයන වාර 2කින් හා විෂය කොටස් 8කින් සමන්විත වේ. පශ්චාත් උපාධි පිරිනැමීමට කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (KDU) සමඟ අනුබද්ධිතය.

- **විදේශීය සහභාගීත්වය හා වාසි:** මිත්‍රශීලී රටවල නිලධාරීන් 18 දෙනෙකු පුහුණුව නිම කර ඇත. විදේශීය සිසුවෙකුගෙන් USD 50,000ක ගාස්තුවක් අය කෙරෙන අතර, මෙරට නිලධාරීන් විදේශගත කිරීම වැළකීමෙන් විශාල විදේශ විනිමයක් ඉතිරි වේ.

2. <u>කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම</u>

- **නීතිමය පදනම:** ආයතනය පාලනය වන්නේ කැබිනට් අනුමැතියක් මත පමණක් වන අතර ස්වාධීන පනතක් නොමැති බවත් මූල්‍ය ප්‍රතිපාදන ස්වාධීනව ලබා ගැනීමට සහ බෞද්ධාලෝක මාවතේ පවතින ආයතනය පවත්වාගෙන යන ගොඩනැගිලිවල අයිතිය නීත්‍යානුකූලව නිරාකරණය කරගැනීමට පාර්ලිමේන්තු පනතක අවශ්‍යතාවය පවතී.

- **මූල්‍ය හා විගණනය:** ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ මූල්‍ය ප්‍රතිපාදන ලැබේ. විගණන කටයුතු ද අමාත්‍යාංශ විගණන ක්‍රියාවලිය හරහා සිදු වේ.

- **සිවිල් සහභාගීත්වය:** පාඨමාලා සඳහා සිවිල් පරිපාලන නිලධාරීන්ගේ සහභාගීත්වය ඉතා අඩු මට්ටමක පවතින බැවින්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හරහා සිවිල් නිලධාරීන් දැනුවත් කර සහභාගීත්වය ඉහළ නැංවීමට කාරක සභාව විසින් අවධාරණය කෙරිණි.

3. <u>කාරක සභාවේ නිර්දේශ</u>

I. ආයතනයට ස්වාධීන නීතිමය පදනමක් ලබා දීම සඳහා විධිමත් පාර්ලිමේන්තු පනතක් කඩිනමින් සකස් කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

II. ආයතනයේ මූලික ගැටලුවලට විසඳුම් සහිත ඉදිරි වසර කිහිපය සඳහා වූ සංවර්ධන සැලැස්මක් සකස් කිරීම සහ ගත් පියවර පිළිබඳව මාසයක් ඇතුළත කාරක සභාව දැනුවත් කිරීම.

3. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

(වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දිනය - 2026 ජූලි 07 දින

පැමිණ සිටි:

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා (සභාපති), පා.ම.,
ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය, පා.ම.,
ගරු සුදත් බලගල්ල මහතා, පා.ම.,
ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා, පා.ම.,
ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම.,
ගරු දිනේෂ් හේමන්ත මහතා, පා.ම.

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

- **පදනම සහ අරමුණු:** ආයතනය 2003 අංක 09 දරන පනතින් ස්ථාපිත විය. ආයතනය විසින් සාධාරණ වෙළඳාමෙන් පාරිභෝගික සුරක්ෂිතතාව සහතික කිරීම සිදුකරයි. දිස්ත්‍රික් කාර්යාල 25ක් හරහා පැමිණිලි විභාග කිරීම සිදු කෙරේ.

- **ඉදිරි සැලසුම් (2026-2028):** දැනුවත් කිරීම් 500ක් (2028 දී 600 දක්වා), වෙළඳ දැනුවත් කිරීම් 300ක් හා වාර්ෂික වෙළඳපොළ අධ්‍යයන 16ක් ඉලක්ක කෙරේ. 27 වගන්තිය යටතේ ව්‍යාපාර ලියාපදිංචියට ඩිජිටල් පද්ධතියක් (DMIS) ස්ථාපිත කරමින් පවතී.

2. කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

- **ආහාර සුරක්ෂිතතාව හා නීතිමය බලතල:** පාසල් ළමුන් ඉලක්ක කරගත් අධික සීනි සහිත ආහාර ක්ෂුද්‍ර ජීවී පරීක්ෂණවලට ලක්කර සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට දැනුම් දී තිබුණි. ආහාර නිෂ්පාදනාගාර පරීක්ෂාවට පනත සංශෝධනය කළ යුතුව තිබුණි.

- **ආයතනික සම්බන්ධීකරණය:** සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා පොලිසිය සමඟ ඒකාබද්ධව කටයුතු කරන බව ආයතනය ප්‍රකාශ කළ අතර 2500කට අධික සංඛ්‍යාවක් සිටින සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් හා පළාත් පාලන ආයතන සතු බලතල භාවිත

කරමින් ක්ෂණික මෙහෙයුම් මැදිරියක් පිහිටුවීමට කාරක සභාව විසින් යෝජනා කරන ලදී.

- **මානව සම්පත්:** විමර්ශන නිලධාරී හිඟයට පිළියම් ලෙස අලුතින් නිලධාරීන් 210ක් බඳවා ගැනීමට අග්‍රාමාත්‍ය කාර්යාල අනුමැතිය ලැබී තිබුණි.

3. <u>ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම</u>

- **සැලසුම්කරණ සහ විගණන නිරීක්ෂණ:** 2026-2028 සංස්ථාපිත සැලසුම වසර 3කට සීමා වීම, අමාත්‍යාංශ ලේකම් විසින් අදාළ සැලසුම් අනුමත නොකිරීම, නියමිත දිනට ප්‍රථම භාණ්ඩාගාරයට අදාළ සැලසුම් ලබා නොදීම සහ සැලසුම්වල මූල්‍ය පුරෝකථන ඇතුළත් නොවීම බරපතළ අඩුපාඩු ලෙස ජාතික විගණන කාර්යාලය විසින් පෙන්වා දෙන ලදී.

4. <u>කාරක සභාවේ ප්‍රධාන නිර්දේශ</u>

විගණන දෙපාර්තමේන්තුව පෙන්වා දුන් දුර්වලතා නිවැරදි කරමින්, ඉදිරි මාස 2 ඇතුළත වඩාත් ප්‍රායෝගික හා විධිමත් නව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර කාරක සභාවට ඉදිරිපත් කිරීම.

4. මාර්ග සංවර්ධන අධිකාරිය

(*ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය*)

පරීක්ෂා කරන ලද දින - 2026 ජූලි 07 දින

පැමිණ සිටි:
ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා (සභාපති), පා.ම.,
ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය, පා.ම.,
ගරු සුදත් බලගල්ල මහතා, පා.ම.,
ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා, පා.ම.,
ගරු දිනේෂ් හේමන්ත මහතා, පා.ම.

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

- **උපායමාර්ගික සැලැස්ම හා වත්කම්:** 2026-2030 පස් අවුරුදු වාර්ෂිකව යාවත්කාලීන කරන සැලැස්ම (rolling plan) අනුව A/B මාර්ග කි.මී. 12,262.84ක්, අධිවේගී මාර්ග කි.මී. 312.6ක් හා පාලම් 4,430ක් ආයතනය විසින් පාලනය කෙරේ. උපායමාර්ගික අරමුණු 60ක් හා කාර්ය සාධක දර්ශක ඇතුළත් කර ඇත. සභාපති/අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ ජනරාල් යටතේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් 6 දෙනෙකු මඟින් පාලනය වේ.
- **දත්ත විශ්ලේෂණය හා මූල්‍ය කාර්යසාධනය:** මාර්ග වත්කම් කළමනාකරණ අංශය මඟින් විශේෂ යන්ත්‍රෝපකරණ භාවිතයෙන් මාර්ග/පාලම්වල තත්ත්වය පිළිබඳ දත්ත රැස්කර නඩත්තු අයවැය හා ප්‍රමුඛතා ලේඛන සකසයි. මාර්ග ආරක්ෂණය, **PESTEL** සහ **SWOT** විශ්ලේෂණ මඟින් ව්‍යාපෘති ප්‍රමුඛතාවය තීරණය කෙරේ.
- PESTEL හා SWOT විශ්ලේෂණ සිදු කෙරේ. 2026 වර්ෂය සඳහා රු. බිලියන 414.8ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර, අධිවේගී මාර්ග සඳහා රුපියල් බිලියන 123.95ක් හා විනාශ වූ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා රුපියල් බිලියන 69ක් මෙයට ඇතුළත් වේ.
- **ප්‍රසම්පාදන සැලැස්ම:** වියදම් දරන අංශ 28ක් ආවරණය වන පරිදි ඉදිකිරීම්, භාණ්ඩ, උපදේශන හා උපදේශන නොවන සේවා යන අංශ 4ම ඇතුළත්ව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇත.

2. <u>කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම</u>

- **නීතිමය රාමුව හා මාර්ග සංවර්ධනය:** 1981 අංක 73 පනත සංශෝධනය කර ඉඩම් අත්පත් කර ගැනීමේ බාධා ඉවත් කිරීමට ආයතනය විසින් පියවර ගැනේ. ජල නළ එලීම සඳහා මාර්ග නැවත නැවත කැඩීම වැළැක්වීමට නව මාර්ග සඳහා සේවා කොරිඩෝ (Service Corridors) හා ඒකාබද්ධ කොන්ත්‍රාත් (Integrated contracts) යන ක්‍රමවේද ආයතනය විසින් යොදා ගැනේ.
- **ඩිජිටල්කරණය හා විශේෂ ව්‍යාපෘති:** පරිගණකගත කාර්ය සාධක දර්ශක (KPI) පද්ධතියක්, ලේඛන කළමනාකරණ පද්ධතියක් හා 2026 දී අධිවේගී මාර්ග සඳහා ඉලෙක්ට්‍රොනික ගාස්තු අය කිරීමේ ක්‍රමවේදයක් (ETC) ආයතනය විසින් ස්ථාපිත කිරීමට කටයුතු කරනු ලබයි. මරීන් ඩ්‍රයිව් මාවත (Marine Drive) පානදුර දක්වා දීර්ඝ කිරීමට ශක්‍යතා අධ්‍යයනයක් ආයතනය විසින් සිදු කර ඇත.
- **සැලසුම් සම්බන්ධීකරණය:** කළුතර ව්‍යාපෘතියකදී කාණු පද්ධතියක් නොමැති වීමෙන් වූ හානි සලකා, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව මඟින් ජලය, විදුලිය හා ටෙලිකොම් ඒකාබද්ධ වූ සැලසුම් සකස් කිරීමට කාරක සභාව විසින් උපදෙස් දෙන ලදී.

3. <u>කාරක සභාවේ ප්‍රධාන නිර්දේශ</u>

I. මැදපෙරදිග අර්බුදකාරී තත්ත්වය හමුවේ වර්ෂ 2026 ඉතිරි කාලය හා 2027 වර්ෂය සඳහා අධිකාරියේ ඉදිරි සැලසුම් පිළිබඳ වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීම.

II. වත්මන් සංවර්ධන ඉලක්කවලට ගැලපෙන පරිදි 1981 අංක 73 දරන පනත සංශෝධනය කිරීමට පියවර ගැනීම.

5. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
(ආරක්ෂක අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දිනය -2026 ජූලි 09 දින

පැමිණ සිටි

ගරු එම්.කේ.එම්.අස්ලම් මහතා, පා.ම.,(අනුකාරක සභා සභාපති)
ගරු අර්කම් ඉල්යාස් මහතා, පා.ම.,

අනුකාරක සභා සභාපතිවරයාගේ අවසරය මත පැමිණ සිටි

ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.,
ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම.,

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනයේ නෛතික පදනම හා කාර්යභාරය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය 2005 අංක 13 දරන ව්‍යසන කළමනාකරණ පනත යටතේ පිහිටුවා ඇති ආයතනයක් වන අතර එහි කාර්යභාරය පහත පරිදි වේ.

- ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම හා ජාතික හදිසි ආපදා මෙහෙයුම් සැලැස්ම සකස් කිරීම සඳහා ජාතික සභාවට සහාය වීම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී එය යාවත්කාලීන කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.
- ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම හා ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ වගකීම භාරගැනීම සහ හදිසි ආපදා තත්ත්වයක් ප්‍රකාශයට පත්කිරීම මත ජාතික හදිසි ආපදා ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම (National emergency operation plan) මෙහෙයවීම හා සම්බන්ධීකරණ කටයුතු ඉටුකිරීම.
- අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු හෝ රාජ්‍ය සංස්ථා විසින් සකස් කරන ලද විවිධ ආපදා කළමනාකරණ සැලසුම් ජාතික ආපදා කළමනාකරණ සැලැස්මට අනුකූලව තිබීම සහතික කිරීම.
- 10 වැනි වගන්තිය යටතේ විවිධ අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය සංස්ථා විසින් සකස් කරන ලද ආපදා කළමනාකරණ සැලසුම් අනුව, ආපදා සඳහා පෙර සූදානම්, අවම කිරීම, වලක්වා ගැනීම, සහන සැලසීම, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ

ක්‍රියාකාරකම් යනාදී ක්ෂේත්‍ර යටතේ සැලසුම් සකස් කිරීම සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම එවැනි සැලසුම් සහ වැඩසහටන් ක්‍රියාත්මක කරන්නා වූ ආයතන සමග සම්බන්ධීකරණය ද, එකී ක්‍රියාකාරකම් සඳහා මහාභාණ්ඩාගාරයෙන් මූල්‍ය සහාය ලබාගැනීම, එම ප්‍රතිපාදන අදාළ ප්‍රදේශ වෙත නිදහස් කිරීම, අධීක්ෂණය හා ක්‍රියාකාරකම් ඇගයීම.

- මෙම ආයතනය සෙන්ඩායි රාමුව (Sendai Framework), තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සහ පැරිස් ගිවිසුම වැනි ජාත්‍යන්තර ප්‍රමිතීන් සමඟ අනුගතව ක්‍රියා කරයි.

2. **<u>මෙහෙයුම් අභියෝග සහ ගැටලු:</u>** සේවක හිඟය, යටිතල පහසුකම් ප්‍රමාණවත් පරිදි නොතිබීම , සුනාමි කුළුණු යලිපැන ගොස් තිබීම, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන ක්‍රියාත්මක නොවීම යනාදී ගැටලු රැසකට මෙම ආයතනය මුහුණ දෙමින් සිටී.

3 . <u>අනුකාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම</u>

3.1. **<u>පනතේ "ව්‍යසන" යන වචනය වෙනුවට "ආපදා" යනුවෙන් භාවිතා කිරීම</u>**: 2005 අංක 13 දරන ව්‍යසන කළමනාකරණ පනතේ ‘‘ව්‍යසන’’ යන යෙදුම භාවිතා කළ ද සාමාන්‍ය භාවිතයේ දී ‘‘ආපදා’’ යන යෙදුම භාවිතා කර තිබුණි.

"ව්‍යසන" යන්නෙන් අදහස් වන්නේ විශාල ජීවිත හා දේපළ හානියක් සිදුවූ අවස්ථාවක් වන බවත්,"ආපදා" යන්න භාවිත කිරීමෙන් කුඩා මට්ටමේ හානි බවත් ගංවතුරක් වැනි අවස්ථාවකදී පවා DMC ආයතනයට නෛතික අවකාශය ලැබෙන බව සඳහන් විය. ඉදිරියේදී සිදුකිරීමට අපේක්ෂිත පනත් සංශෝධනයේදී මේ පිළිබඳව අවධානය යොමු කිරීමට ද නිලධාරීන් එකඟ විය.

3.2. **<u>කාර්ය මණ්ඩලය සහ සම්පත් හිඟය පිළිබඳව හා ආයතනයේ දුර්වලතා:</u>** ආයතනයේ පුරප්පාඩු 188ක් පැවති බවත් "දිට්වා" (Ditwa) වැනි විශාල ආපදා සමඟ සසඳන විට DMC යනු ඉතා කුඩා සම්පත් ප්‍රමාණයක් ඇති ආයතනයක් වන බවත් දිස්ත්‍රික් මට්ටමින් ඒකක පවත්වාගෙන යනු ලැබුවද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් නිලධාරීන් නොමැති වීම විශාල අඩුපාඩුවක් වන බව සඳහන් විය. මේ සඳහා පිළියමක් ලෙස ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය (NDRSC) සමඟ DMC ඒකාබද්ධ කර එහි නිලධාරීන් ප්‍රාදේශීය මට්ටමින් යොදවා ගැනීමට ගරු ජනාධිපතිවරයා උපදෙස් දී ඇති බවද අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රකාශ කළේය.

3.3. **<u>අනුමත පුරප්පාඩු සඳහා බඳවා ගැනීම ප්‍රමාද වීමට හේතු</u> :** ලිපිකරු තනතුරු සඳහා අයදුම්පත් 3,200 ඉක්මවා ලැබී ඇති අතර දිනකට සම්මුඛ පරීක්ෂණ කළ හැක්කේ 50කට පමණක් බැවින් බඳවාගැනීම් ප්‍රමාද වන බව සඳහන් විය.

3.4. **<u>ජාතික ආපදා කළමනාකරණ සභාව:</u>** ජාතික ආපදා කළමනාකරණ සභාවට සියලුම සාමාජිකයන් පත් කර ඇති බවත් 2018 වසරෙන් පසුව රැස්වීම් කිසිවක් පවත්වා නොතිබූ මෙම සභාව, වත්මන් රජය යටතේ 2026 අගෝස්තු මාසයේ සිට අවස්ථා 4ක දී රැස් වී ඇති බවත් සඳහන් විය.

3.5. **<u>පාසල් ළමුන් දැනුවත් කිරීම සහ දත්ත කළමනාකරණය :</u>**වසරකට දැනුවත් කිරීමේ වැඩසටහන් 300 ඉක්මවා පවත්වනු ලබන අතර දිවයිනේ පාසල් 10,129ක් ආපදා වර්ග 6ක් යටතේ අවදානම් තක්සේරු කර ඇති බවත්, එම දත්ත අධ්‍යාපන අමාත්‍යාංශයට ලබා දී ඇති බවත් අනුකාරක සභාවට අනාවරණය විය.

3.6. **<u>සුනාමි කුළුණු නඩත්තුව</u>**: 2016 දී මිලියන 135ක් වියදම් කර ඉදිකළ සුනාමි කුළුණු 77ක තත්ත්වය පිළිබඳව අනුකාරක සභාවේ අවධානය යොමු විය.
එම කුළුණු බොහොමයක් මේ වන විට අක්‍රිය මට්ටමේ පවතින බවත් එයට හේතුව නඩත්තු කටයුතු සඳහා පසුගිය කාලයේ මූල්‍ය ප්‍රතිපාදන නොලැබීම බවත් 2026 වසර සඳහා එම කුළුණු නඩත්තු කිරීමට විශේෂ ව්‍යාපෘති යෝජනා කර ඇති බවත් අනුකාරක සභාවට අනාවරණය විය.

3.7. **<u>ආපදා ගම්මාන සහ නැවත පදිංචි කිරීම</u>**: ආපදා හේතුවෙන් විතැන්වූවන්ට ලබා දෙන විකල්ප ඉඩම්වල යටිතල පහසුකම් (පාරවල්, ජලය) නොමැති වීම හේතුවෙන් ඔවුන් නැවත අවදානම් කලාපවලට යොමුවීම සම්බන්ධයෙන් අනුකාරක සභාව විමසීය.

නැවත පදිංචි කිරීම සහ පහසුකම් සැලසීම ප්‍රාදේශීය ලේකම්වරුන් හරහා සිදුවන වෙනත් අමාත්‍යාංශ ව්‍යාපෘතියකි. නමුත් DMC සහ සහන සේවා මධ්‍යස්ථානය ඒකාබද්ධ වූ පසු මෙම ක්‍රියාවලිය වඩාත් හොඳින් සම්බන්ධීකරණය කළ හැකි බව නිලධාරීන් පැහැදිලි කළහ.

3.8 **<u>ඉදිරි සැලසුම්:</u>** 2021-2025 සැලැස්ම ක්‍රියාත්මක වන බවත් 2025-2029 සඳහා වන නව සැලැස්ම කෙටුම්පත් කර ඇති බවත් එය ඉදිරි මාසය ඇතුළත අවසන් කිරීමට අපේක්ෂිත බව ද නිලධාරීන් විසින් සඳහන් කරන ලදී.

4. අනුකාරක සභාවේ නිර්දේශ හා යෝජනා

1. **ආයතනික සැලැස්ම (Corporate Plan) යාවත්කාලීන කිරීම:** දැනට කෙටුම්පත් මට්ටමේ පවතින 2025-2029 ආයතනික සැලැස්ම, පවතින අඩුපාඩු සකස් කර **මසක් ඇතුළත** අවසන් කර අනුමත කරවා ගැනීම.

2. **ප්‍රාදේශීය මට්ටමේ ව්‍යුහය ශක්තිමත් කිරීම:** ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවය දැනට දිස්ත්‍රික් මට්ටමට පමණක් සීමා වී ඇති බැවින්, එය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටම (AGA Level) දක්වා ව්‍යාප්ත කිරීමට අවශ්‍ය කටයුතු සකස් කිරීම.

3. **පුරප්පාඩු පිරවීම සහ සේවක සුභසාධනය:** ආයතනයේ පවතින විශාල සේවක පුරප්පාඩු සංඛ්‍යාව (188ක්) පිරවීමට කටයුතු කරන ලෙස හා පැය 24 පුරා සේවය කරන නිලධාරීන් සඳහා නිසි නවාතැන් පහසුකම් සැපයීම හා බඳවා ගැනීම් වලදී සිදුවන ප්‍රමාදය වැළැක්වීම සඳහා තරඟ විභාගයක් පවත්වා කෙටි ලැයිස්තුගත කිරීමක් (short list) සිදු කිරීම.

4. **ආයතන ඒකාබද්ධ කිරීම:** ජනාධිපතිවරයාගේ උපදෙස් පරිදි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය (NDRSC) ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කර, එමගින් ප්‍රාදේශීය මට්ටමේ සිටින සහන සේවා නිලධාරීන්ගේ සහාය මෙහෙයුම් කටයුතු සඳහා ලබා ගැනීම.

5. **යටිතල පහසුකම් යාවත්කාලීන කිරීම:** යල් පැන ගොස් ඇති **සුනාමි කුළුණු** සහ ක්‍රියාවිරහිත වී ඇති සන්නිවේදන සැටලයිට් පද්ධති කඩිනමින් අලුත්වැඩියා කිරීමට අවශ්‍ය ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කර ප්‍රතිපාදන ලබා ගැනීම.

6. **ආපදා කළමනාකරණ පනතේ යෙදුම් වෙනස් කිරීම:** ඉදිරියේදී ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීමේදී, "ව්‍යසන" යන වචනය වෙනුවට **"ආපදා"** යන වචනය භාවිතා කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම.

7. **අධීක්ෂණය සහ සම්බන්ධීකරණය:** පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වන ආපදා කළමනාකරණ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ප්‍රජා පුහුණු වැඩසටහන් නිසි පරිදි සිදුවන්නේද යන්න පිළිබඳ අධීක්ෂණ යාන්ත්‍රණයක් **(Monitoring Mechanism)** සකස් කරන ලෙස අනුකාරක සභාවට යෝජනා කළාය.

8. <u>**තාක්ෂණික දත්ත භාවිතය:**</u> ආයතනය විසින් සකස් කර ඇති ආපදා අවදානම් දත්ත සහ සිතියම් (Hazard Maps) අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ හුවමාරු කර ගනිමින්, සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී එම දත්ත උපයෝගී කර ගැනීමට කටයුතු කිරීම.

6. BOC Travels (පුද්ගලික) සමාගම

(මූදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දිනය- 2026 ජූලි 09 දින

පැමිණ සිටි

ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා, පා.ම.,(සභාපති)
ගරු අර්කම් ඉල්යාස් මහතා, පා.ම.,

අනුකාරක සභා සභාපතිවරයාගේ අවසරය මත පැමිණ සිටි

ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.,
ගරු තිළිණ සමරකෝන් මහතා,පා.ම.,

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනික පසුබිම සහ ව්‍යුහය : BOC ට්‍රැවල්ස් යනු ලංකා බැංකුවට (Bank of Ceylon) 100%ක් හිමි අනුබද්ධිත ආයතනයකි. මෙය 1990 වර්ෂයේ දී ආරම්භ වූ අතර, 1995 දී රුපියල් මිලියන 2.5 ක මූලික ආයෝජනයකින් සීමිත පුද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි විය. මෙය වසර 32ක ඉතිහාසයක් ඇති ආයතනයකි.

2. සේවා සහ යටිතල පහසුකම් : ගුවන් ටිකට්පත් නිකුත් කිරීම, වීසා සේවා සහ සංචාරක රක්ෂණ වැනි සම්පූර්ණ සංචාරක විසඳුම් ලබා දෙයි. දඹදිව වන්දනා චාරිකා සම්බන්ධයෙන් වෙළඳපල ප්‍රමුඛයෙකු වන අතර, International Air Transport Association (IATA) බලපත්‍රය හිමි බැවින් සෘජුවම ටිකට්පත් නිකුත් කිරීමේ හැකියාව ඇත.

3. අනුකාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

3.1. 2025 වර්ෂයේ කාර්යසාධනය: ආයතනය 2025 වර්ෂයේ දී අපේක්ෂිත මට්ටමට වඩා ඉහළ කාර්යසාධනයක් ළඟා කරගෙන තිබුණි.

3.2. ආයතනයේ පාලක මණ්ඩලයේ ව්‍යුහය: සාංගමික ව්‍යවස්ථාවලිය අනුව පාලක මණ්ඩලයේ අවම වශයෙන් තිදෙනෙකු සහ උපරිම හය දෙනෙකු සිටිය යුතු අතර මේ වන විට සභාපතිවරයා ඇතුළු සාමාජිකයින් සිව් දෙනෙකු සිටී.

3.3 ආයතනයේ හඳුනාගත් දුර්වලතා හා ආයතනයට එල්ලවන ප්‍රධාන අභියෝග: සංචාරක විසඳුම් ලබාදීම සම්බන්ධ වෙළඳපලෙන් 50%-60%ක් පමණ පාලනය කරනු ලබන්නේ ප්‍රධාන පෞද්ගලික සංචාරක නියෝජිත

ආයතන කිහිපයකි. ගුවන් සමාගම් සමඟ ඇති සුවිශේෂී ගිවිසුම් හේතුවෙන් එම සමාගම්වලට අඩු මිලට ටිකට්පත් ලබා දීමට හැකියාව ඇත. 2020 වසරේදී රජය විසින් නිකුත් කළ චක්‍රලේඛයක් මගින් රාජ්‍ය ආයතනවලට පෞද්ගලික අංශයෙන් මිල ගණන් කැඳවීමට අවසර දීම හේතුවෙන් BOC ට්‍රැවල්ස් ආයතනයට තිබූ රජයේ ව්‍යාපාරික අවස්ථා අඩුවීම ප්‍රධාන තර්ජනයක් වී තිබුණි.

3.4. **<u>සේවක රඳවා ගැනීම සහ බඳවා ගැනීම</u>**: කොවිඩ් වසංගතයෙන් පසුව 2023-24 වසරවලදී පළපුරුදු සේවකයන් විශාල පිරිසක් ඩුබායි වැනි විදේශ රටවල රැකියා සඳහා පිටත්ව යාම මත දැඩි අර්බුදයකට මුහුණ දී ඇති අතර නව පාලක මණ්ඩලය විසින් සේවක වැටුප් සහ කොමිස් මුදල් වැඩි කිරීමට පියවර ගැනීම හේතුවෙන් සේවකයන් ඉවත් වීම පාලනය වී ඇති අතර ක්ෂේත්‍රය තුළ පළපුරුදු, ගුණාත්මක සේවකයන් සොයා ගැනීම පවතින දුෂ්කරතාවයක් වී ඇත.

3.5 **<u>ඩිජිටල්කරණය සහ අලෙවිකරණය</u>:** මීට පෙර ආයතනය ඩිජිටල් අලෙවිකරණය සම්බන්ධයෙන් දුර්වල මට්ටමක සිටි නමුත් මේ වනවිට ඒ සඳහා විශේෂ නිලධාරියෙකු බඳවාගෙන ඇත. BOC Travels සන්නාමය කොළඹ තුළ ප්‍රචලිත වුවද කොළඹින් පිටත ප්‍රචලිත කිරීමට නව ඩිජිටල් අලෙවිකරණ සැලසුම් ක්‍රියාත්මක කරමින් පවතී. විදේශ සංචාරවලට අදාළ ටිකට්පත් මිලදී ගැනීමේ කටයුතු සඳහා 2020 වසරේදී රජයේ චක්‍රලේඛයක් මඟින් රාජ්‍ය ආයතනවලට පෞද්ගලික අංශයෙන් මිල ගණන් කැඳවීමට අවසර දීම හේතුවෙන් මේ වන විට BOC Travels (පෞද්ගලික) සමාගම වෙත ලැබෙන ව්‍යාපාරික අවස්ථා අඩුවී ඇති අතර වෙළඳපල තුළ පවතින ඇතැම් සදාචාරාත්මක නොවන තරඟකාරී ක්‍රමවේද මගින් වන තර්ජන වලට ආයතනය මුහුණ දෙමින් සිටියි.

3.6 **<u>හිඟ මුදල් අයකර ගැනීම Outstanding Balances)</u>**: මීට පෙර හිඟ මුදල් අයකර ගැනීමට පමණක් වෙන්වූ නිලධාරියෙකු නොසිටි අතර මේ වනවිට මේ සඳහාම විශේෂිත නිලධාරියෙකු (Recovery Officer) බඳවාගෙන ඇත. ඇතැම් පැරණි හිඟ මුදල් සම්බන්ධයෙන් නීතිමය පියවර ගනිමින් පවතී.

4. <u>අනුකාරක සභාවේ නිර්දේශ හා යෝජනා</u>

1. වඩාත් ඉහළ ඉලක්ක කරා ළඟාවීම- ආයතනයේ දැක්ම වන්නේ 2028 වන විට ප්‍රමුඛතම සංචාරක සේවා සපයන්නන් 10 දෙනා අතරට පැමිණීම වුවද,

ඊටත් වඩා ඉහළ ඉලක්කයක් සහිතව එහි පළමු ස්ථානය (Number 1) ලබා ගැනීමට උත්සාහ කළ යුතු බව අනුකාරක සභාව යෝජනා කළාය.

2. සන්නාමකරණය සහ ප්‍රචාරණය ශක්තිමත් කිරීම- ලංකා බැංකුව සතු දිවයින පුරා විහිදුණු ශාඛා ජාලය වඩාත් ඵලදායී ලෙස භාවිතා කරමින් අලෙවිකරණ සහ සන්නාමකරණ කටයුතු පුළුල් කිරීම.

3. මිලට වඩා සේවා ගුණාත්මකභාවය අවධාරණය කිරීම- විදේශ සංචාරවලට අදාළව පෞද්ගලික අංශයේ නියෝජිතයන් ලබා දෙන අඩුම මිල (Lowest price) මත පමණක් තීරණ නොගෙන, ලබාදෙන සේවයේ ගුණාත්මකභාවය හා ආරක්ෂාව පිළිබඳව අවධානය යොමු කළ කිරීම හා BOC ට්‍රැවල්ස් ආයතනය විසින් ලබාදෙන විශ්වාසනීය සේවය හා, දින 7ම පැය 24 පුරාවට ලබාදෙන සුවිශේෂී සහයෝගය පිළිබඳව රජයේ ආයතන දැනුවත් කිරීම.

4. ජාතික ආර්ථික ප්‍රමුඛතාවයන් සමඟ සම්බන්ධ වීම- ආයතනික සැලසුම් සැකසීමේදී විදේශ විනිමය ඉපැයීම සහ අපනයන දිරිගැන්වීම වැනි රජයේ නව ආර්ථික උපාය මාර්ග සමඟ සමපාතව කටයුතු කිරීම.

5. ආයතනයේ කටයුතු සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා ගැනීම - ආයතනයේ ඉදිරි ගමනට පවතින බාධා ඉවත් කර ගැනීමට සහ සේවාවන් තවදුරටත් දියුණු කිරීමට රජය මගින් ලබාගත හැකි උපරිම සහයෝගය ලබා ගැනීම.

5. <u>වෙනත් කරුණු</u>

2020 වසරේ නිකුත් වූ චක්‍රලේඛයක් මගින් රාජ්‍ය ආයතනවලට පෞද්ගලික අංශයෙන් සංචාරක සේවා ලබා ගැනීමට අවසර දී තිබුණද, රජයේ මුදල් රජය සතු ආයතන තුළම රඳවා ගැනීම සඳහා BOC Travels සහ ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් වැනි රාජ්‍ය අනුබද්ධිත ආයතනවලට ප්‍රමුඛතාවය ලබා දීමට අවශ්‍ය පියවර ගැනීමට කාරක සභාවේ සහාය ලබා දෙන මෙන් ආයතනය විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

7.රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
(මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දිනය: 2026 ජූලි 10 දින

පැමිණ සිටි:
ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා, පා.ම. (අනුකාරක සභා සභාපති),
ගරු සුජීව දිසානායක මහතා, පා.ම.,

අනුකාරක සභා සභාපතිවරයාගේ අවසරය මත පැමිණ සිටි
ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.,
ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම.,
ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම.

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

- **පසුබිම හා මූල්‍ය බලප්‍රදේශ:** 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතින් පිහිටුවන ලද, 100%ක රාජ්‍ය හිමිකාරිත්වය සහිත මෙම බැංකුව 1998 දී විශේෂිත බැංකුවක් ලෙස පරිවර්තනය වී ඇති අතර, බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශයේ වත්කම්වලින් 2.39%ක් සහ ශාඛා 25කින් හා සේවකයින් 331 දෙනෙකුගෙන් සමන්විත වේ. නිවාස, කෘෂිකර්ම සහ කර්මාන්ත අංශ සඳහා මූල්‍ය ආධාර ලබා දෙමින් ජාතික ආර්ථිකයට දායක වේ.
- **සංයුක්ත සැලැස්ම හා ඩිජිටල්කරණය:** 2026-2030 පස් අවුරුදු උපායමාර්ගික සැලැස්ම යටතේ බැංකුව ක්‍රියාත්මක වන අතර, ATM ව්‍යාප්තියේ 30%ක ප්‍රගතියක් අත්පත් කර ගනිමින් ඩිජිටල් බැංකුකරණ නාලිකා සහ මූලික බැංකු පද්ධතිය (Core Banking System) පුළුල් කිරීමට පියවර ගෙන ඇත.
- **මූල්‍ය කාර්යසාධනය හා ප්‍රසම්පාදනය:** 2025 වසරේදී රුපියල් මිලියන 362ක බදු පසු ලාභයක් ලබා ඇති බැංකුව, 2026 සඳහා රුපියල් මිලියන 467ක ශුද්ධ ලාභයක් අපේක්ෂා කරයි. රුපියල් මිලියන 636.79ක ප්‍රසම්පාදන අයවැයෙන් 2026 මැයි මාසය වන විට රුපියල් මිලියන 200.20ක් (31.43%) උපයෝගී කරගෙන ඇත.

2. කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

- **ණය කළඹේ අසමතුලිතතාවය සහ අභියෝග:** බැංකුවේ සමස්ත ණය නිකුත් කිරීම්වලින් 90%ක්ම නිවාස ණය සඳහා පමණක් යොමු වී ඇති අතර, කෘෂිකර්ම හා කර්මාන්ත අංශ සඳහා ඇත්තේ 10%කි. ශ්‍රී ලංකා මහ

බැංකුවේ රුපියල් බිලියන 7.5ක අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරා ගැනීමට මහජන බැංකුවේ පූර්ණ අනුශාඛාවක් ලෙස පවත්වාගෙන යාමට කැබිනට් අනුමැතිය අපේක්ෂා කරන බව ආයතනය පැවසීය.

- **ආයෝජන සහ බැංකු පනතේ සීමාවන්:** බැංකු පනතට අනුව බැංකුවට ආයෝජනය කිරීමට අවසර ඇත්තේ නිවාස, කෘෂිකර්ම සහ කර්මාන්ත යන නිශ්චිත අංශවලට අදාළ ආයතනවල පමණක් බවත්, වත්මන් ආයෝජන ප්‍රධාන වශයෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ ද්‍රවශීලතා අවශ්‍යතා (Liquidity requirements) සපුරාලීම සඳහා පමණක් පවත්වාගෙන යන බවත් ආයතනය පැවසීය.
- **අක්‍රිය ණය (NPL) කළමනාකරණය:** පාරිභෝගිකයන්ට සහනදායී ක්‍රම මඟින් සහන සැලසීම හේතුවෙන් NPL අනුපාතය තරමක් ඉහළ මට්ටමක පැවතියද, එය 2026 අවසාන වන විට 14%කට වඩා අඩු මට්ටමකට (සහ ඉදිරියේදී තනි අංකයකට) ගෙන ඒමට කටයුතු කරන බව ආයතනය පැවසීය.

3. <u>අනුකාරක සභාවේ ප්‍රධාන නිර්දේශ</u>

- බැංකුවේ වත්මන් ණය කළඹෙන් 90%ක්ම නිවාස ණය සඳහා වෙන් වී ඇති බැවින්, සාන්ද්‍රණ අවදානම අවම කර ගැනීම සඳහා 2030 වසර වන විට කෘෂිකර්ම හා කර්මාන්ත අංශ සඳහා වැඩි බරක් ලබා දෙමින් වඩාත් සමබර ණය කළඹක් කරා ගමන් කිරීමට ඉලක්ක සකස් කිරීම.
- බැංකුවේ ඉදිරි සංයුක්ත සැලසුම් අදාළ අමාත්‍යාංශ තුනේ (නිවාස, කෘෂිකර්ම සහ කර්මාන්ත) ජාතික ප්‍රතිපත්ති හා වැඩපිළිවෙළ සමඟ සෘජුවම බද්ධ කර, රජයේ සංවර්ධන අරමුණු ඉටු කරන මෙවලමක් ලෙස බැංකුව ක්‍රියාත්මක වීම.
- අක්‍රිය ණය (NPL) ඉහළ යාමට පාරිභෝගිකයාගේ ණය ගෙවීමේ ධාරිතාව පමණක් නොව බැංකු පද්ධතියේ පවතින ආයතනික හා පද්ධතිමය දුර්වලතා බලපාන ආකාරය පිළිබඳව ගැඹුරු විශ්ලේෂණයක් සිදු කිරීම.
- මූල්‍ය ප්‍රගතියට පමණක් සීමා නොවී සමස්ත ආයතනික වර්ධනය මැනිය හැකි පරිදි කාර්ය සාධන දර්ශක (KPIs) සකස් කර, ඒවා සියලුම සේවක මට්ටම් වෙත ගලා යන පරිදි (Cascading KPIs) ක්‍රියාත්මක කිරීම.
- රාජ්‍ය බැංකුවක් ලෙස බැංකුවේ සැලසුම් සහ ඉලක්ක මහජනතාවට පහසුවෙන් තේරුම් ගත හැකි පරිදි විනිවිදභාවයකින් යුතුව ඉදිරිපත් කිරීම සහ මහජන අදහස්වලට යම් ඉඩකඩක් ලබාදීමට කටයුතු කිරීම.

8.සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
(මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දිනය: 2026 ජූලි 10 දින

පැමිණ සිටි:
ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා, පා.ම. (අනුකාරක සභා සභාපති),
ගරු සුජීව දිසානායක මහතා, පා.ම.,

අනුකාරක සභා සභාපතිවරයාගේ අවසරය මත පැමිණ සිටි
ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.,
ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම.,
ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම.

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

- **පසුබිම හා මානව සම්පත්:** 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් පනතින් පිහිටුවන ලද මෙම මණ්ඩලය, සාමාජිකයින් මිලියන 2.6ක පදනමකින් සමන්විත වන අතර, අනුමත සේවක සංඛ්‍යාව 1106ක් වුවද දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 824කි (74.5%). පුළුල් මූල්‍ය සාමාජික ප්‍රතිලාභ සහ විශිෂ්ට සේවාවක් සැපයීම අරමුණු කරයි.
- **සංයුක්ත සැලැස්ම හා ඩිජිටල්කරණය:** 2026-2030 සංයුක්ත සැලැස්ම යටතේ සාමාජික පදනම 15%කින් වැඩි කිරීම, අරමුදල් ආරක්ෂාව සහ සයිබර් ආරක්ෂණය තහවුරු කිරීමට අපේක්ෂා කරයි. විද්‍යුත් ගෙවීම් ක්‍රම සහ මූලික පද්ධති (Core System) සංවර්ධනයට මූලිකත්වය දී ඇත.
- **මූල්‍ය කාර්යසාධනය හා ප්‍රසම්පාදනය:** 2025 වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගෙන් "පිරිසිදු විගණන මතයක්" ලබා ඇති අතර, රාජ්‍ය ව්‍යවසාය අතර දෙවන ඉහළම ලාභදායී ආයතනය වේ. 2026 වසර සඳහා රුපියල් බිලියන 79.8ක බදු පෙර ආදායමක් සහ බදු පසු ලාභය රුපියල් බිලියන 65.1ක් අපේක්ෂා කරයි. රුපියල් මිලියන 1,563.94ක ප්‍රසම්පාදන අයවැයෙන් වැඩි කොටසක් තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සඳහා වෙන් කර ඇත.

2. කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

- **සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී තනතුරු**: ආයතනය සංස්ථාපිත පනත අනුව සභාපතිවරයාම ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කළද, යහපාලන ප්‍රතිපත්තිවලට අනුකූලව එම තනතුරු දෙක වෙන් කිරීම

සඳහා අවශ්‍ය පනත් සංශෝධන කෙටුම්පත් මුදල් අමාත්‍යාංශය වෙත යවා ඇති බව ආයතනය පැවසීය.

- **තොරතුරු තාක්ෂණ පද්ධති ප්‍රමාදය:** 2018 දී ආරම්භ කළ නව තොරතුරු තාක්ෂණ පද්ධතිය කොවිඩ් වසංගතය, ආර්ථික අර්බුදය සහ ICTA ආයතනය සමඟ ඇති වූ නොගැලපීම් හේතුවෙන් ප්‍රමාද වූ නමුත්, වර්තමානයේ මණ්ඩලය සෘජුව වගකීම භාරගෙන මොරටුව විශ්වවිද්‍යාලයේ උපදේශකත්වය යටතේ එය නිම කරමින් පවතින බව ආයතනය පැවසීය.
- **සාමාජික පදනම සහ අවිධිමත් අංශය පුළුල් කිරීම:** අරමුදලේ වසර 45ක ඉතිහාසය තුළ ක්‍රියාකාරී සාමාජිකත්වය මිලියන 2.6ක සීමිත මට්ටමක පැවතීම සහ ඉදිරි 15%ක වර්ධන ඉලක්කය ප්‍රධාන වශයෙන් විධිමත් අංශය ඉලක්ක කරගත් එකක් වීම. අවිධිමත් අංශයේ පිරිස් එක් කර ගැනීම සඳහා "ස්වයං රැකියා හා විදේශ රැකියා නියුක්තිකයින්ගේ ඒකකය" ශක්තිමත් කිරීමටත්, ප්‍රවාහන අංශය සම්බන්ධයෙන් ජාතික ගමනාගමන කොමිෂන් සභාව සමඟ සාකච්ඡා ආරම්භ කර ඇති බවත් ආයතනය පැවසීය.

3. <u>අනුකාරක සභාවේ නිර්දේශ</u>

- සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී යන තනතුරු දෙකම එක් පුද්ගලයෙකු විසින් දැරීම යහපාලන ප්‍රතිපත්තිවලට අනුකූල නොවන බැවින්, ඒ සඳහා ගෙන ඇති පියවර සහ එය අවසන් කරන නිශ්චිත කාලරාමුව සංයුක්ත සැලැස්මෙහි ඇතුළත් කිරීම.
- නව තොරතුරු තාක්ෂණ පද්ධතිය වැනි මෙතෙක් ප්‍රමාද වී ඇති ව්‍යාපෘති නිවැරදි ඇගයීමක් සහිතව කඩිනමින් අවසන් කිරීමට පියවර ගැනීම.
- 2027 සිට 2031 දක්වා කාලය සඳහා වන මීළඟ සංයුක්ත සැලැස්ම නිශ්චිත දින වකවානු (Timelines) සහිතව කඩිනමින් සකස් කර ඉදිරිපත් කිරීම.

9. <u>ලෝහෝර් ආර්යා ණය අරමුදල</u>

<u>(මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය)</u>

පරීක්ෂා කරන ලද දිනය - 2026 ජූලි 21 දින

පැමිණ සිටි:
ගරු(නීතිඥ)නිලන්ති කොට්ටහච්චි මහත්මිය(අනුකාරක සභා සභාපති), පා.ම.,
ගරු සුදත් බලගල්ල මහතා, පා.ම.

<u>සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු</u>

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

- **ඓතිහාසික පසුබිම හා නීතිමය පදනම:** 1927 දී ලෝහෝර් ආර්යාගේ පවුම් 300 ක පරිත්‍යාගයෙන් ඇරඹී, 1951 අංක 38 දරන පනතින් ව්‍යවස්ථාපිත ආයතනයක් විය. 1961 සිට කොම්පඤ්ඤවීදියේ වර්ග අඩි 27,000ක තෙමහල් ගොඩනැගිල්ලක පිහිටා ඇත.
- **මූල්‍ය පරිණාමය හා ලාභදායිත්වය:** වර්ෂ 1995දී ආයතනය භාණ්ඩාගාරයෙන් ලබා ගත් රු. මිලියන 15ක ණය මුදල මේ වන විට පියවා ඇති බවත්, ණය පොලී, ආයෝජන පොලී හා ගොඩනැගිලි කුලී (වර්ග අඩි 21,500ක් කුලියට දී ඇත) ආයතනයේ ප්‍රධාන ආදායම් වන බවත්, 2024 බදු පසු ලාභය රු. මිලියන 82ක් (ආදායමෙන් 1/3ක් වැටුප්වලටද, 1/3ක් බදුවලටද වැය වේ) බවත් ආයතනය පැවසීය.
- **ණය යෝජනා ක්‍රමයේ ලක්ෂණ:** පරිපාලන/රක්ෂණ/සාමාජික ගාස්තු, දේපල බැඳුම්කර හෝ පූර්ව ණය පියවීම් දඩ ආදිය ආයතනය ලබා දෙන ණය සඳහා අදාළ නොවේ . රජයේ ස්ථීර සේවකයන් දෙදෙනෙකුගේ ඇප මත ලබා දෙන ණය අනුමත කිරීම දින 3 දක්වා අවම කිරීමට ඉලක්ක කර ඇති බව ආයතනය පැවසීය.
- **අභියෝග හා උපායමාර්ග (2025-2029):** වසර 99ක් පැරණි ආයතනය පිහිටි ගොඩනැගිල්ල නවීකරණය කිරීමට රු. මිලියන 100-150ක් අවශ්‍ය වීමත්, ආයතනයේ මාණ්ඩලික නිලධාරීන් 7දෙනාගෙන් කිහිපදෙනෙකු විශ්‍රාම යාමට නියමිත වීමත් ආයතනය මුහුණ දෙන අභියෝග අතර වේ. ඉදිරි වසර 5 තුළ ණය කළඹ රු. මිලියන 700 දක්වා වර්ධනය කිරීමට හා ණය අයදුම්පත් ඩිජිටල්කරණයට ආයතනය සැලසුම් කොට සැලසුම් කර ඇත.

2. කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

- **දැනුවත්භාවය, සේවාව හා මූල්‍ය තත්ත්වය:** වසරකට ණය ලබා දිය හැක්කේ රු. මිලියන 650ක් (3,600 දෙනෙකුට) පමණක් වන බැවින් මූල්‍ය සීමා හා ණය ලබා දීමේ යෝජනා ක්‍රම පිළිබඳ රාජ්‍ය සේවකයන් අතර නොදැනුවත්භාවය පවතින බවත් කාරක සභාව පැවසීය. දිස්ත්‍රික්

සම්බන්ධීකරණ කමිටු හරහා මේ සම්බන්ධව දැනුවත් කිරීමට ආයතනය එකඟ විය. සමස්ත අරමුදල රු. මිලියන 800ක් වන අතර අක්‍රිය ණය 1.7%ක් (ගිණුම් 31ක්) වැනි ඉතා අවම මට්ටමක පවතින බව ආයතනය පැවසීය.

- **දේපල බැඳුම්කර නිදහස් කිරීම:** වසර 40කට පෙර ලබාගත් ණය සඳහා වූ බැඳුම්කර අරමුදලෙන් නිදහස් කළද, ණයලාභීන් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර නොමැති වීමෙන් පසු පරම්පරාවලට නෛතික ගැටලු පැනනගින බව කාරක සභාව පෙන්වා දෙන ලදී.
- **උපායමාර්ගික සැලසුම්කරණය:** 2025-2029 සැලසුම වසරින් වසර යාවත්කාලීන වන Rolling plan ක්‍රමවේදයට සකස් කිරීමටත්, අභ්‍යන්තර විගණන අංශය වඩාත් සක්‍රීය කිරීමටත් ආයතනයේ නිලධාරීන් එකඟතාව පළ කළහ.

3. ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

- **විගණකාධිපති විෂය පථය:** අරමුදල පෞද්ගලික පරිත්‍යාගයකින් ඇරඹුණු බැවින් වත්මන් නීති රාමුව යටතේ විගණකාධිපතිගේ විෂය පථයට ඇතුළත් නොවේ. කෙසේ වෙතත්, භාණ්ඩාගාර නියෝජිතයෙකුගේ සභාපතිත්වයෙන් යුත් විගණන කළමනාකරණ කමිටුවක් හා අභ්‍යන්තර විගණන ක්‍රියාවලියක් පවතින බව ආයතනය පැවසීය.

4. <u>කාරක සභාවේ නිර්දේශ</u>

I. 1951 අංක 38 දරන පනත 1953න් පසු සංශෝධනය වී නොමැති බැවින්: (1) කළමනාකරණ භාරකාර තනතුර ස්ථිර රාජ්‍ය සේවා තනතුරක් කිරීම, (2) පාලන මණ්ඩලයට නිත්‍ය නීතිඥයෙකු ඇතුළත් කිරීම, (3) විගණකාධිපති විෂය පථයට ආයතනය ඇතුළත් කිරීම, සහ (4) ප්‍රධාන ගණන්දීමේ නිලධාරී කවුරුන්ද නිශ්චිතව ඇතුළත් සංශෝධිත පනත් කෙටුම්පතක් අමාත්‍ය මණ්ඩලයට යොමු කිරීම.

II. රාජ්‍ය සේවකයන් අතර ණය අරමුදල පිළිබඳ පවතින නොදැනුවත්භාවය මඟහැරීමට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හරහා විධිමත් දැනුවත් කිරීම් සිදු කිරීම.

10. ලංකා විදුලි (පුද්ගලික) සමාගම
(බලශක්ති අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දිනය- 2026 ජූලි 21 දින

පැමිණ සිටි
ගරු රුවන් මාපලගම මහතා, පා.ම.,(අනුකාරක සභා සභාපති)
ගරු (වෛද්‍ය) එස් .ශ්‍රී බවානන්දරාජා මහතා, පා.ම.,

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනික ව්‍යුහය සහ පාරිභෝගික සේවාව

- ලංකා විදුලි පුද්ගලික සමාගම (LECO) රජයට අයිති කොටස් හිමි සමාගමක් වන අතර එහි ප්‍රධාන කොටස්කරුවන් වන්නේ ලංකා විදුලිබල මණ්ඩලය (වර්තමානයේ EDL) සහ මහා භාණ්ඩාගාරයයි.
- ලංකා විදුලිබල මණ්ඩලයට 54% ක කොටස් හිමිවන අතර මහා භාණ්ඩාගාරය සතුව 43% ක කොටස් හිමිකමක් ඇත.
- සමාගම පාරිභෝගිකයන් **643,000කට පමණ** සේවය සපයන අතර, ශාඛා 7ක් සහ පාරිභෝගික සේවා මධ්‍යස්ථාන 23ක් හරහා ක්‍රියාත්මක වේ.

2. අනුකාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

2.1. අභ්‍යන්තර විගණනය සහ පාලනය **:** 2026 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පෙර විගණන හා කළමනාකරණ කමිටුව වෙත යොමුකර නිර්දේශ ලබා ගෙන තිබුණි. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන මාර්ගෝපදේශ අනුව අවදානම් තක්සේරු කර තිබුණි.

ඒ අනුව**,** පසුගිය වසරවල හඳුනාගත් විශේෂ දුර්වලතා හෝ අඩුපාඩු හා විගණන වාර්තාවලින් පෙන්වා දෙන අඩුපාඩුවලට අදාළව පිළිතුරු ලබා දීම සහ අවශ්‍ය අවස්ථාවලදී ප්‍රතිපත්තිමය තීරණ හෝ විනය ක්‍රියාමාර්ග ගැනීම හරහා එම ප්‍රශ්න විසඳා ගන්නා බව සඳහන් විය.

2.2. ව්‍යාපෘති ප්‍රගතිය සහ මූල්‍ය**:** 2026 වර්ෂයේ ජූනි මාසය වන විට ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය 25%ක් වැනි මට්ටමක පැවතුනි. සාමාන්‍යයෙන් වසර අවසානයට ළඟා වන විට ඉලක්ක සපුරා ගන්නා නමුත්, ජූනි මාසය වන විට 30%-35%ක පමණ ප්‍රගතියකට ළඟාවීම

ප්‍රශස්ත මට්ටමක් බව සාමාන්‍යාධිකාරීවරයා සඳහන් කළේය. සමහර ව්‍යාපෘති අනිවාර්ය ලෙසම අවසන් වීමට නියමිතව ඇත්තේ වසර අවසානයේදී වන බැවින් මෙම තත්ත්වය මතු වී ඇති බව ඔහු තවදුරටත් ප්‍රකාශ කළේය.

වාර්ෂික අයවැය සැලැස්මෙහි සඳහන් "අනෙකුත් ප්‍රාග්ධන වියදම්" (Other Capex) යටතට අයත් වන්නේ ජාලයට (Network) සම්බන්ධ නොවන ගොඩනැගිලි, වාහන සහ පරිගණක පද්ධති (ERPවැනි) වැනි දෑ බව සාමාන්‍යාධිකාරීවරයා ප්‍රකාශ කළේය.

2.3. **<u>මානව සම්පත් සහ සේවක කාර්යක්ෂමතාව</u>:** 2021 සිට 2023 දක්වා සේවක සංඛ්‍යාව 1,525 සිට 1,249 දක්වා අඩු කරන ලද්දේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහාදැයි අනුකාරක සභාව විමසීය.

මෙහිදී තාක්ෂණික නොවන (non-technical) කාර්ය මණ්ඩලය පමණක් අඩුකර ඇති අතර ඒ සඳහා වැඩ අධ්‍යයනයක් (Work Study) සිදුකර වැඩ බෙදා හැරීම මගින් සිදු කළ බවත් 2019 සිට නව බඳවා ගැනීම් නතර කර ඇති බවත් ඉදිරියේදී කාර්යමණ්ඩලය 1000කට සීමා කිරීමට අපේක්ෂා කරන බවත් දැනට එක් සේවකයෙකු පාරිභෝගිකයන් 490කට සේවය සපයන අතර එය තවදුරටත් කාර්යක්ෂම කිරීමට සැලසුම් කර ඇති බවත් සඳහන් විය.

සේවක සංඛ්‍යාව අඩු කිරීමෙන් ලැබෙන මූල්‍ය වාසිය පාරිභෝගිකයාට ලැබෙන්නේදැයි කාරක සභාව විමසූ අතර වියදම් අඩු වන විට එය මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ ගාස්තු ක්‍රමවේදය (Tariff Methodology) හරහා ස්වයංක්‍රීයව පාරිභෝගිකයාට වාසියක් ලෙස ගලා යන බව සඳහන් විය.

2.4 **<u>නිර්කාබනීකරණය:</u>** ලංකා විදුලි පුද්ගලික සමාගම මගින් පිටකරන කාබන් ප්‍රමාණය ගණනය කර තිබේදැයි කාරක සභාව විමසූ අතර සමාගම සෘජුවම කාබන් විමෝචනය කරන ආයතනයක් නොවන නමුත්, බෙදා හරින විදුලිය නිර්කාබනීකරණය (Decarbonization) කිරීමට සූර්ය බලශක්තිය වැනි ක්‍රම ප්‍රවර්ධනය කරන බව සාමාන්‍යාධිකාරීවරයා කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය.

2.5 **<u>බලශක්ති උත්පාදනය</u>**: සමාගම විසින් සෘජුවම බලශක්ති උත්පාදනය (Generation) කිරීමට (උදා- සුළං බලය, සූර්ය බලය) කටයුතු කර තිබේදැයි අනුකාරක සභාව විමසූ අතර ආයතනයට ඇති බලපත්‍ර කොන්දේසි අනුව බෙදා හැරීම (Distribution) පමණක් කළ හැකි බැවින්, පාරිභෝගිකයන්ගේ සූර්ය බලශක්ති පද්ධති ජාලයට සම්බන්ධ කිරීමට පහසුකම් සපයන බව ප්‍රකාශ විය.

2023 වර්ෂයේ උපායමාර්ගික සැලැස්මෙහි අඩංගු කර තිබූ සුළං හා සූර්ය බලශක්ති ව්‍යාපෘතිය සම්බන්ධ සැලැස්ම ක්‍රියාත්මක නොවූ බවත් ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමේදී (restructuring) සැලසුම වෙනස් වූ බවත් ප්‍රකාශ විය.

2.6 <u>සංයුක්ත සැලැස්ම</u>: ස්ථාවර වසර 5ක සැලසුමක් වෙනුවට සෑම වසරකම යාවත්කාලීන වන (Rolling Plan) ක්‍රමයක් අනුගමනය කිරීමේ යෝග්‍යතාවය පිළිබඳව අනුකාරක සභාව විමසූ අතර ඉංජිනේරු ව්‍යාපෘති සඳහා දීර්ඝ කාලයක් ගතවන බැවින් ස්ථාවර සැලසුමක් තිබීම වැදගත් බව සාමාන්‍යාධිකාරීවරයා හා ආයතනයේ සභාපතිවරයා ද එම කරුණු සනාථ කරමින් කරුණු පැහැදිලි කළහ.
කෙසේ වෙතත්, නව තාක්ෂණයන් ඇතුළත් කිරීමට සැලසුම් නම්‍යශීලී විය යුතු බව අනුකාරක සභාව විසින් පෙන්වා දෙන ලදී.

2.7 <u>ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI)</u>

සේවක කාර්යසාධනය මැනීමට උපයෝගිකර ගන්නා ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) ස්ථාපිත කිරීමේ ක්‍රමවේදය සාමාන්‍යාධිකාරීවරයා පැහැදිලි කළේය.

3. <u>අනුකාරක සභාවේ නිර්දේශය</u>

- කාබන් විමෝචන ප්‍රමිතීන් සංසන්දනය කිරීම (Carbon benchmarking) සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම.

11. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
(කෘෂිකර්ම, පශු සම්පත් හා ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය)

පරීක්ෂා කළ දිනය- 2026 ජූලි 21 දින

පැමිණ සිටි
ගරු රුවන් මාපලගම මහතා, පා.ම.,(අනුකාරක සභාවේ සභාපති)
ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා, පා.ම.,

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනික පසුබිම, නීතිමය රාමුව හා කාර්යභාරය

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ කෘෂි අවදානම් කළමනාකරණය සඳහා ශ්‍රී ලංකා රජය මත පැවරෙන වගකීම ඉටු කිරීම සඳහා, ගොවීන් වෙත කෘෂිකාර්මික රක්ෂණ, සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සහ ඊට අදාළ සේවාවන් සපයනු ලබන එකම රාජ්‍ය ආයතනය කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වේ.

මණ්ඩලයේ නීතිමය රාමුව පහත පරිදි වේ.

- 1973 අංක 27 දරන පනත මගින් කෘෂි රක්ෂණ මණ්ඩලය නමින් ස්ථාපිත කර ඇත.
- 1999 අංක 20 දරන පනත මගින් උක්ත පනත අහෝසි කර පෙර ස්ථාපිත කරන ලද කෘෂි රක්ෂණ මණ්ඩලය, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය නමින් නැවත ස්ථාපිත කර ඇත.
- 1987 අංක 12 දරන පනත මගින් ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය ස්ථාපිත කර ඇති අතර 1990 අංක 23 දරන පනත මගින් ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය ස්ථාපිත කර ඇත.

2. 1999 අංක 20 දරන පනත ප්‍රකාරව පැවරී ඇති කාර්යයන්

I. **වගා සහ පශු සම්පත් රක්ෂණය** :වැවිලි භෝග, ඖෂධීය පැළෑටි ඇතුළු බෝග වර්ග, ධීවර කටයුතු, වන වගාව සහ පශු සම්පත් සම්බන්ධයෙන් කෘෂිකාර්මිකයින්ගේ ප්‍රතිලාභය පිණිස පූර්ණ රක්ෂණ ක්‍රමයක් පිහිටුවා ක්‍රියාත්මක කිරීම.

II. **කෘෂි උපකරණ සහ දේපල රක්ෂණය:** කෘෂි උපකරණ, මෙවලම් සහ කෘෂිකාර්මික කටයුතු වලට අදාළ අනෙකුත් චංචල හා නිශ්චල

දේපළ සම්බන්ධයෙන් වූ රක්ෂණ යෝජනා ක්‍රමයක් කෘෂිකාර්මිකයින්ගේ ප්‍රතිලාභය සඳහා පිහිටුවා ක්‍රියාත්මක කිරීම.

III. **<u>නිෂ්පාදිත ගබඩා කිරීම:</u>** කෘෂිකාර්මික සහ උද්‍යාන විද්‍යාත්මක නිෂ්පාදන සහ ඖෂධ පැළෑටි, ධීවර සහ වන නිෂ්පාදිත ගබඩා කිරීම සහ කල්තබා ගැනීම සම්බන්ධයෙන් වූ රක්ෂණ යෝජනා ක්‍රමයක් කෘෂිකාර්මිකයින්ගේ ප්‍රතිලාභය සඳහා පිහිටුවා ක්‍රියාත්මක කිරීම.

IV. **<u>සමාජ ආරක්ෂණ සහ වෛද්‍ය ප්‍රතිලාභ:</u>** කෘෂිකාර්මිකයින්ගේ ප්‍රතිලාභය සඳහා වෛද්‍ය ප්‍රතිලාභ සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම පිහිටුවා ක්‍රියාත්මක කිරීම.

උක්ත ප්‍රධාන කාර්යයන් හතරට අමතරව**,** 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත හා 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ පනත අනුව, ගොවි හා ධීවර ප්‍රජාව වෙත විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයන් පිහිටුවීමටත්, ඊට අදාළ කටයුතු මෙහෙයවීමට**ත් අදාළ** කාර්යයන් හා බලතල මණ්ඩලය වෙත පැවරී ඇත**.**

මීට අමතරව, ශ්‍රී ලංකාව තුළ වගා කරන සියලුම භෝග වර්ග ආවරණය වන පරිදි රක්ෂණ යෝජනා ක්‍රම 35ක් පමණ මණ්ඩලය මගින් දැනට ක්‍රියාත්මක කරනු ලබයි. එහිදී ජාතික වගා රක්ෂණ වැඩසටහන යටතේ ප්‍රධාන භෝග 6ක් සඳහා (වී ඇතුළුව) ගොවීන්ගෙන් වාරික මුදල් අය කිරීමකින් තොරව රජය මගින් රක්ෂණාවරණය ලබා දීමද සුවිශේෂී කර්තව්‍යයකි.

3. **<u>අනුකාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම</u>**

3.1 **<u>සැලසුම් සකස් කිරීම</u>**: 2026-2030 සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාත්මක සැලැස්ම සියලුම සේවකයන් එකතු වී සාකච්ඡා කර ආයතනය තුළදීම සකස් කරන ලද්දක් බව මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රකාශ කළේය.

3.2 **<u>සේවක ඵලදායිතාව සහ ඇගයීම:</u>** සේවකයන්ගේ ඵලදායිතාව උපරිම කර ගැනීමට සහ ඔවුන්ගේ සේවය අගය කිරීමට ස්ථාපිත කාර්යසාධන දර්ශක (KPI) (Key Performance Indicators) ක්‍රමවේදයක් සම්බන්ධයෙන් අනුකාරක සභාවේ අවධානය යොමු විය.
මානව සම්පත් සංවර්ධනය සඳහා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක වන බවත්, සෑම මාස තුනකට වරක්ම ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ප්‍රගතිය ඇගයීමට ලක් කර ඵලදායිතාව අඩු සේවකයන් සඳහා විශේෂ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන බවත් **අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රකාශ කළේය.**

3.3 <u>රක්ෂණ ක්‍රම සහ ලියාපදිංචිය:</u> කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතුවූවන්ගේ අවදානම හඳුනාගෙන නව රක්ෂණ යෝජනා ක්‍රම ආරම්භ කර තිබුණි. එහිදී තල්, කිතුල් කර්මාන්තය ආශ්‍රිතව කටයුතුකරන්නන්ට හා අතුරේ ගමන් කරන අයට විශේෂිත වූ රක්ෂණ ක්‍රම ආරම්භ කර ඇති බව සඳහන් විය. එහිදී ලාභදායීත්වයට වඩා ප්‍රතිලාභ සැලසීම අභිප්‍රාය වන අතර විශේෂයෙන් "සයුර" වැනි රක්ෂණ ක්‍රම ඉතා සහනදායී මිලකට ධීවරයන්ට ලබා දේ.
ගොවිජන සේවා මධ්‍යස්ථාන, දිස්ත්‍රික් කාර්යාල සහ ක්ෂේත්‍ර නිලධාරීන් හරහා බිම් මට්ටමේදී දැනුවත් කිරීම් සිදුකර රක්ෂණයට සම්බන්ධ කර ගන්නා බවත් මණ්ඩලයේ සභාපතිවරයා ප්‍රකාශ කළේය.

3.4 <u>පෞද්ගලික අංශයේ තරඟකාරීත්වය:</u> පෞද්ගලික රක්ෂණ ආයතන වලින් ඇති වන තරඟකාරීත්වය සහ ගොවීන් රක්ෂණයට ඇති අකමැත්ත පිළිබඳව අනුකාරක සභාවේ අවධානය යොමු වූ අතර පෞද්ගලික ආයතන වන්දි ගෙවීමට මැලි වන නමුත්, මණ්ඩලය ඕනෑම අවදානම් කලාපයක (උදා: මඩකලපුව) ගොවියෙකුට වුවද රක්ෂණාවරණ ලබා දෙන බවත්, මේ වන විට මණ්ඩලය විසින් අවදානම් කලාප හඳුනාගෙන ඇති බවත්, දේශගුණික විපර්යාස හේතුවෙන් ගොවීන් වර්තමානය වනවිට රක්ෂණය කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වන බවද සඳහන් විය.

3.5 <u>ඉදිරි වසර පහ (2027-2032) සඳහා රක්ෂණ ඉලක්ක</u>: වී ඇතුළු ප්‍රධාන බෝග 6 සඳහා වගා කරන සියලුම භූමි (යළ කන්නයේ හෙක්ටයාර ලක්ෂ 5ක් සහ මහ කන්නයේ ලක්ෂ 8ක් පමණ) රක්ෂණාවරණයට යටත්වන අතර ස්වභාවික හානියක් සිදුවුවහොත් පමණක් එම බෝග හය (6) සඳහා රජයේ ප්‍රතිපත්තිය මත නොමිලේ එම රක්ෂණාවරණය ලබා දෙන බවත් ඒ සඳහා ගොවීන්ගෙන් අයකිරීමක් සිදු නොකරන බවත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ප්‍රකාශ කළාය. මෙම බෝග 6 සඳහා නියඟය, ගංවතුර, වන අලි ආදිය හේතුවෙන් සිදුවන හානි සඳහා රජය විසින් වන්දි ගෙවීම සිදුකරන බවත් අනෙකුත් රක්ෂණාවරණ අවශ්‍යතාවය සම්බන්ධයෙන් හඳුනාගැනීමක් සිදුකර ඇති බවත් අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රකාශ කළේය.

3.6 <u>සත්ව රක්ෂණ (කුකුළු ගොවිපල):</u> කුකුළු ගොවිපලවල් සඳහා රක්ෂණයක් නොමැති වීමට හේතුව අනුකාරක සභාව විසින් විමසන ලද අතර සතුන් වෙන් වෙන්ව හඳුනා ගැනීමේ අපහසුතාව සහ අධික අවදානම (විදුලිය විසන්ධි වීම වැනි) හේතුවෙන් එය තවමත් පර්යේෂණ සහ සාකච්ඡා මට්ටමේ පවතින බව නිලධාරීහු පැහැදිලි කළහ.

3.7 <u>සේවක පුරප්පාඩු:</u> දැනට ආයතනයේ අධ්‍යක්ෂ තනතුරු ඇතුළුව සැලකිය යුතු පුරප්පාඩු සංඛ්‍යාවක් පවතින බවත්, ඒවා පිරවීම සඳහා කොටස් වශයෙන් අනුමැතිය ලැබෙමින් පවතින බවත් නිලධාරීහු ප්‍රකාශ කළෝය.

3.8 <u>විගණන නිරීක්ෂණ:</u> ජාතික විගණන කාර්යාලය නියෝජනය කරමින් පැමිණ සිටි නියෝජ්‍ය විගණකාධිපතිවරයා විසින් ආයතනික සැලසුම් වල පවතින අඩුපාඩු පෙන්වා දුන් අතර ආයතනය විසින් ස්ථාපිත කර ඇති කාර්යසාධන දර්ශක මැනීම (Evaluation of KPI) අපහසු බවත් පෙන්වා දුන්නේය.

එමෙන්ම, කාර්යසාධක දර්ශක (KPI), SMART විය යුතු බවත් ඔහු තවදුරටත් ප්‍රකාශ කළ අතර, අයවැය සැලැස්ම හා ක්‍රියාත්මක සැලැස්ම අතර පවතින සංඛ්‍යාත්මක වෙනස්කම් පෙන්වා දෙන ලදී.

4. <u>අනුකාරක සභාවේ නිර්දේශය</u>

- සාකච්ඡාවේදී ආයතනයේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මතු වූ අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කිරීම.

12. <u>රක්නා ආරක්ෂක ලංකා සමාගම</u>
<u>(ආරක්ෂක අමාත්‍යාංශය)</u>

පරීක්ෂා කරන ලද දිනය: 2026 ජූලි 23 දින

<u>පැමිණ සිටි</u>

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම., (අනු කාරක සභා සභාපති)

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා, පා.ම.,

<u>අනුකාරක සභා සභාපතිවරයාගේ අවසරය මත පැමිණ සිටි</u>

මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා, පා.ම.,

1. <u>ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්</u>

රක්නා ආරක්ෂක ලංකා සමාගම ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවතින 100% ක්ම රජය සතු ස්වයං මූල්‍යකරණය සිදු කරන ලාභ ලබන රාජ්‍ය ව්‍යාපාරයකි. පෞද්ගලික අංශය සඳහා ගොඩබිම හා මුහුදුබඩ ආරක්ෂාව සැපයීම සඳහා මෙම ආයතනය ආරම්භ කර ඇත. එයට අමතරව මේ වන විට වෙනත් ව්‍යාපාරික අංශ (SBUs) වන විශේෂ කුසලතා සහිත සේවාවන් (Special skilled Services), ආහාර සැපයුම් සහ ආපනශාලා සේවා (Catering and Restaurant), CIMSTA පුහුණු පාසල (CIMSTA Training School) සඳහාද ආයතනය විසින් අවධානය යොමු කර ඇති අතර, ඒවා වෙන වෙනම අංශ ප්‍රධානීන් යටතේ ක්‍රියාත්මක කරවමින් පවතී. ආයතනයට 100% ක් අයිතිය සතු අනුබද්ධ සමාගම් 02 ක් ලෙස රක්නා ප්‍රොපර්ටි හෝල්ඩින්ග් ලිමිටඩ් (Rakna Property Holding Ltd (RPHL)) සහ රක්නා ප්‍රොජෙක්ට් මැනේජ්මන්ට් ලිමිටඩ් (Rakna Project Management Ltd (RPML)) පවතී.

2. <u>අනු කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම</u>

- **ආයතනික සැලසුම්:** ආයතනික සැලැස්ම (corporate plan), ක්‍රියාකාරී සැලැස්ම (action plan) සහ වාර්ෂික අය වැය (Annual budget) සඳහා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය ප්‍රමාදයන් සහිතව ලබා ගෙන තිබුණි. 2024 වර්ෂයේ ඔක්තෝබර් වන විටත් 2020/2021 වර්ෂ සඳහා පමණක් මෙම සැලසුම් සකස් කර තිබූ අතර, එම පසුගිය සැලසුම් සකස් කිරීමට සිදුවීම හේතුවෙන් මෙම ප්‍රමාදය සිදුව ඇති බව ආයතනය පෙන්වා දෙන ලදී.
- **ආයතනය පිහිටුවීම හා මෙහෙයුම් කටයුතු:** සමුද්‍රීය ආරක්ෂාව සැපයීමේදී මෙම ආයතනය ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් පුද්ගලික

සමාගම (Avant Garde Maritime Services) සමග පවත්වාගෙන යන ලද බද්ධ ව්‍යාපාරය (joint venture) හා එයට අදාළ ගිවිසුම්, 2021 වර්ෂයේ සිට 2028 වර්ෂය දක්වා තිබූ ගිවිසුම අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත සිදු කර තිබූ අතර, 2009 වර්ෂයේ සිට ආරම්භ කළ ගිවිසුම් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතීන් නොමැතිව ක්‍රියාකර තිබුණි.

- **රක්නා කුලුන ඉදිකිරීම:** රක්නා කුලුන ඉදිකිරීම සඳහා වැය වී ඇති මුදල, එහි ප්‍රසම්පාදන කටයුතු, හා ඉදිකිරීම් අවසන් කිරීම සම්බන්ධයෙන් සැලැස්මක් සහිත කිසිදු ලේඛනයක් නොතිබූ අතර ඒ සඳහා කොන්ත්‍රාත්කරුවෙකු හෝ උපදේශන සමාගමක් ප්‍රසම්පාදනයකින් තෝරා ගෙන නොතිබුණි.
- **ආයතනයට අය වීමට ඇති මුදල්:** ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් පුද්ගලික සමාගමෙන් ලැබීමට ඇති 5% ක මුදල සෑම විටම මාස කිහිපයක් ප්‍රමාද කරමින් ගෙවීම් කර තිබුණි. 2025 ජූලි මාසයෙන් පසු ගෙවීම් කර නොමැති අතර, මේ සඳහා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට රේඛීය අමාත්‍යාංශයෙන් අවසර ඉල්ලා තිබුණි.

3. <u>ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම</u>

- **ආයතනය සතුව තිබූ අවි අස්ථානගත වීම:** 2011 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා අවි ලබා දී ඇති පුද්ගලයන් සම්බන්ධයෙන් තොරතුරු තිබුණද, අවි 152ක් සොයා ගැනීමට නොහැකිව රට තුළ පැවතිණි. මුහුදු ආරක්ෂාව සඳහා නිකුත් කළ මෙම අවි ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් පුද්ගලික සමාගම සමග බද්ධ ගිවිසුමක් තිබූ අවධියේ ඔවුන් මෙම අවි පාවෙන අවි ගබඩාවල (floating armoury) තබා තිබෙන අතර, අදාළ ගිවිසුම් හා ලේඛන සොයාගැනීමට නොහැකි බව ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් පුද්ගලික සමාගම දන්වා ඇති බවත් ආයතනය පැවසීය.

4. <u>අනු කාරක සභාවේ නියෝග හා නිර්දේශ</u>

1. අස්ථානගත වී ඇති අවි සම්බන්ධයෙන් මෙම ආයතනය මැදිහත් වී ආරක්ෂක අමාත්‍යාංශය සමග සාකච්ඡා කර කඩිනමින් ඉදිරි පියවර ගැනීම (රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා මගින් විදේශීයව පවතින අවි ගෙන්වා ගැනීමට ඇති හැකියාව ඇතුළුව අවි සම්බන්ධ තොරතුරු ලබා ගැනීම).
2. මෙම අවි ගෙන්වා ගැනීමට නොහැකි නම් ඒවා සමාජය තුල භාවිතයට යොදවා නොමැති බව තහවුරු කර ගැනීම සඳහා ඒවා ඇති රට, ස්ථානය, අවි අංකය සම්බන්ධයෙන් සහතිකයක් ලබා ගැනීම.

3. ආයතනයට අය වීමට ඇති මෙම මුදල් කඩිනමින් අය කර ගැනීමට නීත්‍යානුකූලව මැදිහත් වීම.
4. ආයතනය මගින් ගොඩබිම් ආරක්ෂාව හා සමුද්‍රීය ආරක්ෂාව ලබා දීමේ හැකියාව වැඩි කිරීමට පියවර ගැනීම (ආරක්ෂාව සැපයීමේ සේවා ලබා දීමේදී රජයේ ආයතනවලට ලංසු ඉදිරිපත් කර එම සේවා ලබා දීමට කටයුතු කිරීම).
5. ත්‍රිවිධ හමුදාවෙන් විශ්‍රාම යන නිලධාරීන්ට මෙම ආයතනයේ කටයුතු සම්බන්ධයෙන් ප්‍රචාරණය කර ඔවුන් මෙම ආයතනයට බඳවා ගැනීමට ඇති අවස්ථා පුළුල් කිරීම.
6. ආයතනයේ දැක්මට නොගැළපෙන කටයුතු සිදු කිරීමෙන් වැළකී ආයතනික සැලැස්මට අනුව කටයුතු කිරීම.
7. ආයතනය විසින් ජාතික විගණන කාර්යාලයට ලබා දිය යුතු සියලු වාර්තා කඩිනමින් ලබා දීම.

13. ලංකා හොස්පිටල් කෝපරේෂන් පී.එල්.සී
(මූදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දිනය: 2026 ජූලි 23 දින

පැමිණ සිටි

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම.,(අනු කාරක සභා සභාපති)
ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා, පා.ම.,

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

ලංකා රෝහල 1997 ඔක්තෝබර් මස පෞද්ගලික සීමිත සමාගමක් (Public limited company) ලෙස ලියාපදිංචි කරන ලද අතර, 2001 නොවැම්බර් මස පොදු සීමිත සමාගමක් (Public limited company) ලෙසත්, 2003 ජනවාරි මස කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත සමාගමක් බවටත් පත්ව ඇත. 2008 ජූලි මස 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ රෝහල නැවත ලියාපදිංචි කර ඇති ඇත. රෝහල සතුව සේවකයින් 2,200කට ආසන්න පිරිසක් සිටින අතර, එයින් 50% ක් පමණ සායනික සේවා සඳහා සම්බන්ධව සිටී. රෝහලේ ඇඳන් 260ක්, ශල්‍යාගාර 11ක් සහ දැඩි සත්කාර ඒකක 6ක් පවතී. රෝහල සතුව JCI (Joint Commission International) ප්‍රතීතනය ඇතුළු ජාත්‍යන්තර ප්‍රතීතන (Accreditations) හයක් පවතී. රෝගීන්ට අවශ්‍ය සියලුම සේවාවන් එක් ස්ථානයකින් ලබාගත හැකි "Centers of Excellence" 11ක් රෝහල තුළ ක්‍රියාත්මක වේ.

2. අනු කාරක සභාවේ හා ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

- **ජත්‍යාන්තර සහතික:** රෝහල සහ රසායනාගාරය සඳහා ලබාගෙන ඇති JCI හා CAP යන ජාත්‍යන්තර සහතික 02 ම සතු ශ්‍රී ලංකාවේ එකම රෝහල ලංකා රෝහල බවත්, අනෙක් රෝහල්වල රසායනාගාර සඳහා පමණක් JCI සහතිකය ඇති බවත් ආයතනය පැවසීය.
- **රෝහලෙහි රසායනාගාරය සම්බන්ධ ගැටළුව:** කල් ඉකුත් වූ රසායනික ද්‍රව්‍ය භාවිතා කර පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධ සිදුවීම පිළිබඳව අනු කාරක සභාවේ අවධානය යොමු විය. පාරිභෝගික සේවා අධිකාරිය පැමිණීමට පෙර මේ සම්බන්ධයෙන් රෝහල විසින් විමර්ශනය කරමින් පැවති බවත්, අදාළ රසායනික ද්‍රව්‍ය වෙන් කර

තබා තිබුණ ද, ඒවා ඉවත් කර නොතිබුණු බැවින් වරදක් සිදු වී ඇති බවත් ආයතනය පැවසීය.

- **<u>රෝහලට විදේශීය රෝගීන් පැමිණීම වර්ධනය කර ගැනීම</u>:** රෝහලට විදේශීය රෝගීන් පැමිණීම වර්ධනය කර ගැනීම සඳහා සිදු කිරීමට අපේක්ෂිත සැලසුම් පිළිබඳව අනු කාරක සභාව විමසීය. මාලදිවයින් රෝගීන් ගෙන්වා ගැනීමට පසුගිය මස (2026 ජූනි) තානාපති කාර්යාලය හරහා කටයුතු සිදු කර නැවත අසන්ධා රක්ෂණ වැඩසටහන (Aasandha Scheme) සමග රෝහල ගිවිසුම්ගත වූ බව දැනුම් දෙන ලදී.
- **<u>2025 වර්ෂය සඳහා ආයතනයේ අය වැය</u>:** ආයතනයේ මුදල් වර්ෂය ආරම්භ වී මාස 06 ක් පමණ කල් ගත වුවද, වෛද්‍ය උපකරණ සහ ගොඩනැගිලි සඳහා වෙන් කර ඇති මුදල් වැය කිරීම ප්‍රමාණවත් නොවීම පිළිබඳව අනු කාරක සභාව විමසන ලදී. එළඹෙන 25 වන සංවත්සරයට පෙර රෝහල අළුත්වැඩියා කිරීමට සැලසුම් කර ඇති බැවින් ඒ සඳහා ප්‍රතිපාදන ඉහළ ගොස් ඇති බවත්, පසුගිය වසර 24 තුළ එසේ සිදු නොවූ බැවින් ඒ සඳහා වෙන් කළ මුදල් ඉතිරී වී ඇති බවත් ආයතනය පැවසීය.
- **<u>ආයතනික සැලැස්ම</u>:** යාවත්කාලීන වන වක්‍රීය සැලැස්මක් තිබීම, ප්‍රධාන කාර්ය සාධන දර්ශක (Key Performance Indicators (KPIs), රෝහලේ ඇති අවස්ථා (opportunities), අභියෝග (threats), ශක්තීන් (strengths) හා දුර්වලතා (weaknesses) හඳුනාගෙන තිබීම හා ආයතනය සඳහා පෙර තිබූ ආයතනික සැලැස්ම සම්බන්ධයෙන් අනු කාරක සභාවේ අවධානය යොමු විය. රෝහල් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් දීර්ඝ කාලීනව සැලසුම් කිරීම අපහසු බැවින් මෙයට පෙර වර්ෂවල රෝහල සඳහා වර්ෂ 02 ක් සඳහා පමණක් වන ආයතනික සැලැසුම් තිබූ බවත්, රෝහල සතුව ඇති අවස්ථා, අභියෝග, ශක්තීන් හා දුර්වලතා හඳුනාගෙන ඇති බවත් පෙන්වා දෙන ලදී.
- **<u>ලියාපදිංචි නොකළ ඖෂධ භාවිතා කිරීම</u>:** රෝහල විසින් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි නොකළ ඖෂධ භාවිතා කිරීම පිළිබඳව සෞඛ්‍ය ඇමතිතුමා සමග සාකච්ඡා කර, සෞඛ්‍ය අමාත්‍යාංශයට දැනුම් දුන් බවත්, ජාතික ඖෂධ නියාමන අධිකාරිය සමග මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළ බවත්, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපතිවරයා සමග සාකච්ඡා කර ඔවුන් හරහා මෙම ඖෂධ ගෙන්වා ගන්නා ලෙස සෞඛ්‍ය අමාත්‍යවරයා දැනුම් දී ඇති බවත් ආයතනය දැනුම් දෙන ලදී.

3. <u>අනු කාරක සභාවේ නියෝග හා නිර්දේශ</u>

1. රසායනාගාරයට සහ රෝහලට අදාල පොදු සහතිකයක් (JCI සහතිකය) (ඒකාබද්ධ) ලබා ගැනීමට කටයුතු කිරීම.
2. ආයතනය විසින් ඉදිරිපත් කළ සැලසුම්වල තිබෙන දුර්වලතා මෙන්ම ආයතනයේ අභ්‍යන්තර ක්‍රියාකාරීත්වයේ පවතින දුබලතාවයන් හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම.
3. කල් ඉකුත් වූ රසායනික ද්‍රව්‍ය රෝහලෙහි රසායනාගාරයේ තබා ගැනීමට අදාළ විමර්ශනය අවසන් වී ඇති බැවින් ඒ සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම.
4. රෝහලේ ඇති පැරණි ගොඩනැගිලි, ගෘහභාණ්ඩ සහ පෙනුම සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම.

14. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

(ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දිනය: 2026 ජූලි 24 දින

පැමිණ සිටි:
ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම. (අනුකාරක සහා සභාපති),
ගරු ජගත් මනුවර්ණ මහතා, පා.ම.

අනුකාරක සහා සභාපතිවරයාගේ අවසරය මත පැමිණ සිටි
ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය, පා.ම.,
ගරු රුවන් මාපලගම මහතා, පා.ම.,
ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.,

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

- **පසුබිම හා රථ ඇණිය:** 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය පනතින් පිහිටුවන ලද මෙම මණ්ඩලය, ප්‍රාදේශීය කාර්යාල 12කින්, ඩිපෝ 106කින්, වැඩපොළ 13කින් සහ සේවකයින් 25,041කින් සමන්විත වේ. මණ්ඩලය සතුව මුළු බස් රථ 7,130ක් තිබුණද 2026.05.31 වන විට ධාවනය කළ හැකි මට්ටමේ පවතින්නේ බස් රථ 5,016ක් පමණි.
- **සංයුක්ත සැලැස්ම හා ඩිජිටල්කරණය:** 2026-2030 සංයුක්ත සැලැස්ම යටතේ දෛනිකව ධාවනය වන බස් රථ ප්‍රමාණය 5,600 දක්වා ඉහළ නැංවීම, මුදල් භාවිතයෙන් තොර ප්‍රවේශ පත්‍ර පද්ධතිය, GPS උපාංග සවිකිරීම සහ ඩිජිටල් මෙහෙයුම් මැදිරියක් පිහිටුවීමට කටයුතු කරමින් පවතී.
- **මූල්‍ය කාර්යසාධනය හා ප්‍රසම්පාදනය:** 2026 වසර සඳහා භාණ්ඩාගාරයෙන් පුනරාවර්තන වියදම් වෙනුවෙන් රුපියල් මිලියන 15,630ක් වෙන් කර ඇත. රථ ඇණිය ශක්තිමත් කිරීමට නව සාමාන්‍ය බස් රථ 600ක් සහ සුඛෝපභෝගී බස් රථ 200ක් මිලදී ගැනීමට සැලසුම් කර ඇත.

2. කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

- **රථ ඇණියේ ඉහළ ධාවන කාලය:** ධාවන කාලය අවුරුදු 15 ඉක්ම වූ බස් රථ 1,782ක් පැවතීම සහ මෑත කාලීනව අලුත් බස් රථ මිලදී නොගැනීම හේතුවෙන් දෛනික ධාවන කිලෝමීටර් ප්‍රමාණය අඩුවී ඇති බව ආයතනය පැවසීය.
- **මානව සම්පත් හා ආකල්ප**: ආයතනයේ පවතින දේශපාලනීකරණය පාලනය කිරීමට "ලංගම අපි එක පවුලක්" සංකල්පය යටතේ පුහුණු

වැඩසටහන් ආරම්භ කර ඇති අතර, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩල ව්‍යූහයට සේවකයින් අන්තර්ග්‍රහණය කිරීමේ කටයුතු ඉදිරි මාස 2 තුළ අවසන් කරන බව ආයතනය පැවසීය.

- **තාක්ෂණය සහ ඩිජිටල්කරණයේ ප්‍රමාදයන්:** අභ්‍යන්තරව තොරතුරු තාක්ෂණ පද්ධති සකස් කිරීමට උත්සාහ කිරීමේදී මෘදුකාංග ඉංජිනේරුවන්ගේ වැටුප් ගැටලු හේතුවෙන් ඔවුන් ආයතනය හැර යාම ප්‍රධාන බාධාවක් වූ බව ආයතනය පිළිගත්තේය. කෙසේ වෙතත්, දැනට GPS පද්ධතිය සහ පෙරගෙවුම් කාඩ්පත් ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදන කටයුතු අවසන් අදියරේ පවතින බවත්, ඉදිරි වසරේදී සම්පූර්ණ කළමනාකරණ පද්ධතියම බාහිර පාර්ශ්වයක සහාය ඇතිව ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇති බවත් ආයතනය පැවසීය.

3. ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

ප්‍රසම්පාදන ප්‍රතිපාදන උපයෝජනය: ප්‍රසම්පාදන කටයුතුවලින් 65%ක් පමණ මෙතෙක් ක්‍රියාත්මක කර නොමැති වීම සහ වෙන් කළ ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය නොකිරීම ජාතික විගණන කාර්යාලය පෙන්වා දුන් අතර, බස් රථ මිලදී ගැනීමේදී මුදල් ගෙවීම් සිදු කරන්නේ භාණ්ඩ ලැබුණු පසුව බැවින් මූල්‍ය ප්‍රගතියක් නොපෙන්වන බව ආයතනය පැවසීය.

4. <u>අනුකාරක සභාවේ ප්‍රධාන නිර්දේශ</u>

- ආයතනයේ ඉදිරි වසර 5 සඳහා වන ඉලක්ක සහ ඒවා කරා ළඟා වන ආකාරය පිළිබඳව වඩාත් නිශ්චිත හා පැහැදිලි සංයුක්ත සැලැස්මක් සකස් කර ඉදිරිපත් කිරීම.
- තොග පාලනය සඳහා තවදුරටත් පැරණි අතින් ලියන "බින් කාඩ්" (Bin Card) ක්‍රමය භාවිතා කිරීම වෙනුවට නවීන තොග පාලන ක්‍රම භාවිතා කිරීම.
- ඩිපෝ අතර පවතින සේවක අසමතුලිතතාවය (අතිරික්ත සහ හිඟකම්) කළමනාකරණය කිරීමට දත්ත පද්ධතියක් භාවිතා කර නිවැරදි වැඩපිළිවෙළක් සකස් කිරීම.
- ඩිපෝ සංවර්ධනය කිරීම සඳහා විශාල වශයෙන් මුදල් වැය කිරීමට පෙර, සේවකයින්ගේ ආකල්පමය වෙනසක් ඇති කිරීම මඟින් ඩිපෝ පරිශ්‍රයන් පිරිසිදුව හා විධිමත්ව පවත්වා ගැනීමට කඩිනමින් පියවර ගැනීම.

15. කැලණිය විශ්වවිද්‍යාලය

(අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දිනය: 2026 ජූලි 24 දින

පැමිණ සිටි:
ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම. (අනුකාරක සභා සභාපති),
ගරු ජගත් මනුවර්ණ මහතා, පා.ම.

අනුකාරක සභා සභාපතිවරයාගේ අවසරය මත පැමිණ සිටි
ගරු රුවන් මාපලගම මහතා, පා.ම.,
ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.,

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

- **පසුබිම හා ශිෂ්‍ය සංයුතිය:** 1959 දී විද්‍යාලංකාර පිරිවෙණින් ආරම්භ වූ කැලණිය විශ්ව විද්‍යාලය පීඨ 7කින්, අධ්‍යයනාංශ 58කින් සහ විශේෂිත මධ්‍යස්ථානවලින් සමන්විත වේ. 2025 දෙසැම්බර් 31 වන විට මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 77,101ක් වන අතර, කාර්ය මණ්ඩලය 1,817කි.
- **සංයුක්ත සැලැස්ම හා ඩිජිටල්කරණය:** 2026-2030 උපායමාර්ගික සැලැස්ම එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු (SDGs) 9ක් මත පදනම්ව, අරමුණු 5ක්, උප අරමුණු 24ක් සහ KPIs 44ක් යටතේ ක්‍රියාත්මක වේ. ප්‍රගති වාර්තාකරණය මෙන්ම ක්‍රියාකාරී සැලසුම් සැකසීම ඩිජිටල් පද්ධතියක් හරහා සිදු කෙරේ.
- **මූල්‍ය කාර්යසාධනය හා ප්‍රසම්පාදනය:** 2026 වසරේ මුළු ඇස්තමේන්තුගත ආදායම රුපියල් බිලියන 9.4කි; පුනරාවර්තන වියදම රුපියල් බිලියන 8.092ක් සහ ප්‍රාග්ධන වියදම රුපියල් බිලියන 1.311ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. වාණිජ හා කළමනාකරණ පීඨ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවන තෙක් අපේක්ෂාවෙන් සිටී.

2. කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

- **මානව සම්පත් හා බුද්ධි ගලනය:** 2017 වසරෙන් පසු අනුමත කාර්ය මණ්ඩල සංශෝධනයක් (Cadre Revision) සිදු වී නොමැති අතර ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ යාම, බුද්ධි ගලනය සහ කාර්ය මණ්ඩල හිඟය විශ්ව විද්‍යාලයට දැඩි ලෙස බලපා ඇති බව පැවසීය. බාහිර කථිකාචාර්යවරුන්ගේ ගෙවීම් ගාස්තුද 2016 සිට සංශෝධනය වී නොමැත.

- **විදේශීය පර්යේෂණ ප්‍රදාන ප්‍රමාදයන්:** විදේශීය පර්යේෂණ ප්‍රදාන ලබා ගැනීමේදී ගිවිසුම් අත්සන් කිරීමට අමාත්‍යාංශ, භාණ්ඩාගාර සහ නීතිපති දෙපාර්තමේන්තුව හරහා සිදු කිරීමට සිදුවීම හේතුවෙන් වසර 2ක් පමණ කාලය ගත වන අතර, එමඟින් රටට ලැබීමට තිබෙන විදේශීය ප්‍රදාන හා විදේශ විනිමය අහිමි වන බව පෙන්වා දෙන ලදී.
- **රැකියා නියුක්තිය සහ විෂයමාලා යාවත්කාලීන කිරීම**: 2030 වන විට උපාධිධාරී රැකියා නියුක්තිය 10%කින් ඉහළ නැංවීමට ඉලක්ක කර ඇති අතර, පෞද්ගලික අංශයේ අවශ්‍යතාවලට අනුකූලව නවීන උපාධි පාඨමාලා හඳුන්වා දී ඇත. පෞද්ගලික අංශයේ තරඟකාරීත්වයට මුහුණ දීම සඳහා ව්‍යවසායකත්ව/පුද්ගලික සන්නාමකරණ වැනි මොඩියුල ඇතුළත් කිරීම වැදගත් බව කාරක සභාව පෙන්වා දුන්නාය.

3. <u>ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම</u>

- **විගණන වාර්තා සහ සැලසුම් අනුකූලතාව:** අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපතිවරයා වෙත යොමු කිරීමේ ප්‍රමාදයන් පවතින බැවින් ජාතික විගණන පනත අනුව ඒවා සෘජුවම යොමු කිරීමටත්, ජාතික අවශ්‍යතා උපායමාර්ගික සැලසුම්වලට බද්ධ කිරීමටත් නියෝජ්‍ය විගණකාධිපති විසින් පෙන්වා දෙන ලදී.

4. <u>අනුකාරක සභාවේ ප්‍රධාන නිර්දේශ</u>

- උපායමාර්ගික සැලසුම, වාර්ෂික ක්‍රියාකාරී සැලසුම, අයවැය සහ ප්‍රසම්පාදන සැලසුම සමඟ විධිමත් 'මානව සම්පත් සැලසුමක්' (Human Resource Plan) සකස් කිරීම.
- කාර්ය මණ්ඩල හිඟයට පිළියම් යෙදීමට 2017 වසරෙන් පසු සිදු නොවූ අනුමත කාර්ය මණ්ඩල සංශෝධනය යාවත්කාලීන කිරීම සහ බාහිර කථිකාචාර්ය ගාස්තු ඉහළ නැංවීම සඳහා අමාත්‍යාංශය හා මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කිරීම.
- විශ්ව විද්‍යාල නිල වෙබ් අඩවිය වඩාත් සවිස්තරාත්මකව සහ යාවත්කාලීනව පවත්වාගෙන යාම.
- අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයා වෙත නියමිත පරිදි අඛණ්ඩව ලබා දීමට කටයුතු කිරීම.

16. සංවර්ධන ලොතරැයි මණ්ඩලය

(මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දින - 2026 අගෝස්තු 04 දින

පැමිණ සිටි:
ගරු වන්දිම හෙට්ටිආරච්චි මහතා (අනුකාරක සභා සභාපති), පා.ම.,
ගරු මුජීබුර් රහුමාන් මහතා, පා.ම.,
ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

- **මූල්‍ය කාර්යසාධනය හා ජාතික දායකත්වය:** 2026 මුල් මාස 6 තුළ ආදායම 144%කින් (රු. මි. 18,000 සිට 25,970 දක්වා) වර්ධනය වී ඇත. 2026 ජාතික ආර්ථිකයට රු. බිලියන 13.9ක දායකත්වයක් හා ජනාධිපති අරමුදලට රු. බිලියන 10ක ලබාදීමේ ඉලක්කයක් පවතී (මුල් මාස 6 දී ජනාධිපති අරමුදලට රුපියල් මිලියන 5,305ක් ලබා දී ඇති අතර එය 111%ක ප්‍රගතියකි).
- **උපායමාර්ගික අරමුණු (2026-2028):** නව වෙළෙඳපොළ හඳුනාගැනීම, ජංගම යෙදුම්/SMS හරහා අලෙවිය පුළුල් කිරීම, ක්‍රියාවලීන් කාර්යක්ෂම කිරීම, නීති රීති/පාලනය ශක්තිමත් කිරීම හා මානව සම්පත් සංවර්ධනය යන ප්‍රධාන අංශ 6 යටතේ ක්‍රියාත්මක වේ.
- **ප්‍රචාරණ වියදම් හා නවෝත්පාදන:** ප්‍රචාරණ වියදම් රු. මි. 69.8 සිට මි. 11 දක්වා 84%කින් කපාහැර තිබුණද දෛනික ටිකටපත් අලෙවිය ලක්ෂ 36-37 දක්වා ඉහළ ගොස් ඇත. පදික වේදිකාවලින් ලොතරැයි කූඩු ඉවත් කර නවීන ලොතරැයි සැල් 50ක් පිහිටුවා ඇති අතර ප්‍රධාන දුම්රිය ස්ථානවල තවත් 50ක් පිහිටුවීමට නියමිතය. 2026 මාර්තු වන විට නව ලොතරැයිපත් හඳුන්වා දීමට නියමිතය.
- **තරුණ ආකර්ෂණය හා ඩිජිටල්කරණය:** වයස 40ට අඩු පිරිස් ආකර්ෂණයට WhatsApp, වෙබ් අඩවි හා යෙදුම් හරහා ඩිජිටල් අලෙවිය පුළුල් කිරීමට කටයුතු කිරීම.

2. කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

- **සැලසුම් කාලරාමුව හා ප්‍රචාරණ කපාහැරීම:** කාලගුණය වැනි සාධක මත අලෙවිය වෙනස් වන බැවින් සැලැස්ම 2026-2028 දක්වා වසර 3කට සීමා කර ඇති අතර එය වාර්ෂිකව යාවත්කාලීන වන (Rolling Plan) සැලැස්මක් බවත් ප්‍රචාරණ වියදම් කපා හැරීමෙන් අලෙවියට හානියක් වී නොමැති අතර මාධ්‍ය ආයතන පෝෂණය වීම වැළකී ඇති බවත් ආයතනය පැවසීය.

- **ධාරිතාව, අලෙවි ප්‍රගතිය හා මිලකරණය:** පවතින සම්පත් කාර්යක්ෂමව භාවිතය, අලෙවි නියෝජිතයන්ගේ ගැටලුවලට සෘජු මැදිහත්වීම හා පළපුරුදු නිලධාරීන්ගේ සේවය හේතුවෙන් ඉලක්ක ඉක්මවා ගොස් ඇති බවත්, ටිකට්පත් මිල වැඩි කර නැති අතර විදේශ වෙළෙඳපොළ ඉලක්ක කරගත් ඉහළ වටිනාකමකින් යුතු ලොතරැයිපත් ගැන සලකා බලමින් පවතින බවත් ආයතනය පැවසීය.
- **නීති විරෝධී ඔට්ටු ඇල්ලීම හා නීතිමය බාධා:** ලොතරැයි අංක පදනම් කරගත් 'කොටු කැපීම' වැළැක්වීමට පවතින රු. 100-200 සුළු දඩ ප්‍රමාණවත් නොවන බැවින්, 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාව ආයතනය පෙන්වා දෙන ලදී. ලොතරැයි මිලදී ගැනීමේදී එම මුදල් ජනාධිපති අරමුදල හරහා රටේ සෞඛ්‍ය සේවාවට හා අධ්‍යාපනයට දායක වන ආකාරය ප්‍රචාරණය කර ලොතරැයි මිලදී ගැනීමේදී පාරිභෝගිකයාට අගයක් එකතු කිරීමට කටයුතු කිරීමට කාරක සභාව අවධාරණය කරන ලදී.

3. <u>කාරක සභාවේ නිර්දේශ</u>

නීති විරෝධී ඔට්ටු ඇල්ලීම් ('කොටු කැපීම') තහනම් කිරීම සහ දඩ මුදල් ඉහළ නැංවීම සඳහා 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත කඩිනමින් සංශෝධනය කිරටෙ අවශ්‍ය පියවර ගැනීම.

17. ලංකා බැංකුව

(මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දින - 2026 අගෝස්තු 04 දින

පැමිණ සිටි:
ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා (අනුකාරක සභා සභාපති), පා.ම.,
ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

- **ඉතිහාසය හා මූල්‍ය ප්‍රමුඛතාව:** 1939 දී ඇරඹි වසර 84ක ඉතිහාසයක් ඇති බැංකුව 2012 දී රු. ට්‍රිලියනයේ ආදායම සහිත ශ්‍රී ලංකාවේ පළමු බැංකුව විය. 2024 දී රු. බිලියන 100කට අධික ලාභයක් ලබා ගත් අතර 2026 දී ලොව ශක්තිමත්ම බැංකු සන්නාම 500 අතරට එක් විය. තැන්පතු ට්‍රිලියන 4.5 (වෙළඳපොළ කොටස 20%), ණය ට්‍රිලියන 2.7 (වෙළඳපොළ කොටස 21%) හා වත්කම් ට්‍රිලියන 5.5 (වෙළඳපොළ කොටස 25%) සමඟ මෙරට මූල්‍ය වෙළඳපොළ ප්‍රමුඛයා බවට පත්ව ඇත.
- **ජාතික ආර්ථික දායකත්වය:** රාජ්‍ය ආයතනවලට රු. බිලියන 794ක ණය, රජයේ සුරැකුම්පත්වල රු. ට්‍රිලියන 2.2ක ආයෝජන, පුද්ගලික අංශයේ ට්‍රිලියන 2කට අධික ආයෝජන සිදුකරමින් වර්ෂ 2025 දී බදු/ලාභාංශ ලෙස රු. බිලියන 89.4ක් රජයට ලබා දී ඇත. බැංකුව මඟින් යටිතල පහසුකම්වලට රු. බිලියන 172ක්, කෘෂි/කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර අංශයට බිලියන 416ක්, BOC Youth හරහා තරුණ ව්‍යවසායකයින් 21,553කට රු. බිලියන 10.3ක් හා කාන්තාවන්ට රු. බිලියන 20ක ණය සපයා ඇත.
- **විදේශ ගනුදෙනු, ඩිජිටල්කරණය හා 2026-2030 සැලැස්ම:** 2025 දී ඇමරිකානු ඩොලර් බිලියන 1.7ක විදේශ ප්‍රේෂණ (2026 මුල් මාස 7 දී ඇමරිකානු බිලියන 1.1ක්) ලබා ගෙන ඇත. BOC SmartPay හරහා ගනුදෙනුවලින් 93%ක් මාර්ගගතව සිදුවේ. 2026-2030 පස් අවුරුදු සැලැස්ම කුළුණු 6ක්, ඉලක්ක 168ක් හා ක්‍රියාකාරී සැලසුම් 1,485ක් මත පදනම් වේ.

2. කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

- **නීතිමය රාමුව**: 1938 ලංකා බැංකු ආඥාපනත සංශෝධන අවසන් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත.
- **නම්‍යශීලී සේවා හා තාක්ෂණය:** BOC Plus යෙදුම තුළින් බස් ගාස්තු/ටියුෂන් ගෙවීම් සිදුකිරීම හා ක්ෂණික ජංගම ණය පහසුකම් හඳුන්වා දී ඇත. බැංකුව විසින් 3 වන මට්ටමේ අක්‍රිය ණය (NPL) අනුපාතය 9% දක්වා අඩු කිරීමට කටයුතු කොට ඇත.

- **<u>ක්ෂුද්‍ර ව්‍යවසායක සහාය හා ව්‍යාපාර පුනර්ජීවනය</u>:** BOC Connect නියෝජිත බැංකු, 1% කොමිස් මුදලක් සහිත QR ගෙවීම්, දින 5 නේවාසික වැඩමුළු, දේපළ ඇපවලින් තොරව ණය ලබා දෙන BOC මිතුරු කණ්ඩායම් යෝජනා ක්‍රමය, ව්‍යාපාර අධීක්ෂණය හා මහපෙන්වීම සඳහා සංවර්ධන සහකාර නිලධාරීන් යොදා ගැනීම හා ලංකාවේ පළමු 'ව්‍යාපාර පුනර්ජීවන ඒකකය' ආදි විවිධ මාර්ග ඔස්සේ ක්ෂුද්‍ර ව්‍යවසායකයන් හට උපදේශනය හා මහපෙන්වීම ලබා දේ.

3. <u>ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම</u>

- **<u>ණය සාන්ද්‍රණය, පාලන ක්‍රමවේද හා තොරතුරු තාක්ෂණ අවදානම්:</u>** සමස්ත ණය කළඹෙන් 45% කට අධික ප්‍රතිශතයක් රාජ්‍ය අංශය වෙත පැවතීම, මහා පරිමාණ ණය ලබා දීමේදී පවතින පාලන ක්‍රමවේදවලින් බැහැරවීම සහ බැංකු පද්ධතිය ස්වයංක්‍රියකරණය වීමත් සමඟ තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවය ජාතික විගණන කාර්යාලය විසින් පෙන්වා දෙන ලදී. 2022 දී තිබූ 50% ක රාජ්‍ය නිරාවරණය 2026 වන විට 28% දක්වා අඩු තිබුණි.

- **<u>දුර්වලතා නිරාකරණය හා සංවර්ධන උපායමාර්ග:</u>**
    1) දත්ත විශ්ලේෂණ/කෘතිම බුද්ධිය සඳහා විශාල වශයෙන් ආයෝජනය කිරීම,
    2) වාණිජ බැංකු රටාවට ගැලපෙන නම්‍යශීලී ප්‍රසම්පාදන ක්‍රමවේදයක් රේඛීය අමාත්‍යාංශයට යෝජනා කිරීම,
    3) ජාත්‍යන්තර උපදේශක සහාය ඇතිව ආයතනික ව්‍යුහය සමාලෝචනය කිරීමට කටයුතු කිරීම.
    4) ලාභය ප්‍රග්ධනීකරණය කිරීම, ණයකර හා තිරසාර බැඳුම්කර මඟින් ප්‍රාග්ධන වර්ධන සැලැස්ම (CAR) ශක්තිමත් කිරීම.
    5) පැය 24 පුරා ක්‍රියාත්මක ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානය හරහා තොරතුරු තාක්ෂණික ආරක්ෂාව තහවුරු කිරීම ආදිය තුළින් බැංකුවේ දුර්වලතා නිරාකරණය කොට බැංකුව සංවර්ධන කිරීමට පියවර ගැනීම.

18. ජාතික ලොතරැයි මණ්ඩලය
(මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දිනය- 2026 අගෝස්තු 04 දින

පැමිණ සිටි
ගරු දිනේෂ් හේමන්ත මහතා, පා.ම.,(අනුකාරක සභා සභාපති)
ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය, පා.ම.,

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකාවේ පළමු ලොතරැයිපත වන ආරෝග්‍යශාලා ලොතරැයිපත 1955 අංක 04 දරන රෝහල් ලොතරැයි පනත යටතේ වෙළෙඳපොලට නිකුත් කර ඇති අතර ආරම්භයේ දී සේවකයින් 36ක් පමණක් සිට ඇත. 1963 අංක 11 දරන මුදල් පනත යටතේ ජාතික ලොතරැයි මණ්ඩලය පිහිටුවා ඇත.

ජාතික ලොතරැයි මණ්ඩලයේ නිෂ්පාදිත ලෙස දිනුම් අදින ලොතරැයිපත් අටක් (8) හා සූරන ලොතරැයි පත් දෙකක් (02) ඇති අතර මුළු ලොතරැයි පත් සංඛ්‍යාව 10කි. ලොතරැයිපතක අලෙවි වටිනාකම රු. 40.00 ක් වන අතර එයින් රු.20.94ක් ත්‍යාග සඳහාත්, රු. 4.71ක් ඒකාබද්ධ අරමුදල සඳහාත් වෙන් කරනු ලැබේ.

2. අනුකාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

2.1 නව කාර්යාල භූමියකට මාරුවීම : නව කාර්යාල භූමියකට මාරුවීමට දැඩි අවශ්‍යතාවයක් ජාතික ලොතරැයි මණ්ඩලයට ඇති බවත් 2018 දී කුලී පදනමට ලබාගත් ගොඩනැගිල්ලක් සඳහා මූලික අත්තිකාරම් මුදල් ලෙස (key money) රු. මිලියන 25ක් ද ආරක්ෂිත ඇප ලෙස රු. මිලියන 65ක මුදලක් ද බදු හිමියා විසින් තබාගෙන ඇති අතර ආයතනය විසින් දැනට රු. මිලියන 8ක පමණ මාසික බදු කුලියක් ද ගෙවමින් සිටින බව මණ්ඩලයේ සභාපතිවරයා ප්‍රකාශ කළේය.

3. ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

3.1. ආයතනික සැලසුම්වල ප්‍රගතිය : 2021.11.16 දිනැති 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ත්‍රෛවාර්ෂිකව හෝ අර්ධ වාර්ෂිකව ආයතනික සැලසුම්වල ප්‍රගතිය (ක්‍රියාකාරී සැලැස්ම හා අනෙකුත් සැලසුම්) ඇගයීමට ලක්කළ යුතු අතර එලෙස සැලසුම් ඇගයීමට

ලක්කර තීරණ ගත් බවට වන ප්‍රගති සමාලෝචන වාර්තා මේ දක්වා විගණනයට ඉදිරිපත් කර නොමැති බව අනාවරණය විය.

ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය කාර්තුවකට වරක් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් හරහා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීමට තීරණය කර තිබුණි.

3.2 <u>**වෙළෙඳපොල සමීක්ෂණ**</u>: වෙළෙඳපොල සමීක්ෂණ සම්බන්ධයෙන් වාර්තා විගණනයට ඉදිරිපත් වී නොතිබුණු බව නිරීක්ෂණය විය. 2026 අයවැය තුළ මේ සඳහා ප්‍රතිපාදන වෙන් කළ බව ප්‍රධාන මූල්‍ය නිලධාරිනිය ප්‍රකාශ කළාය.

වෙළෙඳපොල සමීක්ෂණ මගින් හඳුනාගත් දෑ පිළිබඳව අනුකාරක සභාව විමසිය. අලෙවි ජාලයේ රැස්වීම් පැවැත්වීමේ දී සිදුව ඇති අඩපාඩු හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමට කටයුතු කළ බවත් පනත හා මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධ අලෙවි ජාලයේ දැනුවත්භාවය ඉහළ නැංවීමට කටයුතු සිදු කළ බවත් අලෙවි කුටි ස්ථානගත කිරීම සම්බන්ධ ගැටලු නිරාකරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් සිටින බවත් මණ්ඩලයේ සභාපතිවරයා ප්‍රකාශ කළේය.

3.3. <u>**පනත සංශෝධනය කිරීම :**</u> නීතිවිරෝධී ලොතරැයි සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හැකි වන පරිදි ජාතික ලොතරැයි මණ්ඩලය සඳහා බලපවත්වන පනත සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම සම්බන්ධයෙන් අනුකාරක සභාවේ අවධානය යොමුවිය. පනත සංශෝධනයට අදාළ කටයුතු සිදු කෙරෙමින් පවතින බව ප්‍රකාශ විය.

3.4. <u>**"කොටු කැපීම" නමින් හඳුන්වන ලොතරැයි සම්බන්ධයෙන් සිදුවන ඔට්ටු ඇල්ලීමේ ක්‍රියාවලිය:**</u> මෙම සංකල්පය නීතිගත කිරීම හෝ මෙම සංකල්පය තම ව්‍යාපාර කටයුත්තට යොදා ගැනීමට කිසිදු අවශ්‍යතාවයක් නොමැති බවත් මෙය බරපතල ව්‍යසනයක් බවට පත්ව ඇති බවත් ග්‍රාමීය ජනතාව මෙන්ම ධනවත් ප්‍රජාව ද මෙයට ගොදුරු වී ඇති බවත් මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි යොමු කර ඇති බවත් මීට අදාළව වැඩිදුරටත් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට මූදල් අමාත්‍යාංශයේ ද සහාය අවශ්‍ය බවත් මණ්ඩලයේ සභාපතිවරයා අනුකාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය.

3.5. <u>**ලබාගැනීමට ඉදිරිපත් නොවූ ත්‍යාග :**</u> ලොතරැයි ජයග්‍රහණ ලද නමුත් ත්‍යාග ලබාගැනීමට ඉදිරිපත් නොවූ ත්‍යාග මූදල් වටිනාකම රු. මිලියන 541ක් වැනි විශාල අගයක් වූ බව නිරීක්ෂණය විය. දිනුම් ඇදීම අවසන්වී මාස 6ක්

ඉක්මවූ පසු ඉදිරිපත් වන ජයග්‍රාහකයින්ට ත්‍යාග මුදල් ලබා දීමට හැකියාවක් නොමැති බව සාමාන්‍යාධිකාරීවරයා ප්‍රකාශ කළේය. ටිකට්පත අලෙවි කළ නියෝජිතයා සොයා ගැනීමට හැකියාව තිබුණද ජයග්‍රාහී ටිකට්පත මිලට ගත් පුද්ගලයා සොයාගැනීමට ක්‍රමවේදයක් නොමැති බව මණ්ඩලයේ සභාපතිවරයා ප්‍රකාශ කළේය.

4. <u>වෙනත් කරුණු</u>

ජාතික ලොතරැයි මණ්ඩලයේ ආදායමෙන් ඒකාබද්ධ අරමුදලට දායකත්වය සැපයුවද ඒකාබද්ධ අරමුදලින් එම දායකත්වය අදාළ සුවිශේෂී අරමුදල් සඳහා (උදා- ගොවිසෙත අරමුදල, ක්‍රීඩා අරමුදල වැනි) බැර නොකිරීම තුළ තම ආයතනයට විවිධ ගැටලූ වලට මුහුණ දීමට සිදුවී ඇති බවත් ඒ සම්බන්ධයෙන් විගණන විමසුම් පවා ලැබී ඇති බවත් මණ්ඩලයේ සභාපතිවරයා අනුකාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය.

19. <u>ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම</u>
<u>(මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය)</u>

පරීක්ෂා කළ දිනය: – 2026 අගෝස්තු 06 දින

<u>පැමිණ සිටි</u>

ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා, පා.ම., (අනු කාරක සභාවේ සභාපති)
ගරු අර්කම් ඉල්යාස් මහතා, පා.ම.,

<u>අනුකාරක සභා සභාපතිවරයාගේ අවසරය මත පැමිණ සිටි</u>

සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.,

<u>සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු</u>

1. <u>ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්</u>

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පූර්ණ අනුබද්ධිත ආයතනයක් වන මෙම සමාගම ශ්‍රී ලංකා මහ බැංකුවේ බලපත්‍රලාභී ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කරවල ආයෝජන, රජයේ සුරැකුම්පත් වෙළෙඳාම සහ ආයෝජන කළඹ හා ද්‍රවශීලතාව කළමනාකරණය කරයි. සේවකයින් 29 දෙනෙකු සහ ක්‍රියාකාරී ගනුදෙනුකරුවන් 1,992 දෙනෙකු සිටින අතර, 2026 වර්ෂයේ ආදායම් වර්ධනය, අවදානම් කළමනාකරණය, පාරිභෝගික පදනම පුළුල් කිරීම සහ තාක්ෂණික පද්ධති වැඩිදියුණු කිරීම අරමුණු කර ඇත.

2. <u>අනුකාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම</u>

- **<u>ආයතනික සැලැස්ම</u>:** වසරක සැලැස්මක් පමණක් තිබීම දිගුකාලීන සැලසුම්කරණයේ අඩුපාඩුවක් බව පෙන්වා දෙන ලදී. ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමඟ අනුබද්ධ කිරීමේ සැලසුම සැලකිල්ලට ගනිමින් ඉදිරි සැලසුම් සකස් කරන බව ආයතනය පැවසීය.
- **<u>වෙළෙඳපොළ හා පාරිභෝගික පදනම</u>:** වෙළෙඳපොළ කොටස හා පාරිභෝගිකයන් වැඩි කිරීමේ අවශ්‍යතාව අවධාරණය විය. සමෘද්ධි බැංකු, ග්‍රාමීය බැංකු හා අධ්‍යාපන සමූපකාර සමිති ඉලක්ක කර දැනටමත් කටයුතු කරන බව ආයතනය පැවසීය.
- **<u>අවදානම් හා මූල්‍ය කාර්යසාධනය</u>:** පොලී අනුපාත වෙනස්වීම් සහ භූදේශපාලනික තත්ත්වයන් හේතුවෙන් වෙළෙඳපොළ අස්ථාවරත්වය හා පාඩු ඇති වූ බව ආයතනය පැහැදිලි කළේය. 2026 ජූලි 31 දිනට

වාර්තා වූ පාඩුව වෙළෙඳපොළ වටිනාකම මත ඇති වූ වාර්තාකරණ පාඩුවක් බවත්, එම තත්ත්වය පසුව වෙනස් වූ බවත් සඳහන් කළේය.

- **කාර්ය මණ්ඩලය:** නව බඳවාගැනීම් තාවකාලිකව නවතා ඇති අතර, බැංකුව සමඟ අනුබද්ධ කිරීමේදී තනතුරු දෙගුණ වීම සහ තරඟකාරීත්වය පිළිබඳව සලකා බලන බව ආයතනය පැවසීය.

3. ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

- **ආදායම් විවිධාංගීකරණය:** ගාස්තු මත පදනම් වූ ආදායම් විවිධාංගීකරණය වී නොමැති අතර, ප්‍රධාන වශයෙන් ප්‍රාථමික අලෙවි කටයුතු සිදු කර ඇත. බැංකුව සමඟ අනුබද්ධ කිරීමේ සැලසුම් සහ දිගුකාලීන පැවැත්ම සැලකිල්ලට ගනිමින් ඉදිරි සැලසුම් සකස් කරන බව ආයතනය පැවසීය.
- **භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය:** ව්‍යාපෘතියේ ප්‍රමාදය හේතුවෙන් සැපයුම්කරුට ගෙවූ රු. මිලියන 53ක මුදල නිෂ්කාර්ය වියදමක් ලෙස හඳුනාගෙන ඇත. නීතිපති උපදෙස් ලබාගෙන සැපයුම්කරුට එන්තරවාසියක් යොමු කිරීමටත්, බැංකුවේ පද්ධතිය භාවිත කිරීමටත් සැලසුම් කර ඇති බව ආයතනය සඳහන් කළේය.
- **දිගුකාලීන සැලසුම්කරණය:** අවම වශයෙන් වසර තුනක හෝ පහක සැලැස්මක් වෙනුවට වසරක සැලැස්මක් පමණක් තිබීම නිරීක්ෂණය විය. බැංකුව සමඟ අනුබද්ධ කිරීමේ ක්‍රියාවලිය සැලකිල්ලට ගනිමින් සැලසුම් සකස් කරන බව ආයතනය පැවසීය.

4. අනුකාරක සභාවේ නියෝග හා නිර්දේශ

1. 2027–2031 කාලසීමාව සඳහා වසර පහක ආයතනික සැලැස්මක් සකස් කිරීම.
2. තරඟකාරීත්වය ඉහළ නංවා වෙළෙඳපොළ කොටස වැඩි කිරීම.
3. ග්‍රාමීය බැංකු, සමෘද්ධි බැංකු සහ අධ්‍යාපන සමූපකාර සමිතිවල පාරිභෝගිකයන් ඉලක්ක කර පාරිභෝගික පදනම පුළුල් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම.
4. ඉදිරිපත් කළ සැලසුම් සඳහා අනුකාරක සභාවේ නිර්දේශ සැලකිල්ලට ගෙන අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම.

20. ශ්‍රී ලංකන් කේටරින් සමාගම
(වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය)

පරීක්ෂා කළ දිනය: 2026 අගෝස්තු 07 දින

පැමිණ සිටි:
ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම. (අනුකාරක සභා සභාපති),
ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.

අනුකාරක සභා සභාපතිවරයාගේ අවසරය මත පැමිණ සිටි
ගරු (නීතිඥ) දයාසිරි ජයසේකර මහතා, පා.ම.,

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

- **පසුබිම සහ මෙහෙයුම් පරාසය:** 1979 දී ආරම්භ වී 1998 සිට ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ 100%ක අනුබද්ධිත සමාගමක් ලෙස ක්‍රියාත්මක වන මෙය, බණ්ඩාරනායක, මත්තල සහ රත්මලාන ජාත්‍යන්තර ගුවන්තොටුපළවල් සඳහා එකම ගුවන්සේවා කේටරින් සපයන්නා වේ. ගුවන්සේවා ආහාර පානවලට අමතරව රෙදි සෝදන සේවා (Aeroclean), සංක්‍රමණ හෝටලය (Serenediva), පැටිසරී සේවා (The Vanilla Pod) සහ ශීත කළ ආහාර සැපයීම සිදු කරයි.
- **සංයුක්ත සැලැස්ම හා මූල්‍ය ඉලක්ක:** 2025/26 මුදල් වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 54.9ක ආදායමක් සහ මිලියන 24.6ක බදු පෙර ලාභයක් ලබා ඇත. දිගුකාලීන ඉලක්ක ලෙස 2030/31 වන විට ආදායම ඇමෙරිකානු ඩොලර් මිලියන 93.2 දක්වා සහ ශුද්ධ ලාභය ඇමෙරිකානු ඩොලර් මිලියන 39.1 දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කරයි.
- **මෙහෙයුම් ධාරිතාව:** දිනකට ආහාර වේල් 30,000ක නිෂ්පාදන ධාරිතාවක් පවතින අතර වර්තමාන භාවිතය 54%කි.

2. කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

- **ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙන් ලැබීමට ඇති හිඟ මුදල්**: ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙන් ලැබීමට ඇති රුපියල් බිලියන 29ක පමණ හිඟ මුදල් සහ ගෙවා නොමැති ලාභාංශ 2027 සහ 2028 වසරවලදී පියවීම සඳහා දෙඅංශයේම අධ්‍යක්ෂ මණ්ඩල මඟින් අනුමත කරන ලද විධිමත් සැලැස්මක් ක්‍රියාත්මක වන බව ආයතනය පැවසීය.

- **<u>ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ ව්‍යාපාරික විවිධාංගීකරණය</u>**: රාජ්‍ය මුදල් කළමනාකරණ පනතේ 32 වන වගන්තිය යටතේ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ එකඟතාව ඇතිව ශ්‍රී ලංකන් කේටරින් සමාගමට විශේෂිත වූ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ මාලාවක් සකස් කර ඇති අතර, මාසයක් ඇතුළත අවසන් අනුමැතිය බලාපොරොත්තු වේ.
- **<u>ආහාර නිෂ්පාදන ධාරිතාව අඩු වීමට හේතු සහ ව්‍යාපාරික විවිධාංගීකරණය</u>:** සමාගමේ පවතින මුළු ආහාර නිෂ්පාදන ධාරිතාවයෙන් දැනට 54%ක් පමණක් භාවිත වන අතර, දිවයිනට පැමිණෙන ගුවන්යානා සංඛ්‍යාව පාලනය කිරීම සමාගමට කළ නොහැකි බාහිර සාධකයක් බැවින් ගුවන්සේවා කේටරින් සේවාවන්ට පමණක් සීමා නොවී ඉන් ඔබ්බට යාමේ උපායමාර්ගික අවශ්‍යතාව හඳුනාගෙන ඇති බව ආයතනය පැවසීය. දේශීය සහ විදේශීය වෙළඳපොළ ඉලක්ක කරගනිමින් සමස්ත ආහාර විසඳුම් සපයන්නෙකු ලෙස ව්‍යාපාරික පරාසය පුළුල් කිරීමට සැලසුම් කරන බව ප්‍රකාශ විය.

3. <u>ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම</u>

- **<u>විගණන නිරීක්ෂණ</u>:** සංස්ථාපිත පත්‍රයේ අරමුණු සහ උපායමාර්ගික සැලැස්ම අතර පවතින ගැටළු, ප්‍රාග්ධන අයවැය ඉලක්ක සම්පූර්ණ කරගැනීමේ අපහසුතා සහ මුදල් වර්ෂය ආරම්භ වීමට පෙර ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම සහ අයවැය ලේඛනය එකවර සකස් කර නොතිබීම යන කරුණු ජාතික විගණන කාර්යාලය පෙන්වා දුන්නේය.

4. <u>අනුකාරක සභාවේ ප්‍රධාන නිර්දේශ</u>

- කලාපීය ගුවන්සේවා සහ සංචාරක මධ්‍යස්ථානයක් ලෙස රටේ අනාගත වර්ධන වැඩපිළිවෙළට අනුකූලව ආයතනික සැලසුම් සකස් කිරීම.
- ශ්‍රී ලංකන් ගුවන් සමාගම මත පමණක් යැපීම අවදානම් සහගත බැවින්, ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්ම සඳහා ව්‍යාපාරික පරාසය කඩිනමින් විවිධාංගීකරණය කිරීම.
- සැපයෙන ආහාරවල ප්‍රමිතිය, රසය සහ මගී තෘප්තිමත්භාවය පිළිබඳව සෘජුවම මගීන්ගෙන් අදහස් විමසීමේ ප්‍රගති සමාලෝචන පද්ධතියක් සකස් කිරීම.
- දේශීය නිෂ්පාදකයින් උනන්දු කරවමින් සපයන්නන්ගේ පදනම පුළුල් කිරීම සහ ආනයන මත යැපීම අවම කිරීමට ක්‍රියා කිරීම.
- ආයතනයේ උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමේදී, සමාගම් සංස්ථාපිත පත්‍රයේ අඩංගු අනෙකුත් අරමුණු පිළිබඳව අවධානය යොමු කිරීම.

21. ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
(මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය)

පරීක්ෂා කළ දිනය: - 2026 අගෝස්තු 07 දින

පැමිණ සිටි:
ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම., (අනුකාරක සහා සභාපති)
ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

- **පසුබිම හා නීතිමය පදනම:** 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනතින් මුලින් රක්ෂණ මණ්ඩලය ලෙස පිහිටුවා, පසුව 2017 දී සිදුවූ සංශෝධන මඟින් රක්ෂණ නියාමන කොමිෂන් සභාව ලෙස නම් කරන ලදී. මෙම කොමිෂන් සභාව යටතේ රක්ෂණ සමාගම් 29ක් සහ තැරැව්කාර සමාගම් 83ක් නිරීක්ෂණය, අධීක්ෂණය හා සංවර්ධනය කරනු ලබයි. රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතීන් ආරක්ෂාකර ගැනීම සඳහා රක්ෂණ කර්මාන්තය විචක්ෂණශීලීව හා වෘත්තීමය වශයෙන් පවත්වාගෙන යාම මෙහි මූලික පරමාර්ථය වේ.
- **සංයුක්ත සැලැස්ම හා ඉලක්ක:** 2026-2028 කාලසීමාව සඳහා රක්ෂණ කර්මාන්තයේ ස්ථාවරභාවය පවත්වා ගැනීම, රක්ෂණ ඔප්පු හිමියන් සවිබල ගැන්වීම සහ ආයතනික සංවර්ධනය යන ප්‍රධාන ඉලක්ක යටතේ සැලසුම් සකසා ඇත. වර්තමාන වෙළඳපොළ විශාලත්වය (රුපියල් බිලියන 385) 2030 වසර වන විට දෙගුණයක් දක්වාත් සහ 2035 වසර වන විට තුන්ගුණයක් දක්වා වර්ධනය කර ගැනීමට අපේක්ෂා කෙරේ.
- **මූල්‍ය කාර්යසාධනය හා අයවැය:** 2026 වසරේ අපේක්ෂිත මුළු ආදායම රුපියල් මිලියන 915.3ක් වන අතර, මුළු වියදම රුපියල් මිලියන 626.4කි. සමස්ත ආදායම රක්ෂණ සමාගම් මඟින් අය කරනු ලබන වාර්ෂික අය කර ගැනීම් මඟින් සපුරා ගනු ලැබේ.

2. කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

- **කාර්ය මණ්ඩල පුරප්පාඩු සහ බඳවා ගැනීම්:** සමස්ත කාර්ය මණ්ඩල තනතුරු 80කින් තනතුරු 20ක් පමණ පුරප්පාඩු පවතින බවත්, අදාළ අනුමැතීන් ලබා ගනිමින් එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරමින් සිටින බවත් ආයතනය පැවසීය. සංඛ්‍යා විද්‍යාඥ (actuary) තනතුර සඳහා

මෙරට පළපුරුදු පුද්ගලයින් හිඟ වීම නිසා ඉන්දීය සංඛ්‍යා විද්‍යාඥයින් දෙදෙනෙකුගේ සේවය ලබා ගත් බව සඳහන් කළේය.

- **<u>පාරිභෝගික දැනුවත් කිරීම සහ නව රක්ෂණාවරණ</u>:** වැඩිවන වයස්ගත ජනගහනය සඳහා වැඩිහිටි රැකවරණ රක්ෂණ සහ ආපදා කළමනාකරණය සඳහා අරමුදලක් පිහිටුවීම සම්බන්ධයෙන් මහ බැංකුව හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමඟ සාකච්ඡා කරමින් පවතින බව ආයතනය පැවසීය. රක්ෂණය පාසල් පෙළපොත්වලට (6 ශ්‍රේණියේ සිට සහ ව්‍යවසායකත්වය සහ මූල්‍ය සාක්ෂරතාව යන විෂය යටතේ) ඇතුළත් කිරීමට ජාතික අධ්‍යාපන ආයතනය සමඟ සාකච්ඡා කරමින් සිටී.
- **<u>වාහන රක්ෂණ ඩිජිටල්කරණය සහ තොරතුරු වාර්තාකරණය</u>:** මෙරට පවතින මිලියන 8.8ක් පමණ වන වාහනවලින් රක්ෂණය කර ඇත්තේ මිලියන 6ක් පමණ වන අතර, එම තත්ත්වය මැන බැලීම සඳහා ඩිජිටල් පද්ධතියක් නිර්මාණය කර ඇති බව කොමිෂන් සභාව පැවසීය. එමෙන්ම, රක්ෂණ නියාමන ආයතනය ලෙස රක්ෂණාවරණ වර්ග වශයෙන් වෙන් වෙන්ව වාර්තා නොකිරීම සහ ගෙවීම් පැහැර හැරීම් ප්‍රතිශතාත්මකව නොදැක්වීම පිළිබඳව කාරක සභාව විමසූ අතර, ඊට පිළිතුරු ලෙස පැමිණිලි සම්බන්ධයෙන් සියලු සමාගම් ඒකාබද්ධ වන ඩිජිටල් පද්ධතියක් සකස් කරමින් පවතින බව නිලධාරීහු පැහැදිලි කළහ.

3. <u>ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම්</u>

- **<u>විගණන නිරීක්ෂණ</u>:** පරීක්ෂා කිරීමේ අංශය අපේක්ෂිත මට්ටමට වඩා අඩු ආයතන සංඛ්‍යාවක් පරීක්ෂා කර තිබීම, සෙස් බද්දෙන් ලැබෙන ආදායම Policy Holder Protection Fund සඳහා යොදවා තිබුණද එම අරමුදලේ මුදල් තවමත් භාවිතයට නොගැනීම සහ සංඛ්‍යා විද්‍යාඥ තනතුර බාහිරව ලබා ගැනීම යන කරුණු ජාතික විගණන කාර්යාලය පෙන්වා දුන්නේය.

4. <u>අනුකාරක සභාවේ ප්‍රධාන නිර්දේශ</u>

- ඉදිරි සැලසුම් යටතේ සිදු කිරීමට නියමිත දැනුවත් කිරීමේ හා පරීක්ෂා කිරීමේ වැඩසටහන්වල සංඛ්‍යාත්මක දත්ත ඉදිරිපත් කිරීම.
- පාසල් අධ්‍යාපනයට සහ විෂයමාලාවලට රක්ෂණය පිළිබඳ සංකල්ප සහ මූල්‍ය සාක්ෂරතාව ඇතුළත් කිරීමේ කටයුතු කඩිනම් කිරීම.
- ආයතනයේ පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු කඩිනමින් පිරවීම මඟින් අධීක්ෂණ අංශය පුළුල් කර නියාමන කටයුතු විධිමත් කිරීම.
- රක්ෂණ සමාගම් නියාමනය සහ පාරිභෝගික පැමිණිලි විමර්ශනය කිරීම සඳහා නවීන ඩිජිටල් පද්ධති කඩිනමින් ක්‍රියාත්මක කිරීම

22. සීමාසහිත ලංකා පොහොර සමාගම
(කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය)

පරීක්ෂා කළ දිනය: 2026 අගෝස්තු 18 දින

පැමිණ සිටි:
ගරු සුජීව දිසානායක මහතා (අනුකාරක සභා සභාපති), පා.ම.,
ගරු රුවන් මාපලගම මහතා, පා.ම.

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

- **පසුබිම හා ව්‍යුහාත්මක සංවර්ධනය:** 1872 දී ඇරඹුණු කොළඹ කොමර්ෂල් පොහොර සමාගම සහ 1964 දී ඇරඹුණු ලංකා පොහොර සංස්ථාව 2024 වසරේදී ඒකාබද්ධ කර සීමාසහිත ලංකා පොහොර සමාගම ලෙස ස්ථාපිත කරන ලදී. සමාගම සතුව වතුකරයේ ප්‍රචලිත 'කොමර්ෂල්' සහ වී වගාවට ප්‍රචලිත 'ලක් පොහොර' යන ප්‍රධාන සන්නාම දෙක පවතී. දිවයිනේ දළ වාර්ෂික පොහොර පරිභෝජනය මෙට්‍රික් ටොන් ලක්ෂ 5ක් වන අතර, සමාගමේ වෙළඳපොළ කොටස 8% සිට 13% දක්වා වර්ධනය කරගෙන ඇත.

- **ක්‍රමෝපායික සැලැස්ම හා මූල්‍ය ඉලක්ක:** සමාගම විසින් 5 Ps (Prosperity, People, Purity, Partnership, Policy) මත පදනම් වූ වසර 5ක සැලැස්මක් සකස් කර ඇති අතර, 2026 අයවැයගත ආදායම රුපියල් බිලියන 8.3ක් වේ. ඉදිරි වසර 3 ඇතුළත වෙළඳපොළ කොටස 20% දක්වාත්, ආදායම රුපියල් බිලියන 16.9 දක්වාත්, බදු පෙර ලාභය රුපියල් බිලියන 1 දක්වාත් දෙගුණ කිරීමට ඉලක්ක කර ඇත.

- **නවෝත්පාදන හා මෙහෙයුම් විශිෂ්ටත්වය:** යූරියා භාවිතය 25%කින් අඩු කළ හැකි Coated Urea හඳුන්වා දීමටත්, ගබඩා පියැසිවල සූර්ය බලශක්ති ව්‍යාපෘති ආරම්භ කිරීමටත් සැලසුම් කර ඇත. මීට අමතරව ISO 9001 සහ ISO 14001 ප්‍රමිති සහතික ලබා ගැනීමටත්, කොළඹ කොමර්ෂල් සමාගමේ ERP පද්ධතිය ඉදිරියටත් භාවිත කිරීමටත් කටයුතු යොදා ඇත.

2. කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම්

- **මිල ස්ථායීකරණය හා තාක්ෂණික අලෙවිය:** යූරියා කිලෝග්‍රෑම් 50 මල්ලක මිල රුපියල් 12,500 සිට 10,200 දක්වා අඩු කරමින් වෙළඳපොළ මිල පාලනය කිරීමට සමාගම මැදිහත් වී ඇති බවත්, සාමාන්‍ය අලෙවිය

වෙනුවට ගොවීන්ට අවශ්‍ය කෘෂිකාර්මික උපදෙස් ලබා දීම සඳහා තාක්ෂණික අලෙවිකරණ කණ්ඩායමක් ක්ෂේත්‍රයට යෙදවීමට පියවර ගෙන ඇති බවත් ආයතනය පැවසීය.

- **<u>ප්‍රාදේශීය ගබඩා හා දේශීය නිෂ්පාදනය:</u>** අලෙවි ප්‍රමාණය අඩු භාවිත නොවන ප්‍රාදේශීය ගබඩා 5ක් අලෙවි මධ්‍යස්ථාන බවට පරිවර්තනය කිරීමට හා බදු දීමට කටයුතු කර ඇති බවත්, එප්පාවල පොස්පේට් මඟින් SSP පොහොර නිෂ්පාදනයටත්, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නැප්තා අතුරු නිෂ්පාදනයෙන් යූරියා නිෂ්පාදනයටත් සාකච්ඡා පවත්වනු ලබන බවත් ආයතනය පැවසීය. තවද, දැනට පවතින සේවක පුරප්පාඩු 18ක් පිරවීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති බව ආයතනය පැවසීය.

3. <u>ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම</u>

- **<u>සැලසුම්කරණ සහ විගණන අඩුපාඩු:</u>** සමාගමේ 2030 දක්වා වූ සංයුක්ත සැලැස්ම තුළ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) ඇතුළත් නොවීම, 2027-2029 වසර සඳහා මුදල් ප්‍රවාහ හා අයවැය වෙන් කර නොමැති වීම, KPIs SMART මට්ටමේ නොවීම සහ ප්‍රසම්පාදන සැලසුම්වල නොගැලපීම් (රුපියල් මිලියන 20ක පරීක්ෂණ උපකරණ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් නොවීම) පවතින බව නියෝජ්‍ය විගණකාධිපති විසින් පෙන්වා දෙන ලදී.

4. <u>කාරක සභාවේ ප්‍රධාන නිර්දේශ</u>

2030 දක්වා වූ සංයුක්ත සැලැස්මේ සහ ක්‍රියාකාරී සැලැස්මේ පවතින සියලුම අඩුපාඩු ජාතික විගණන කාර්යාලය සමඟ සාකච්ඡා කර, ප්‍රමාණාත්මක මාසික ඉලක්ක සහ SMART කාර්යසාධක දර්ශක (KPIs) ඇතුළත් කරමින් නොපමවා යාවත්කාලීන කොට නිවැරදි කරගැනීමට නිර්දේශ කරන ලදී.

23. සීමාසහිත මිල්කෝ පෞද්ගලික සමාගම
(කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දිනය: 2026 අගෝස්තු 18 දින

පැමිණ සිටි:
ගරු සුජීව දිසානායක මහතා (අනුකාරක සභා සභාපති), පා.ම.,
ගරු රුවන් මාපලගම මහතා, පා.ම.

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

- **පසුබිම හා යටිතල පහසුකම්:** 1956 දී ජාතික කිරි මණ්ඩලය ලෙස ඇරඹුණු මිල්කෝ සමාගම සතුව නාරහේන්පිට, දිගන, පොළොන්නරුව සහ අඹේවෙල යන ප්‍රදේශවල දෛනික සැකසුම් ධාරිතාව ලීටර 475,000ක් වන කර්මාන්තශාලා 4ක් පවතී. කිරි එකතු කිරීම සඳහා කිරි සිසිල් කිරීමේ මධ්‍යස්ථාන 96ක් සහ ගොවි සමිති 168ක් ක්‍රියාත්මක වේ.

- **මූල්‍ය හැරවුම හා ජයග්‍රහණ:** පසුගිය වසරවල පැවති අඛණ්ඩ පාඩු මහහරවා ගනිමින් 2025 වසරේදී රුපියල් බිලියන 1.4ක ශුද්ධ ලාභයක් වාර්තා කිරීමට සමාගම සමත්ව ඇත. සියලුම බැංකු අයිරා සහ ලීසිං වාරික සම්පූර්ණයෙන්ම ගෙවා නිම කරමින් මසකට රුපියල් මිලියන 20ක් වූ මූල්‍ය පිරිවැය ශූන්‍ය කර ඇත. සේවකයන් සඳහා රුපියල් 75,000ක දිරි දීමනාවක් ද, කිරි ලීටරයකට රුපියල් 4 බැගින් ගොවීන් වෙනුවෙන් රුපියල් මිලියන 180ක බෝනස් මුදලක් ද බෙදා දී ඇත.

- **ඉදිරි මූල්‍ය හා මෙහෙයුම් ඉලක්ක (2026-2030):** ආදායම 2026 දී රුපියල් බිලියන 25 සිට 2030 දී රුපියල් බිලියන 39 දක්වා වර්ධනය කිරීමට අපේක්ෂිතය. 2026 වර්ෂය සඳහා රුපියල් මිලියන 2,476ක ශුද්ධ ලාභයක් ඉලක්ක කර ඇති අතර, මුල් මාස 6 තුළ පමණක් රුපියල් බිලියන 1කට ආසන්න දළ ලාභයක් ලබා ඇත. අලුතින් සිල්ලර වෙළඳසැල් 15,000ක් එකතු කර ගැනීමටත්, බඩල්ගම නවීන කර්මාන්තශාලාව හරහා අලුත් නිෂ්පාදන 10ක් හඳුන්වා දීමටත් සැලසුම් කර ඇත.

2. කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

- **මානව සම්පත් හා පරිපාලන අභියෝග:** සමාගම අනුමත සේවක සංඛ්‍යාවට වඩා 300-400ක පමණ කාර්ය මණ්ඩල ඌනතාවයකින් යුතුව ක්‍රියාත්මක

වන බවත්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරු 3ම පුරප්පාඩුව පවතින අතර කළමනාකාර තනතුරුවලින් 75%ක්ම ආවරණ පදනම මත පවතින බවත්, අභ්‍යන්තර බඳවා ගැනීම් හරහා මෙම පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු යොදා ඇති බවත් ආයතනය පැවසීය.

- **<u>කිරි එකතු කිරීම සහ ගොවි සුබසාධනය</u>:** එල් නිනෝ දේශගුණික බලපෑම සහ පෞද්ගලික අංශයේ තරඟකාරීත්වය හමුවේ කිරි සැපයුම ආරක්ෂා කර ගැනීමට අලුතින් ගොවි සමිති 129ක් සහ කිරි එකතු කිරීමේ මාර්ග 25ක් පිහිටුවීමට පියවර ගෙන ඇති බවත්, ගොවීන් උදෙසා විශේෂ රක්ෂණ ක්‍රම, ශිෂ්‍යත්ව අරමුදල් සහ ජංගම පශු වෛද්‍ය සායන ක්‍රියාත්මක වන බවත් ආයතනය පැවසීය.

- **<u>කර්මාන්තශාලා ධාරිතාව හා වෙළඳපොළ යාවත්කාලීන කිරීම්</u>:** සමාගමේ සමස්ත දෛනික සැකසුම් ධාරිතාව ලීටර මිලියන 243ක් වුවද, දේශීය සමස්ත කිරි නිෂ්පාදනය ලීටර මිලියන 370කට සීමා වීම සහ වෙළඳපොළේ සමාගම් 28ක් සමඟ තරඟකාරීත්වය හේතුවෙන් සැබෑ එකතු කිරීම ලීටර මිලියන 70-86 සීමාවේ පවතින බවත්, සුපිරි වෙළඳසැල් ජාලය පුළුල් කිරීමෙන් සහ නගර මට්ටමින් වරලත් අලෙවිසැල් (Franchise Outlets) පිහිටුවීමෙන් මුදල් ප්‍රවාහයන් ශක්තිමත් කිරීමට පියවර ගෙන ඇති බවත් සමාගම පැවසීය.

3. <u>ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම</u>

- **<u>සැලසුම්කරණ සහ විගණන අඩුපාඩු</u>:** ඉන්දියාවේ අමුල් සමාගමට පැවරීමේ කැබිනට් තීරණය හේතුවෙන් පසුගිය වසරවල බඳවා ගැනීම් සහ ප්‍රාග්ධන වියදම් අත්හිටුවා තිබීම හේතුවෙන්, 2021න් පසු යාවත්කාලීන කර නොතිබූ පැරණි මූල්‍ය ප්‍රකාශන (2022, 2023, 2024) කඩිනමින් සකස් කර අවසන් කිරීමට මූල්‍ය අංශයට ප්‍රමුඛතාව දීමට සිදු වූ බැවින් බාහිර පර්යේෂණ වෙනුවට අභ්‍යන්තර දත්ත පදනම් කරගෙන සංයුක්ත සැලැස්ම සකස් කිරීමට සිදුවී ඇති බව ආයතනය පැවසීය. තිරසාර සංවර්ධන ඉලක්ක (SDG 17) ඇතුළත් නොවීම, මුදල් ප්‍රවාහ හා ප්‍රසම්පාදන සැලසුම් අතර අන්තර්-සම්බන්ධතාවක් නොමැති වීම ආදි අඩුපාඩු නියෝජ්‍ය විගණකාධිපති විසින් පෙන්වා දෙන ලදී.

4. <u>කාරක සභා නිර්දේශ</u>

ජාතික විගණන කාර්යාලය මඟින් ඉදිරිපත් කළ නිරීක්ෂණද සැලැසුම්වලට ඇතුළත් කරමින්, වඩාත් ගුණාත්මක සහ විධිමත් ඉදිරි පස් අවුරුදු සංයුක්ත සැලැස්මක් සකස් කිරීමට කටයුතු කිරීම

24. ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය *(කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය)*

පරීක්ෂා කරන ලද දිනය: 2026 අගෝස්තු 18 දින

පැමිණි සිටි
ගරු නීතීඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය, පා.ම.,(අනුකාරක සභා සභාපති)
ගරු සුදත් බලගල්ල මහතා, පා.ම.,

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනයේ විෂය පථය

ව්‍යාපෘති සඳහා ශක්‍යතා වාර්තා, සැලසුම්, නිර්මාණ සහ ඇස්තමේන්තු සකස් කිරීම හා එම ව්‍යාපෘති සඳහා වන විමර්ශන, අධ්‍යයන සහ පර්යේෂණ සිදු කිරීම, ව්‍යාපෘති කළමනාකරණය හා අධීක්ෂණය, ඉංජිනේරු සහ තාක්ෂණික කාර්ය මණ්ඩලය පුහුණු කිරීම, ඉංජිනේරු සහ වාස්තු විද්‍යාත්මක උපදේශන සේවා මෙන්ම EPC (Engineering, Procument, Consultancy) ඉදිකිරීම් සේවා සැපයීම සඳහා හවුල් ව්‍යාපාර (JVs) සහ සීමිත වගකීම් සහිත සමාගම් පිහිටුවීම හා BOT සහ BOO ව්‍යාපෘතිවල ආයෝජන යනාදී කාර්යයන් ආයතනය විසින් සිදු කරනු ලබයි.

2. අනුකාරක සභාවේ පරීක්ෂාව

2.1 **වෙනත් රජයේ ආයතනවලින් ලැබිය යුතු මුදල්:** CECB ආයතනය රජයෙන් කිසිදු ප්‍රතිපාදනයක් නොලබන, සම්පූර්ණයෙන්ම ස්වයං මූල්‍යකරණය වන ආයතනයකි. වෙනත් රජයේ ආයතනවලින් CECB ආයතනයට අයවිය යුතු සමස්ත හිඟ මුදල රුපියල් බිලියන 4.5ක් පමණ වේ. මේ අතරින් රු. බිලියන 2කට අධික මුදලක් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් (Ministry of Health) අය වීමට ඇති බවත් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයෙන් රුපියල් මිලියන 216ක් සහ රාජ්‍ය පරිපාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් රුපියල් මිලියන 240ක මුදලක් අයවීමට ඇති බවත් ප්‍රකාශ විය.

මෙම හිඟ මුදල් ලැබීමේ ප්‍රමාදය හේතුවෙන් ආයතනයේ ක්‍රියාකාරී ප්‍රාග්ධනයට (Working Capital) බරපතල බලපෑම් එල්ල වී ඇති අතර, නිමකළ වැඩ (work done) ලෙස වාර්තා වී තිබීම හේතුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) බදු මුදල් අයකර ගැනීමට

කටයුතු කිරීම හේතුවෙන් ආයතනයේ බැංකු ගිණුම් අත්හිටුවීමට (freeze කිරීමට) පවා සිදුවූ අතර මේ හේතුවෙන් දැඩි මූල්‍ය අපහසුතාවලට මුහුණ දීමට සිදුවී ඇති බවට සඳහන් විය.

2023 වසරේදී ජනාධිපති කාර්යාලයේ මැදිහත්වීම මත සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ රුපියල් මිලියන 540ක පමණ එකඟතාවයකට (settlement) පැමිණ ඇති අතර එම මුදල් දැනට ලැබෙමින් පවතින බව සඳහන් විය.

2.2. **<u>ණය මුදල් එකතු වූ කාල සීමාව සහ ලැබීම් ප්‍රමාද වීමට හේතු:</u>**
මෙම හිඟ මුදල් 2002 වසරේ සිට සමුච්චිත වූ ඒවා වන අතර, 2014 වසරෙන් පසුව පමණක් බිලියන 1.4ක හිඟ මුදලක් පවතින බව සඳහන් විය. මෙම ගනුදෙනු රජයේ ආයතන අතර සිදුවන ගනුදෙනු බැවින් ප්‍රමාදයන් සඳහා පොලී අය කිරීමට (claiming interest) හෝ නඩු පැවරීමට නීතිමය හැකියාවක් නොමැති බවත් පැරණි ව්‍යාපෘති සම්බන්ධයෙන් ඇතැම් ලේඛන නොමැති වීම හේතුවෙන් ණය සහතික කර (certify) ලබාගැනීම ප්‍රායෝගිකව අපහසු වී ඇති බවත් අනුකාරක සභාවට අනාවරණය විය.

2.3 **<u>පෞද්ගලික අංශයේ හිඟ මුදල්:</u>** පෞද්ගලික අංශයෙන් අයවිය යුත්තේ රුපියල් මිලියන 53ක පමණ මුදලක් වන අතර, ඉන් බහුතරයක් කුඩා ජල විදුලි ව්‍යාපෘති (mini-hydro companies) ආශ්‍රිතව පවතින ගැටලු සහගත ණය වන බවද ඒවා අයකර ගැනීම සඳහා ද මේ වන විට පියවර ගනිමින් පවතින බව සඳහන් විය.

2.4 **<u>වැඩ අවසන් කළත් සහතික නොකළ බිල්පත්</u>** : ලැබිය යුතු යැයි වැඩ අවසන් කළ (work done) ලෙස වාර්තා කළත්, සහතික කර නොමැති විශාල බිල්පත් ප්‍රමාණයක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය වී ඇති බව අනුකාරක සභාව නිරීක්ෂණය කළාය.

මෙම ගැටලුව මහහරවා ගැනීමට මධ්‍යගත නියාමන ක්‍රමවේදයක් (Centralized Monitoring Mechanism) ස්ථාපනය කර ඇති අතර, එමඟින් මාසිකව ප්‍රගතිය හා බිල්පත් සහතික කිරීම් නිරීක්ෂණය කරන බවත් සඳහන් විය.

2.5. **<u>CECB ආයතනයේ අනුබද්ධිත ආයතනයක් වන CESL ආයතනයේ පාලනය සහ තරඟකාරීත්වය:</u>**
CESL ආයතනය අනුබද්ධිත ආයතනයක් ලෙස ක්‍රියාත්මක වීමේදී එහි පාලනය සිදුවන්නේ කෙසේද යන්න හා එමගින් ආයතන දෙක

අතර තරඟයක් ඇතිවීමට ඇති අවකාශය පිළිබඳව අනුකාරක සභාවේ අවධානය යොමු විය.

අනුකාරක සභාව හමුවේ පහත කරුණු ඉදිරිපත් විය.

- CESL යනු CECBට 100% කොටස් හිමි අනුබද්ධ ආයතනයකි.
- CESL හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 7 දෙනාගෙන් තිදෙනෙකුම CECB නියෝජනය කරන අතර, CECB හි වත්මන් සභාපතිවරයා සහ සාමාන්‍යාධිකාරීවරයා CESL අධ්‍යක්ෂ මණ්ඩලයේ ද සාමාජිකයින් වේ.
- ආයතන දෙක අතර තරඟයක් නොමැති බව හා ආයතන අතර මනා අවබෝධතාවයක් පවතී. CECB උපදේශන හා සැලසුම් (Consultancy & Design) පමණක් සිදුකරන අතර, CESL ඉදිකිරීම් කටයුතු (Construction) සිදුකරයි. CESL ලබාගන්නා ඉදිකිරීම් ව්‍යාපෘතිවල සැලසුම් (design component) සඳහා වන ආදායම ද CECB වෙත හිමිවේ.
- EPC (Design & Build) ව්‍යාපෘති ක්‍රමයෙන් ශූන්‍ය (Zero Liability) කර, ඉදිකිරීම් සම්පූර්ණයෙන්ම CESL වෙත පවරා CECB උපදේශන අංශයට පමණක් සීමා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්තියක් වශයෙන් සිදුකිරීමට නියමිත බව.

2.6. <u>**වත්කම් පැවරීම සහ අනුබද්ධ ආයතන පාලන ප්‍රතිපත්තිය:**</u> CESL වෙත වත්කම් පැවරීම පිළිබඳ නිසි උපායමාර්ගයක් සැලැස්ම තුළ නොමැති බවත් එමෙන්ම යහපාලන මාර්ගෝපදේශ (Good Governance Guidelines) අනුව අනුබද්ධ ආයතන පාලන ප්‍රතිපත්තියක් (Subsidiary Reviewing Policy) තවමත් සකස් කර නොමැති බවත් අනුකාරක සභාව නිරීක්ෂණය කළාය.

වත්කම් හා වගකීම් පැවරීමේදී පැරණි ගිවිසුම් අවසන් කර ක්‍රමයෙන් නව ක්‍රමවේදයට මාරු වීමට නියමිත බවත් අනුබද්ධ ආයතන පාලන ප්‍රතිපත්තියක් (Subsidiary Governing Policy Framework) සකස් කිරීම සඳහා දැනටමත් විශේෂ කමිටුවක් පත් කර ඇති අතර, නව අධ්‍යක්ෂ මණ්ඩලයේ මැදිහත්වීමෙන් එය කඩිනමින් අවසන් කර නුදුරේදීම ක්‍රියාවට නැංවීමට කටයුතු කරමින් සිටින බවත් ප්‍රකාශ විය.

මීට අමතරව ආයතනයේ කාර්ය සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා කාර්ය සාධන දර්ශක පද්ධතියක් (KPI System) හඳුන්වා දීමටද අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරමින් සිටින බව සඳහන් විය.

2.7. <u>**උපායමාර්ගික සැලැස්ම ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම**</u>

මූල්‍ය වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර උපායමාර්ගික සැලැස්ම අනුමත කරගත යුතු වුවත්, CECB ආයතනයේ සැලැස්ම භාණ්ඩාගාරයට සහ අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීමට අගෝස්තු 07 වනදා දක්වා ප්‍රමාද වී තිබුණි.

2020-2025 කාලය තුළ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් මෙන්ම එම කාලය තුළ අධ්‍යක්ෂ මණ්ඩල (Boards) 4ක් පමණ මාරුවීම හේතුවෙන් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම ප්‍රමාද වූ බවත් වර්තමාන ස්ථාවර අධ්‍යක්ෂ මණ්ඩලය 2024 වසර මුල් භාගයේදී පත් වූ අතර, ඔවුන් සමඟ සාකච්ඡා කර 2026-2030 සඳහා වන නව සැලැස්ම 2026 මාර්තු/අප්‍රේල් වන විට අවසන් කර මෘදු පිටපත් (Soft Copies) අදාළ අංශවලට යොමු කර ඇති බවත් දෘඪ පිටපත් (Hard copies) ඉදිරිපත් කිරීමේදී අගෝස්තු දක්වා ප්‍රමාදයක් සිදු වී ඇති බවත් ආයතනික අතිරේක සාමාන්‍යාධිකාරී (සැලසුම්) ප්‍රකාශ කළේය.

2.8. <u>**විවිධ ප්‍රදේශවල වත්කම් (යන්ත්‍රෝපකරණ) භාවිතයෙන් තොරව විනාශ වීමට ඉඩහැරීම:**</u> බදුල්ල, මහියංගනය, කොත්මලේ වැනි ප්‍රදේශවල CECB සතු රුපියල් කෝටි ගණනක් වටිනා වත්කම් (උදා: විශාල ජෙනරේටර්, වාහන, බැකෝ යන්ත්‍ර) කිසිදු නඩත්තුවක් නොමැතිව කැලෑ වැදිමින් විනාශ වීමට ඉඩ හැර තිබුණි. පදියතලාව ප්‍රදේශයේ බැකෝ යන්ත්‍රයක් කැලෑවක දමා ගොස් තිබෙන බව ද නිරීක්ෂණය විය.

2.9 <u>**වැඩබලන මූල්‍ය සාමාන්‍යාධිකාරී තනතුර:**</u> වැඩබලන මූල්‍ය සාමාන්‍යාධිකාරී (Acting DGM Finance) තනතුර ස්ථිර නොකර දිගින් දිගටම වැඩබලන තනතුරක් ලෙස පවත්වාගෙන ගොස් තිබුණි.

එම තනතුර සඳහා සුදුසුකම් සපුරාලූ අය බඳවා ගැනීමට අවස්ථා කිහිපයකදීම අයදුම්පත් කැඳවුවද සුදුසු අයෙකු තෝරා ගැනීමට නොහැකි වී තිබූ බැවින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව වැඩබැලීම සඳහා වර්තමානයේ වැ.බ තනතුරෙහි කටයුතු කරන නිලධාරිනියට අවස්ථාව ලබා දී ඇති බව සඳහන් විය. 2026 ජූනි මාසය වන විට ඇය සපුරාලිය යුතු අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇති බැවින් එම නිලධාරිනියව එකී තනතුරෙහි ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය (Interview Panel) පත්කර ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බවට ප්‍රකාශ විය.

2.10 <u>**අධ්‍යක්ෂ මණ්ඩලයේ වියුහය:**</u> අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් 7 දෙනෙකු සිටිය යුතු අතර දැනට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 7 දෙනාම සිටින බව සඳහන් විය.

3. <u>**අනුකාරක සභාවේ නිර්දේශ**</u>

- නියමිත කාලසීමාව තුළ සැලසුම් ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම සහ ඉදිරියේදී සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීමට කටයුතු කිරීම.
- භාවිතයෙන් තොර වත්කම් හා යන්ත්‍රෝපකරණ නිසි පරිදි කළමනාකරණය කිරීම.
- පදියතලාව ප්‍රදේශයේ අතහැර ගොස් ඇති බැකෝ යන්ත්‍රය පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීම.
- ජාතික විගණන කාර්යාලයේ සහ භාණ්ඩාගාරයේ නිරීක්ෂණ ද සැලකිල්ලට ගනිමින්, අවශ්‍ය තරහකාරීත්වය සහිතව ඉංජිනේරුමය අංශයේ විශිෂ්ටත්වය කරා ළඟා වීමට සහ රටේ පොදු මහජනතාව වෙනුවෙන් කාර්යක්ෂම සේවාවක් සැපයීමට පියවර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම

25. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
(කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්, හා වාර්මාර්ග අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දිනය- 2026 අගෝස්තු 18 දින

පැමිණ සිටි
ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය, පා.ම.,(සභාපති)
ගරු සුදත් බලගල්ල මහතා, පා.ම.,

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනය පිහිටුවීම, බලතල හා කාර්යභාරය

1979 අංක 23 දරන පනත මගින් ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන අධිකාරිය ස්ථාපිත කර ඇති අතර එකී පනත මගින් බලතල හා කර්තව්‍යයන් 7ක් නියම කර ඇත.

2. අනුකාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

2.1 **සංයුක්ත සැලැස්ම (Corporate Plan) අනුමැතිය ප්‍රමාද වීම:** 2025-2029 වර්ෂයන් සඳහා ඉදිරිපත් කර ඇති සංයුක්ත සැලැස්ම 2025.09.30 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමුකර ඇත . 2026-2030 සංයුක්ත සැලැස්ම 2026.08.12 දින අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඇත. මහවැලි අධිකාරිය ප්‍රතිසංවිධානය (restructuring) කිරීමට අදාළව රජය මගින් තීරණයක් ගෙන තිබූ නමුත් 2027 වසරේ සැලසුම් ද සකස් කර ඇත.

2.2 SWOT විශ්ලේෂණය: මේ මගින් හඳුනාගෙන ඇති ආයතනික දුර්වලතා සහ තර්ජන මඟහරවා ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග ලෙස **ආයතන** ප්‍රතිසංවිධානය, සංචාරක ව්‍යාපෘති ප්‍රවර්ධනය, ඉඩම් කළමනාකරණය, පැරණි ගොඩනැගිලි හා සම්පත් කළමනාකරණය මගින් ආදායම් උත්පාදනය, මානව සම්පත් හිඟය සඳහා ස්ථීර පදනමින් සේවකයින් බඳවා ගැනීමට කටයුතු කර ඇත.

2.3 "ක්‍රියාකාරී සැලැස්ම (Action Plan) සහ ප්‍රසම්පාදන සැලැස්ම (Procurement Plan) සාරාංශගත කිරීම: මහවැලි කලාප 10ට අදාළව පිටු 465ක සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පවතින බව නිරීක්ෂණ විය මෙම සැලසුම් සියල්ල සාරාංශගත කර, මධ්‍යගත (Centralized) එකම සැලැස්මක් (ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම) ලෙස සකස් කිරීම යෝග්‍ය බව පෙන්වා දෙන ලදී.

2.4 **<u>වත්කම් නිසි පරිදි තක්සේරු කර ගිණුම්ගත නොකිරීම:</u>** මහවැලි අධිකාරිය සතුව හෙක්ටයාර 609,029ක ශුද්ධ ඉඩම් ප්‍රමාණයක් තිබුණද ආයෝජන ඉඩම් ලෙස ශේෂ පත්‍රයට ඇතුළත් කර ඇත්තේ රුපියල් බිලියන 3ක් (හෙක්ටයාර් 5154ක භූමි ප්‍රමණයක්) වටිනා ඉඩම් පමණි. එමෙන්ම අනෙකුත් කාර්යාල ගොඩනැගිලි, සම්මන්ත්‍රණ ශාලා, ගොවිපොළවල්, පැල තවාන් වැනි වත්කම් (හෙක්ටයාර 678.09ක්) නිසි පරිදි තක්සේරු කර ගිණුම් ගත කර නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

2.5 **<u>සැලසුම් සහ අයවැය මූල්‍ය වර්ෂය ආරම්භ වීමට පෙර ඉදිරිපත් නොකිරීම</u>** 2021 නොවැම්බර් 17 දිනැති අංක 1/2021 චක්‍රලේඛයේ රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලන මාර්ගෝපදේශ අනුව සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සහ අයවැය, මූල්‍ය වර්ෂය ආරම්භ වීමට පෙර අනුමැතිය සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත හෝ රේඛීය අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවසාය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි.

2.6 **<u>නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම:</u>** ඩිජිටල්කරණ වැඩසටහන යටතේ මහවැලි අධිකාරිය තුළ විශේෂ ඒකකයක් පිහිටුවා ඇති අතර, වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබුණි.

2.7 **<u>ගොඩනැගිලි හා සම්පත් ඌන උපයෝජනය :</u>**ඌන උපයෝජිත ගොඩනැගිලි හා සම්පත් වලින් නිසි ඵල නෙලා ගැනීම සිදු කළ යුතු බව අවධාරණය විය. සංචාරක බංගලා සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන කිරීමට අවශ්‍ය නම් ඒ පිළිබඳව අමාත්‍ය මණ්ඩල මැදිහත්වීමෙන් අවශ්‍ය සහාය දැක්විය හැකි බව අනුකාරක සභාව ප්‍රකාශ කළාය.

2.8 **<u>ප්‍රජා ශක්ති වැඩසටහන :</u>**"ප්‍රජාශක්ති" වැඩසටහන සඳහා මුලදී ජනාධිපති ලේකම් කාර්යාලයෙන් නිකුත් කළ ප්‍රජාශක්ති චක්‍රලේඛයේ මහවැලි නිලධාරීන් ඇතුළත් කර නොතිබුණි. මෑතකදී සිදුකළ සංශෝධනයෙන් පසු සියලුම ඒකක කළමනාකරුවන්ට අනිවාර්යයෙන්ම ඊට සහභාගී වන ලෙස උපදෙස් දී තිබුණි. මහවැලි සංවර්ධන කමිටුව පිහිටුවා ඇති අතර එහිදී මහජන නියෝජිතයින්ගේ යෝජනා හා අදහස් ලබා ගැනීමට අපේක්ෂා කරයි.

2.9 **<u>ව්‍යවසායකයන්ට සහය නොලැබීමේ චෝදනා :</u>** මහවැලි අධිකාරියෙන් ඉඩම් වෙන්කරවා ගැනීම ඇතුළු කටයුතුවලදී නිසි

සහයෝගයක් ප්‍රදේශයේ ව්‍යවසායකයින්ට නොලැබෙන බවට චෝදනා එල්ලවන බව නිරීක්ෂණය විය.

2.10. <u>**අලිවැටවල් ඉදිකිරීම සහ ප්‍රගතිය:**</u> සැලැස්මේ අලිවැට කිලෝමීටර් 50ක් ලෙස දක්වා ඇතත් ප්‍රගතිය කිලෝමීටර් 8ක් ලෙස පෙන්නුම් කරයි. ගල්ගමුව/මීගලෑව (කත්නෝරුව) වැනි දැඩි අලි තර්ජන පවතින ප්‍රදේශවල අලිවැට ඉදිකිරීම් සම්බන්ධයෙන් 2026 සැලැස්මේ ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි. 2026 වසරේ අයවැයෙන් H කලාපයට (ගල්ගමුව ප්‍රදේශය ඇතුළත්) සෘජු ප්‍රතිපාදන වෙන් කර නොමැති වුවද, කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් යුත් විමධ්‍යගත අරමුදල් (decentralized funds) මඟින් එම කටයුතු සිදු කිරීමට නියමිතය.

2.11 <u>**සේවක හිඟය සහ කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම:**</u> ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රතිසංවිධාන ක්‍රියාවලිය හේතුවෙන් බඳවා ගැනීම් නතර වී තිබූ අතර ආයතනය තුළ තාක්ෂණික කාර්ය මණ්ඩලයේ දැඩි හිඟයක් පවතියි. විශාල වශයෙන් ඉංජිනේරුවරු ඇතුළත්ව තාක්ෂණික කාර්යමණ්ඩලය ආයතනය හැරයාමේ ප්‍රවනතාවයක් දක්නට ලැබේ. මෙම හිඟය ජලාශ පාලනය සඳහා ඍණාත්මක ලෙස බලපෑම් කළ හැකි බව අනාවරණය විය. කොන්ත්‍රාත් පදනම මත හෝ නිලධාරීන් බඳවා ගැනීමට අවසර ලබා ගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් මහවැලි අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) විසින් විමසීමක් කරන ලදී.

අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ප්‍රතිව්‍යුහගත කිරීමේ වර්තමාන තත්ත්වය හා තාක්ෂණික කාර්ය මණ්ඩලයේ අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන නිල වශයෙන් ඉල්ලීමක් කළහොත්, කෙටි කාලීනව කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් සඳහා අවසර ලබා දීමට කටයුතු කළ හැකි බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් පැමිණ සිටි අධ්‍යක්ෂවරයා ප්‍රකාශ කළේය.

3. <u>අනුකාරක සභාවේ නිර්දේශ</u>

- පහළ මට්ටමේ සේවකයන්ගේ ආකල්පමය වර්ධනයක් සිදුකිරීම.
- වත්කම් තක්සේරු කිරීමේ කටයුත්ත ප්‍රමුඛ කාර්යභාරයක් ලෙස සලකා කාර්යක්ෂමව හා අඛණ්ඩව සිදුකිරීම.
- ඉදිරියේදී ප්‍රමාදයන්ගෙන් තොරව අදාළ සැලසුම් ඉදිරිපත් කිරීමට වගබලා ගැනීම.
- අධිකාරියේ සේවක පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හරහා විධිමත් ඉල්ලීමක් ඉදිරිපත් කිරීම.

26. ශ්‍රී ලංකා නීති ආධාර කොමිසම
(අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දිනය: 2026 අගෝස්තු 20 දින

පැමිණ සිටි

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම., (අනු කාරක සභා සභාපති)
ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා, පා.ම.,

අනුකාරක සභා සභාපතිවරයාගේ අවසරය මත පැමිණ සිටි

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය,පා.ම.,
ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම.,
ගරු සංජීව රණසිංහ මහතා, පා.ම.,

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

1978 අංක 27 දරණ පනත මගින් මෙම ආයතනය ස්ථාපිත කර ඇති අතර, අධිකරණ අමාත්‍යවරයා විසින් පත් කළ 03 දෙනෙකුගෙන්ද, ශ්‍රී ලංකා නීතීඥ සංගමය විසින් පත් කළ 06 දෙනෙකුගෙන්ද යුත්, සභාපති ඇතුළු කොමසාරිස්වරුන් 9 දෙනෙකුගෙන් ආයතනය සමන්විත වේ. දිවයිනේ සියලු අධිකරණ කලාපයන් ආවරණය වන පරිදි නීති ආධාර මධ්‍යස්ථාන 88 ක් ක්‍රියාත්මක වේ. නීති ආධාර සේවා දිවයින පුරා ව්‍යාප්ත කිරීම, නීති ආධාර ලබාදීමේ ක්‍රමවේද හා පටිපාටි නියාමනය කිරීම, නීති ආධාර ක්‍රමය ශක්තිමත් කිරීම හා සංවර්ධනය කිරීම, නීතිමය පර්යේෂණ හා සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම ඇතුළු අරමුණු රාශියක් ආයතනය විසින් ක්‍රියාත්මක කරන අතර, ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 361 ක්ද, දැනට 294 ක කාර්ය මණ්ඩලයක්ද සිටින අතර, එහි නීතිඥ කාර්ය මණ්ඩලය 122ක් සහ කළමනාකරණ සහකාර කාර්ය මණ්ඩලය 98 දෙනෙකු සිටී.

2. අනු කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

- **කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු:** ආයතනය විසින් ලබා දෙන වැටුප් හා ප්‍රතිලාභ සම්බන්ධයෙන් ගැටළු පැවතීම මත නීතිඥ කාර්ය මණ්ඩලය නිරතුරුව ඉල්ලා අස් වීමත්, මුලතිවු මධ්‍යස්ථානය සඳහා නීතිඥවරයෙකු බඳවාගැනීමට නොහැකි වීමත්, ආයතනය සඳහා බඳවාගැනීමේ සුදුසුකම

වන වසර 03ක පළපුරුද්ද සහිත නීතිඥවරු බඳවාගැනීමට අපහසු බැවින් සහකාර නීතිඥයන් බඳවාගැනීම සඳහා ඉල්ලීමක් කළද ඒ සඳහා අනුමැතිය නොලැබීමත් සම්බන්ධයෙන් කරුණු දක්වන ලදී.

- **<u>මධ්‍යස්ථානවල නඩු කටයුතු</u>:** ආයතනයේ මධ්‍යස්ථානවල සිදු කරන නඩු කටයුතු උතුරු නැගෙනහිර ප්‍රදේශයට අදාලව අඩු ආදායම්ලාභීන් අවම වීම, ගම්පහ මධ්‍යස්ථානය විසින් සිදු කර ඇති නඩු ප්‍රමාණය අවම වීම හා නඩු සම්බන්ධ පසු විපරම ආදිය පිළිබඳව අවධානය යොමු විය. ආයතනයේ දුර්වල කාර්ය සාධන මට්ටමක් පැවති සේවා ස්ථාන 15ක් අතර පළමුවැන්න යාපනය වූ බවත්, ගම්පහ මධ්‍යස්ථානයේ ඉඩ පහසුකම් අඩු බවත් ආයතනය පවසන ලදී.
- **<u>බහා තබන ලද නඩු</u>:** ආයතනයට ලැබෙන 65%ක් පමණ වන පවුල් සම්බන්ධ නඩුවලින් බහුතරයක් නඩත්තු නඩු වන අතර ඒ සම්බන්ධයෙන් මෙම තත්ත්වය ඇති නමුත් වෙනත් නඩු සම්බන්ධයෙන් බහා තැබීම් ඉතාම අවම බවත් ප්‍රකාශ කරන ලදී.
- **<u>වැඩ ආවරණ තනතුරු</u>:** ඉදිරි මාස 02 ඇතුළත මෙම තනතුරු සම්පූර්ණ කර ගැනීමට හැකි බව ආයතනය පවසන ලදී.
- **<u>පනත සංශෝධනය:</u>** කොමසාරිස්වරු දෙදෙනෙකු වැඩි කිරීමටත් (මුදල් අමාත්‍යාංශයෙන් හා අධිකරණ අමාත්‍යාංශයෙන්), උපදේශක සභාව (advisory council) සංශෝධනය කිරීමටත්, මේ සඳහා දැනට අමාත්‍යාංශයෙන් යෝජනා ඉදිරිපත් කර ඇති බවත් පවසන ලදී.
- **<u>නීති ආධාර අරමුදල පවත්වාගෙන යාම</u>**: ආයතනයට දායක මුදල් ලබා දීමට විවිධ පාර්ශව කැමැත්ත පළ කලද, ඒවා ලබාගැනීමටද ආයතනයට හැකියාව තිබුණද, එම අරමුදල් රජය හරහා ලැබීමේදී විවිධ ප්‍රමාදවීම් සිදුවන බැවින් ගැටළු මතු වී ඇති බවත්, ඒ සඳහා යම් ලිහිල් කාර්යපටිපාටියක් ලබා දෙන ලෙසත් පැවසීය.

3. <u>ආයතනික පැහැදිලි කිරීම සම්බන්ධයෙන් ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ</u>

- **<u>ආයතනයේ අභ්‍යන්තර විගණක නිලධාරියෙකු නොමැති වීම</u>:** ආයතනයේ අභ්‍යන්තර විගණකවරයෙකු පෙර දී නොසිටි බැවින් මේ වන විට බඳවාගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අමාත්‍යාංශය වෙත යොමු කර ඇති නමුත්, එය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ලැබී නොමැති වීම පිළිබඳව ආයතනය පවසන ලදී.
- **<u>ආයතනයේ වෙබ් අඩවිය</u>:** මේ වන විට වෙබ් අඩවිය සකස් කර අවසන් වී ඇති අතර, පසුවිපරම් කටයුතු සඳහා උපකාර වන නඩුකර කළමනාකරණ පද්ධතියක් (Case management system) සකස් කරමින් පවතින බවත්,

එම කටයුතු මාස 02ක් ඇතුළත අවසන් කිරීමට සැලසුම් කර ඇති බවත් ආයතනය පවසන ලදී.

- **<u>ආයතනයේ 2025/2026 ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා ඇති පිරිදි මධ්‍යස්ථාන ඉදි කිරීම:</u>** ආයතනයේ මධ්‍යස්ථාන ඉදි කිරීම සඳහා මුදල් වෙන් කර දක්වා ඇති නමුත්, ඒ සම්බන්ධ ප්‍රමාදය පිළිබඳව අවධානය යොමු වූ අතර, ප්‍රධාන සැලැස්මෙහි මෙම මධ්‍යස්ථාන ආරම්භ කිරීම සඳහන් කර තිබුණද, කාර්ය මණ්ඩලය වැඩි වීමකින් තොරව එසේ සිදු කළ නොහැකි බව ආයතනය පවසන ලදී.

4. <u>අනු කාරක සභාවේ නියෝග හා නිර්දේශ</u>

1. ආයතනයේ තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලීමේදී, ආයතනයේ පසුබිම, තනතුරට අදාළ සියලු තොරතුරු ඇතුලත්ව සාධාරණීකරණයන් සහිත වාර්තාවක් යොමු කිරීම.
2. JM වැටුප් කේතය යටතේ ආයතනයේ නීති නිලධාරී තනතුරු සඳහා බඳවාගැනීම සම්බන්ධ ඉල්ලීම සියලු කරුණු ඇතුළත්ව විධිමත්ව සකස් කර අනුමැතිය සඳහා යොමු කිරීම.
3. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ආයතනයේ තනතුරු අනුමත කිරීමේදී ආයතනයේ මෙන්ම සේවාවේ විශේෂත්වය පිළිබඳව සලකා බලා කටයුතු කිරීම.
4. ආයතනයේ අභ්‍යන්තර විගණක තනතුර කොමසාරිස් ජනරාල් යටතේ තිබෙන ලෙස ආයතනික ව්‍යුහය (Organizational Structure) සංශෝධනය කිරීම.
5. ආයතනයට ලැබෙන නඩු සංඛ්‍යාව වර්ධනය කරගැනීමට කටයුතු කිරීම.
6. මෙම ආයතනය ප්‍රධාන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමකට කැඳවීමට අපේක්ෂා කරන බැවින්, ඒ වන විට නඩු සංඛ්‍යාව අවම වීමට අදාල ගැටළුව විසඳා ගැනීමට කටයුතු කිරීම.
7. ආයතනයේ නඩු සම්බන්ධයෙන් හා ආයතනය සම්බන්ධයෙන් පසුවිපරම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.

27. ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය
(අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දිනය: 2026 අගෝස්තු 20 දින

පැමිණ සිටි

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම., (අනු කාරක සභා සභාපති)
ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා, පා.ම.,

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1.ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

1959 වර්ෂයේදී ජර්මානු හා ශ්‍රී ලංකා රජය අතර බද්ධ ව්‍යාපාරයක් (joint venture) ලෙස, ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථ සඳහා සේවා හා සහාය ලබා දීම සඳහා මෙම ආයතනය වේරහැර ප්‍රදේශයේ පිහිටුවා ඇත. 1974 වර්ෂය වන තෙක් වේරහැර නගරයේ මෙම ආයතනය පවත්වාගෙන ගොස් ඉන්පසුව කටුබැද්ද ප්‍රදේශයට ගෙන ගොස් ඇත. 1976 වර්ෂය වන තෙක් ජර්මානු කාර්ය මණ්ඩලයක් මගින් පවත්වාගෙන ගොස්, පසුව මෙම ආයතනය ශ්‍රී ලංකා රජයට පවරාගෙන ඇත. මෝටර් රථ ක්ෂේත්‍රයේ (Automobile) සන්නාමයක් ලෙස හා එම ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා ලෙස සැලකෙන මෙම ආයතනය විසින් වසර 65කට අධික කාලයක් තුළ ක්ෂේත්‍රයේ 100% නිපුණත්වය ඇති පිරිසක් පුහුණු කර ඇත. ආයතනය විසින් පූර්ණ කාලීන පාඨමාලා 10ක් හා එම ක්ෂේත්‍රවලටම අදාළ වන අර්ධ කාලීන පාඨමාලා 52ක් පවත්වාගෙන යන අතර, පූර්ණ කාලීන පාඨමාලා අවසන් කර 20,000 ක පමණ පිරිසක් හා අර්ධ කාලීන පාඨමාලා අවසන් කර 100,000 කට අධික පිරිසක් මේ වන විට ආයතනයෙන් පිටවගොස් ඇත. කටුබැද්ද මධ්‍යස්ථානයද ඇතුළත්ව, කිලිනොච්චිය, ආනමඩුව හා බොරැල්ල ලෙස ප්‍රාදේශීය මධ්‍යස්ථාන 04 ක් යටතේ ආයතනය පුළුල් කර ඇති අතර, හම්බන්තොට තවත් ප්‍රාදේශීය මධ්‍යස්ථානයක් පිහිටුවීමට යෝජනා කර ඇත.

2. අනු කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

- **<u>කිලිනොච්චි මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය</u>:** කිලිනොච්චි මධ්‍යස්ථානයේ කටයුතු වෙනම විදුහල්පතිවරයෙකු යටතේ ස්වාධීනව සිදු කරන අතර, සමහර කටයුතුවලදී ආයතනයට වගකීමෙන් බැඳෙන බවත්, එම මධ්‍යස්ථානයේ නේවාසිකාගාරයේ ගැටළු පැවති බැවින් ශ්‍රී ලංකා යුද හමුදාවේ සහාය සමග එය ඉදි කිරීමට කටයුතු කරමින් පවතින බවත්, මධ්‍යස්ථානයට බඳවාගෙන ඇති ශාස්ත්‍රීය පර්යේෂකවරුන් සම්බන්ධ (Academic Researcher) ගැටළුව පිළිබඳව සාකච්ඡා කර ඇති බවත් ආයතනය පවසන ලදී.
- **<u>කටුබැද්ද මධ්‍යස්ථානය පුළුල් කිරීම</u>:** කටුබැද්ද මධ්‍යස්ථානය පුළුල් කිරීම සඳහා, එම මධ්‍යස්ථානය පිහිටා ඇති ඉඩමට යාබදව ඇති නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩම නොමිලේ ලබා දෙන ලෙස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති බවත්, එසේත් නොමැති නම් දැනට තිබෙන ඉඩමෙහි ඇති ගොඩනැගිල්ලක් මහල් ගණන වැඩි කර නැවත ඉදිකිරීමෙන් සිසුන් වැඩි කර ගත හැකි බවත් ආයතනය පෙන්වා දෙන ලදී.
- **<u>මාතර මධ්‍යස්ථානය ආරම්භ කිරීම හා මධ්‍යස්ථානවල ඇති විවිධ පාඨමාලා</u>:**

  මාතර මධ්‍යස්ථානය ආරම්භ කිරීමට සැලසුම් කර ඇති ඉඩමෙහි ජාත්‍යන්තර ක්‍රීඩාංගණයක් ඉදිකිරීම සඳහා සැලසුම් කර තිබූ බවත්, මාතර නගරයට යාබද සුදුසු ඉඩමක් සහ ඒ සඳහා රජයේ අරමුදල් ලැබෙන්නේ නම් එම මධ්‍යස්ථානය ඉදිකිරීමට හැකි බවත්, කිලිනොච්චි මධ්‍යස්ථානයේ පුනර්ජනනීය බලශක්තිය, ආහාර තාක්ෂණය හා ඉදිකිරීම් තාක්ෂණයද, ආනමඩුව මධ්‍යස්ථානයේ කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර තාක්ෂණය සම්බන්ධ පුහුණුවද, බොරැල්ල මධ්‍යස්ථානයේ මෝටර් රථ සහ ත්‍රී රෝද රථ සම්බන්ධ පුහුණුවද මූලිකව සිදු කරන බවත් ආයතනය දැනුම් දෙන ලදී.

3. <u>ආයතනික පැහැදිලි කිරීම සම්බන්ධයෙන් ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ</u>

- **<u>ආයතනික සැලැස්ම සම්බන්ධ ගැටළු</u>:** ආයතනයේ ප්‍රධාන සැලැස්මෙහි (master plan) තිබෙන කරුණු ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් වීම සම්බන්ධයෙන් විමසීමේදී, මෙම ප්‍රධාන සැලැස්ම ආයතනය විසින් සකස් කර ඇති නමුත්, එය ප්‍රසම්පාදන විශේෂඥ කමිටුවක් මගින් අනුමත කර ගත යුතු බවත්, දැනට මෙම සැලැස්ම

අමාත්‍යාංශය වෙත යොමු කර අනුමත කර ඇති බවත් ආයතනය දැනුම් දෙන ලදී.

- **<u>ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධ ගැටළු</u>:** ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රසම්පාදන සැලැස්මට සමගාමීව තිබීම, ආයතනයේ මූලික කටයුතු වන සිසුන් බඳවා ගැනීම, විභාග පැවැත්වීම ආදී කරුණු අදාළ කාලය සමග නිවැරදිව ක්‍රියාකාරී සැලැස්මේ දක්වා නොමැති වීම සම්බන්ධයෙන් අවධානය යොමු විය. ආයතනයේ විභාග කටයුතු අදාල කාලය තුල සිදු වන බවත්, ඒ සම්බන්ධයෙන් මීළඟ වසරේ සිට ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කරන බවත් ආයතනය විසින් දැනුම් දෙන ලදී.

4.<u>අනු කාරක සභාවේ නියෝග හා නිර්දේශ</u>

1. ආයතනයේ සැලසුම් අංශයක් (planning section) ස්ථාපනය කිරීම.
2. ආයතනයේ ප්‍රධාන සැලැස්ම (master plan) පදනම් කර ගනිමින් ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.
3. ආයතනය විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන සංකල්ප ක්‍රියාකාරකම් ලෙස (activities) ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීම.

28. නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
(මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දිනය: 2026 අගෝස්තු 21 දින

පැමිණ සිටි:
ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම. (අනුකාරක සභා සභාපති)**,**
ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**,** පා.ම.

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

- **පසුබිම හා ව්‍යුහය:** 1984 දී ජාතික නිවාස පනත යටතේ සමිතියක් ලෙස ආරම්භ වී, 2003 දී ශ්‍රී ලංකා මහ බැංකුවේ විශේෂිත බැංකුවක් ලෙස ලියාපදිංචි විය. බැංකුව සතුව ශාඛා 39ක් සහ සේවකයින් 453ක් සිටින අතර, 51.22%ක රජයේ හිමිකාරිත්වයෙන් සමන්විත වේ.
- **සංයුක්ත සැලැස්ම (2026-2030):** මූල්‍ය වර්ධනය සහ ණය කළඹ විවිධාංගීකරණය, අරමුදල් සහ ද්‍රවශීලතාව ශක්තිමත් කිරීම, ඩිජිටල් පරිවර්තනය **සහ** පාරිභෝගික සේවා විශිෂ්ටත්වය, තිරසාර මූල්‍යකරණය සහ යහපාලනය සහ මෙහෙයුම් සහ ආයතනික විශිෂ්ටත්වය යන ප්‍රධාන අරමුණු 5ක් යටතේ පස් අවුරුදු සැලැස්මක් සකසා ඇත.
- **මූල්‍ය පසුබිම සහ ප්‍රතිව්‍යුහගත කිරීම:** රටෙහි පැවති අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් 2024 සහ 2025 වසරවලදී බැංකුව පාඩු ලබන තත්ත්වයකට පත් වුවද මේ වන විට ක්‍රමයෙන් ලාභ ලබන මට්ටමට පත්වෙමින් පවතී. අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව ලංකා බැංකුව සමඟ එක්ව බැංකුව ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී.

2. කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

- **ආර්ථික අර්බුදය සහ මූල්‍ය පසුබෑම:** සමාජයේ පහළම ස්ථරය සමඟ ගනුදෙනු කිරීම හේතුවෙන් ආර්ථික අර්බුදය හමුවේ ණය හිමියන්ගේ රැකියා අහිමි වීම සහ ඉහළ ගිය අක්‍රිය ණය (NPL) හේතුවෙන් බැංකුවට බලපෑම් ඇති වූ බව ආයතනය පැවසීය.
- **මූල්‍ය ආයෝජන සහ නීතිමය ක්‍රියාමාර්ග:** මූලික අරමුණින් පරිබාහිරව ලබා දුන් ණය සම්බන්ධයෙන් (උදා: බිම්පුත් මූල්‍ය සමාගම සහ ඔලිම්පස් ඉදිකිරීම් සමාගම) සිදුකළ විමසීමේදී බිම්පුත් සමාගම ඇවර කිරීමට සහ නඩු පැවරීමට නීතිමය පියවර ගනිමින් සිටින බවත්, ඔලිම්පස් සමාගමේ

ඇපකරයක් ලෙස අක්කර 28ක ඉඩමක් බැංකුවට පවරාගෙන ඇති බවත් ආයතනය ප්‍රකාශ කළේය.

- **<u>භාණ්ඩාගාර බැඳුම්කර විකුණුම් සහ ප්‍රාග්ධන හිඟය පියවීම</u>:** 2023 වසරේදී 28%ක පොලී අනුපාතිකයකට පැවති බැඳුම්කර විකුණා ඇති අතර, ඉන්පසු සිදු කළ විකුණුම්වල පොලී අනුපාතික පිළිවෙළින් 15% සහ 16%ක් වන බවත්, වර්තමානයේ ඒවා 10% සහ 12% පමණ වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශ අනුව බැංකුව රුපියල් බිලියන 7.5ක ප්‍රාග්ධනයක් පවත්වාගෙන යා යුතු බැවින්, මූලෝපායික උපක්‍රමයක් ලෙස එම බැඳුම්කර විකුණා බැංකුවේ ප්‍රාග්ධන හිඟය සපුරා ගැනීමට කටයුතු කළ බව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් පැහැදිලි කළේය.

3. <u>ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම</u>

- **<u>විගණන නිරීක්ෂණ</u>:** සමස්ත බැංකු ක්ෂේත්‍රයේ සාමාන්‍ය අක්‍රීය ණය අනුපාතය 10%ක් පමණ වන විට බැංකුවේ අක්‍රීය ණය (NPL) අනුපාතය 23%ක් වැනි ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් ඒ සඳහා වෙන්කළ යුතු ප්‍රතිපාදන ඉහළ ගොස් තිබීම, පරිපාලන වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් ලාභ ආන්තිකයක් පවත්වා ගැනීමට නොහැකි වීම සහ 2023 වසරේදී රුපියල් බිලියන 7.5ක ප්‍රාග්ධන අවශ්‍යතාව සපුරා ගැනීමට භාණ්ඩාගාර බැඳුම්කර විකිණීමෙන් විශාල ලාභයක් ලබා තිබුණද 2024 සහ 2025 වසරවලදී එවැනි විකුණුම් සිදු නොවීම හේතුවෙන් ලාභය අඩු වීම යනාදී කරුණු පෙන්වා දෙන ලදී.

4. <u>අනුකාරක සභාවේ ප්‍රධාන නිර්දේශ</u>

- ප්‍රමාද වී ඇති සහ පැහැර හැර ඇති ණය අයකර ගැනීමට කටයුතු කිරීම සහ සේවක සුබසාධනය කෙරෙහි අවධානය යොමු කිරීම.
- බිම්පුත් සමාගම සහ ඔලිම්පස් ඉදිකිරීම් සමාගම සම්බන්ධයෙන් කඩිනමින් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම මඟින් ණය අයකර ගැනීමට කටයුතු කිරීම.
- ලංකා බැංකුව සමඟ කටයුතු කිරීමේදී ආයතනික මට්ටමෙන් සාධනීය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම.

29. ලංකා ලුණු සමාගම
(මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දිනය: - 2026 අගෝස්තු 21 දින

පැමිණ සිටි:
ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම. (අනුකාරක සභා සභාපති)**,**
ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**,** පා.ම.

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

- **පසුබිම හා කාර්ය මණ්ඩලය:** 1938 දී ලුණු දෙපාර්තමේන්තුව ලෙස ආරම්භ වී, 1997 දී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට (ETFB) 90%ක් සහ ලේවාය සේවකයින්ට 10%ක් හිමි වන සේ සීමිත සමාගමක් බවට පත් විය. 2026.06.30 දිනට අනුමත සේවක සංඛ්‍යාව 970ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 916කි.
- **සංයුක්ත සැලැස්ම හා නව ව්‍යාපෘති:** මූල්‍යමය දෘෂ්ටිකෝණය, පාරිභෝගික සහ වෙළෙඳපොළ දෘෂ්ටිකෝණ සහ ආයතනික සහ මානව සම්පත් දෘෂ්ටිකෝණ වශයෙන් උපායමාර්ගික අරමුණු සකසා ඇති අතර, ස්වයංක්‍රීය මේස ලුණු කර්මාන්තශාලාව, නවීන කැට ලුණු නිෂ්පාදනාගාරය සහ රික්තක ක්‍රමයට වියළන ලද මේස ලුණු කර්මාන්තශාලාව වැනි නව ව්‍යාපෘති ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.
- **මූල්‍ය කාර්යසාධනය හා ප්‍රසම්පාදනය:** 2026 වසර සඳහා අපේක්ෂිත ආදායම (බදු අඩු කිරීමෙන් පසු) රුපියල් මිලියන 3,909.5ක් වන අතර, බදු පසු ශුද්ධ ලාභය රුපියල් මිලියන 1,037.1කි. රුපියල් මිලියන 992ක මුළු පිරිවැයක් සහිත ප්‍රසම්පාදන 80ක් ක්‍රියාත්මක කිරීමට ඇස්තමේන්තු කර ඇත.

2. කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම්

- **අමාත්‍යාංශ ව්‍යුහය සහ තාක්ෂණික සහය:** ආයතනය මුදල් අමාත්‍යාංශය සහ ETFB යටතේ පැවතීම හේතුවෙන්, නිෂ්පාදන කර්මාන්තයක් ලෙස ව්‍යාප්ත වීමට සහ නව තාක්ෂණය ලබා ගැනීමට අවශ්‍ය කර්මාන්ත අමාත්‍යාංශයේ විෂයානුබද්ධ අවධානය ගිලිහී ගොස් ඇති බව කාරක සභාව පෙන්වා දුන්නේය.

- <u>උසස් කළමනාකාරීත්ව පුරප්පාඩු සහ සැලසුම් ප්‍රමාදය</u>: ඉහළ කළමනාකාරීත්වයේ තනතුරු හිස්ව පැවතීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැලසුම් නැවත නැවත සමාලෝචනය කිරීම හේතුවෙන් 2026 සැලසුම් අනුමත කරගැනීම අගෝස්තු මස දක්වා ප්‍රමාද වී ඇත.
- **<u>ලේවායන් ආශ්‍රිත සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම</u>:** හම්බන්තොට වරායට පැමිණෙන සංචාරක නෞකා (Cruise Ships) හරහා විදේශීය සංචාරකයින් ඉලක්ක කර ගනිමින් විශේෂ වැඩසටහනක් සකස් කිරීමට සැලසුම් කර ඇති බව ආයතනය පැවසීය. ලුණු නෙළන කාලසීමාවන්හිදී ප්‍රවේශ පත්‍ර නිකුත් කර ලේවාය නැරඹීම, ලුණු නෙළීම සහ ප්‍රවාහන පහසුකම් සැලසීම හරහා අමතර ආදායම් මාර්ගයක් සකසා ගැනීමට අපේක්ෂා කෙරේ.

3. <u>ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම</u>

- **විගණන විමසුම් සහ ආම් හෝස් මිලදී ගැනීම:** භාවිතයට ගත නොහැකි වූ රුපියල් මිලියන 11.31ක ආම් හෝස් (Armored Hose) මිලදී ගැනීම ඇතුළු අතීත විගණන විමසුම් සම්බන්ධයෙන් මූලික විමර්ශන සිදු කර අවසන් කර ඇති අතර, වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව චෝදනා පත්‍ර නිකුත් කිරීමට කටයුතු කරමින් සිටින බව ආයතනය පැවසීය.

4. <u>අනුකාරක සභාවේ ප්‍රධාන නිර්දේශ</u>

- ආයතනයේ ඉහළ කළමනාකාරීත්වයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සම්පූර්ණ කර විධිමත් ආයතනයක් ලෙස කටයුතු කිරීම.
- සම්පූර්ණයෙන්ම ශ්‍රමය මත පමණක් පදනම් නොවී, ලුණු කැඩීම හා නිෂ්පාදනය සඳහා යන්ත්‍රෝපකරණ සහ ස්වයංක්‍රීය තාක්ෂණය භාවිතය වැඩිදියුණු කර නිෂ්පාදන ඒකක පිරිවැය අවම කරගැනීම.
- ලුණු යනු රටකට අත්‍යවශ්‍ය ද්‍රව්‍යයක් වන බැවින්, ආරක්ෂිත තොග සංචිතයක් රැස්කර ගැනීම සහ පවත්වාගෙන යාම සඳහා අවධානය යොමු කිරීම.
- පසුගිය කාල පරිච්ඡේදයන්ට අදාළව නිකුත් කර ඇති විගණන විමසුම් සඳහා කඩිනමින් විධිමත් පිළිතුරු ලබාදීම සහ අක්‍රමික මිලදී ගැනීම්වලට වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම.

30. පිපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී

(මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දින - 2026 සැප්තැම්බර් 08 දින

පැමිණ සිටි:
ගරු තිළිණ සමරකෝන් මහතා (අනුකාරක සභා සභාපති), පා.ම.,
ගරු එස්. එම් මරික්කාර් මහතා, පා.ම.,
ගරු ජගත් මනුවර්ණ මහතා, පා.ම.

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

- **පසුබිම හා සමූහයේ ව්‍යුහය:** මහජන බැංකුවට 75%ක අයිතිය හිමි පිපල්ස් ලීසිං සමාගම වසර 30ක ඉතිහාසයක් ඇති, ශාඛා 114ක් සහ ලක්ෂ 15ක පාරිභෝගික පදනමක් සහිත බැංකු නොවන මූල්‍ය ක්ෂේත්‍රයේ 3 වන ස්ථානය හිමි රාජ්‍ය අනුබද්ධ ආයතනයකි. People's Insurance, People's Micro Commerce, PLC Fleet Management, Havelock Properties, PLC Property Development සහ බංග්ලාදේශයේ Alliance Finance (51%) යන අනුබද්ධ ආයතන සමූහයට අයත් වේ.

- **මූල්‍ය කාර්යසාධනය හා 2026 අයවැය:** 2025 වසරේදී සමාගමේ සමස්ථ වත්කම් රුපියල් බිලියන 321ක්, ණය හා පහසුකම් රුපියල් බිලියන 276ක්, තැන්පතු රුපියල් බිලියන 165ක් සහ වාර්තාගත ශුද්ධ ලාභය රුපියල් බිලියන 5ක් විය. 2027 වසරේ අයවැය මඟින් වත්කම් රුපියල් බිලියන 418 දක්වාත්, ණය රුපියල් බිලියන 384 දක්වාත්, ලාභය රුපියල් බිලියන 7 දක්වාත් වර්ධනය කර ගැනීමට ඉලක්ක කර ඇත.

- **උපායමාර්ගික ප්‍රමුඛතා හා ප්‍රසම්පාදනය:** සුළු හා මධ්‍ය පරිමාණ (SME) සහ අවිධිමත් ක්ෂේත්‍රයේ ව්‍යවසායකයන් උදෙසා ආදායම් උපයන වත්කම් සඳහා මූල්‍ය පහසුකම් සැපයීමට ප්‍රමුඛතාව ලබා දෙයි. ඉදිරි ප්‍රසම්පාදන අයවැයෙන් 42%ක් ඩිජිටල්/IT ක්ෂේත්‍රයටත්, 22%ක් ශාඛා ව්‍යාප්තියටත්, 34%ක් යටිතල පහසුකම් සඳහාත් වෙන් කර ඇත.

2. කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

- **අක්‍රිය ණය කළමනාකරණය හා සහන සැලසීම්:** ආර්ථික අර්බුද සමයේ 15.2% දක්වා ඉහළ ගිය අක්‍රිය ණය (NPL) අනුපාතය ගනුදෙනුකරුවන් සමඟ පැවැත්වූ නම්‍යශීලී සබඳතා හේතුවෙන් 2.2% දක්වා සීඝ්‍රයෙන් අඩු කරගෙන ඇති බවත්, පාරිභෝගිකයන්ගෙන් දඩ පොලී අය නොකරන අතර, ණය කලින් පියවීමේදී අනාගත පොලිය සම්පූර්ණයෙන්ම නිදහස්

කර ඉතිරි ප්‍රාග්ධනයට පමණක් කාලසටහන සකස් කර දෙනු ලබන බවත් ආයතනය පැවසීය.

- **<u>ක්ෂුද්‍ර මූල්‍ය හා මානව සම්පත් කළමනාකරණය</u>:** රුපියල් බිලියන 13ක කළඹක් සහිත ලංකාවේ විශාලතම ක්ෂුද්‍ර මූල්‍ය ආයතනය වන People's Micro Commerce හරහා ශාඛා 36ක නිලධාරීන් මඟින් ග්‍රාමීය මට්ටමින් සේවා සපයනු ලබන බවත්, සේවකයින්ගේ කාර්යසාධනය පදනම් කරගෙන දීමනා සහ ප්‍රසාද දීමනා ලබා දෙන බවත්, අඩු කාර්යසාධනයක් ඇති සේවකයින් සේවයෙන් ඉවත් නොකොට වෙනත් සුදුසු අංශවලට යොමු කරමින් කාර්යසාධනය නංවාලීමට කටයුතු කරන බවත් ආයතනය පැවසීය.

3. <u>ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම</u>

- **<u>විගණන අඩුපාඩු හා ප්‍රසම්පාදන අත්පොත</u>:** 2026-2029 උපායමාර්ගික සැලැස්ම අනුමත කරගැනීමේ මාස 2ක ප්‍රමාදයක් තිබීම, ක්‍රියාකාරී සැලැස්මේ ආරම්භක දිනයන් නොමැති වීම, සහ 2024 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වෙනුවට අභ්‍යන්තර අත්පොතක් භාවිත කිරීම ආදි අඩංගු නොවූ කරුණු නියෝජ්‍ය විගණකාධිපති විසින් පෙන්වා දෙන ලදී. ජාතික මාර්ගෝපදේශවලට අනුගත නව ප්‍රසම්පාදන අත්පොත මාස 3ක් ඇතුළත සකස් කර අදාළ අනුමැතීන් ලබා ගන්නා බව ආයතනය ප්‍රකාශ කළේය.

4. <u>කාරක සභාවේ ප්‍රධාන නිර්දේශ</u>

I. උපායමාර්ගික සැලැස්මේ පවතින අඩුපාඩු සකස් කර නව උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම.

II. නව ප්‍රසම්පාදන අත්පොත කඩිනමින් අනුමත කරගැනීම.

III. කාර්තුමය අයවැය ලේඛන, ක්‍රියාකාරී සැලැස්මට පූර්ණව අනුගත කරමින් ඉදිරි කටයුතු විධිමත් කිරීම.

31. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දින - 2026 සැප්තැම්බර් 08 දින

පැමිණ සිටි:
ගරු තිළිණ සමරකෝන් මහතා (අනුකාරක සභා සභාපති), පා.ම.,
ගරු ජගත් මනුවර්ණ මහතා, පා.ම.

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

- **පසුබිම හා උපායමාර්ගික කුළුණු:** ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම, ආර්ථිකයේ පදනම පුළුල් කිරීම සහ කර්මාන්ත ප්‍රවර්ධනය උදෙසා ස්ථාපිත කර ඇත. 2026-2030 ආයතනික සැලැස්ම කුළුණු 5ක් (හිතකර ප්‍රතිපත්ති, ඉලක්කගත ප්‍රවර්ධනය, ආයෝජන පහසුකම් සැලසීම/එක්දින කවුළුව, කලාප සංවර්ධනය, මෙහෙයුම් විශිෂ්ටත්වය) මත පදනම්ව සකස් කර ඇත.

- **ආයෝජන ඉලක්ක හා මූල්‍ය ප්‍රගතිය:** 2025 දී ඩොලර් මිලියන 1,063ක සැබෑ ආයෝජන සහ ඩොලර් මිලියන 8,568ක අපනයන ආදායමක් ලබා ගෙන ඇත. 2026 වසර සඳහා ගිවිසුම්ගත ආයෝජන ඉලක්කය ඩොලර් මිලියන 2,000ක් (අගෝස්තු වන විට ඩොලර් මිලියන 432ක් ලැබී ඇත) සහ අපනයන ඉලක්කය ඩොලර් මිලියන 10,600ක් වේ.

- **නව ප්‍රතිපත්ති හා කලාප සංවර්ධනය:** ඛනිජ, හරිත හයිඩ්‍රජන්/ඇමෝනියා නිෂ්පාදනය, දත්ත මධ්‍යස්ථාන සහ විශේෂ ආර්ථික කලාප (SEZ) යන ප්‍රමුඛතා ක්ෂේත්‍ර සඳහා නව ප්‍රතිපත්ති සකස් කෙරේ. බිංගිරිය (රු. මි. 1,487) සහ ආරබොක්ක (රු. මි. 550) ඇතුළු පවතින කලාප 15 සහ හඳුනාගත් නව කලාප 6 සංවර්ධනය කිරීමට ප්‍රතිපාදන වෙන් කර ඇත.

2. කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

- **ආරබොක්ක සහ බිංගිරිය කලාපවල ප්‍රමාදයන්:** ආරබොක්ක අක්කර 400ක ඖෂධ කලාපය සඳහා රුපියල් මිලියන 420කට අධික මුදලක් වැය කර තිබුණද ජල ව්‍යාපෘතිය අසම්පූර්ණ වීම සහ ප්‍රවර්ධනය මඳ වීම හේතුවෙන් කිසිදු ඖෂධ සමාගමක් ආයෝජනය කර නොමැති බව අනුකාරක සභාව විමසීය. බිංගිරිය II අදියරේ ප්‍රවේශ මාර්ග පටු වීම හේතුවෙන් ප්‍රමාදයන් සිදු වී ඇති අතර 2026 දී ප්‍රසම්පාදන නිම කිරීමට නියමිත බව ආයතනය පැවසීය.

- **පනත සංශෝධනය සහ නීතිමය බලතල:** වනජීවී, පරිසර හා ඉඩම් සම්බන්ධයෙන් සෘජු බලතල ආයෝජන මණ්ඩලයට නැති බැවින්

අනුමැතීන් ගැනීමට ආයතන 10කින් පමණ අවසර ගැනීමට සිදු වන බවත්, මෙම ප්‍රමාදයන් වැළැක්වීමට ආයෝජන මණ්ඩල පනත සංශෝධනය කර 2026 අවසානයට පෙර අමාත්‍ය මණ්ඩලයට යොමු කරන බවත් ආයතනය පැවසීය.

- **<u>පරිසර ආරක්ෂණ බලපත්‍ර (EPL):</u>** ප්‍රධාන කලාප 6කට මධ්‍යම පරිසර අධිකාරියෙන් වෙන වෙනම බලපත්‍ර නිකුත් කිරීමේ තීරණය හේතුවෙන් ඇති වූ අර්බුදය නිරාකරණයට 2025 අප්‍රේල් මස ඉදිරිපත් කළ අවබෝධතා ගිවිසුම (MoU) සඳහා වසරකට අධික කාලයක් පරිසර අධිකාරියෙන් ප්‍රතිචාර ලැබී නොමැති බව ආයතනය පැවසීය.

3. <u>ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම</u>

- **<u>අනුමැති ප්‍රමාදයන් හා තනතුරු පුරප්පාඩු:</u>** 2022 සිට ව්‍යාපෘති 83ක් සඳහා අනුමැතිය දීමට දින 60 සිට 1095 දක්වා කාලයක් ගත වී ඇති බවත්, නීති අංශයේ ප්‍රධානී තනතුර දිගු කලක් තිස්සේ වැඩබලන මට්ටමින් පැවතීම පිළිබඳවත් විගණන නිරීක්ෂණ පෙන්වා දෙන ලද අතර, නීති ප්‍රධානී තනතුර සඳහා බඳවා ගැනීම් ක්‍රියාත්මක වන බව ආයතනය පැහැදිලි කළේය.

4. <u>කාරක සභාවේ ප්‍රධාන නිර්දේශ</u>

කලාපීය යටිතල පහසුකම් (ජලය/මංමාවත්) කඩිනමින් සම්පූර්ණ කිරීම, ආයෝජන මණ්ඩල පනත සංශෝධනය කිරීම, සහ මධ්‍යම පරිසර අධිකාරිය සමඟ පවතින ගැටලුව නිරාකරණය කර ගනිමින් ආයෝජන අනුමැති ක්‍රියාවලිය වේගවත් කිරීමට කාරක සභාව නිර්දේශ කරන ලදී.

32. ජාතික අධ්‍යාපන ආයතනය
(අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දිනය: - 2026 සැප්තැම්බර් 08 දින

පැමිණ සිටි

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම., (අනු කාරක සභාවේ සභාපති)
ගරු මුජීබුර් රහුමාන් මහතා, පා.ම.,

අනුකාරක සහා සභාපතිවරයාගේ අවසරය මත පැමිණ සිටි

ගරු දිනේෂ් හේමන්ත මහතා, පා.ම.,

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

ජාතික අධ්‍යාපන ආයතනය 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත මගින් ස්ථාපිත කර ඇත. පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහතික කිරීම සහ සංවර්ධනය කිරීම ආයතනයේ ප්‍රධාන කාර්යභාරය වන අතර, ඒ යටතේ, විෂයමාලා සංවර්ධනය, පූර්ව සේවා හා සේවාස්ථ ගුරු පුහුණු අධ්‍යාපනය හා පුහුණුව, වෘත්තිකයන්ගේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සහ අධ්‍යාපනික පර්යේෂණ සිදු කිරීමේ වගකීම් ආයතනය විසින් දරනු ලැබේ.

2. අනු කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

- **ආයතනය විසින් 2025 වර්ෂයේ විශාල මුදලක් වැය කර මුද්‍රණය කර ඇති පොත් භාවිතා කිරීම**: මෙම පොත් 2027 වර්ෂයේ 6 ශ්‍රේණියේ පළමු වාරය සඳහා භාවිතා වන බව ආයතනය පවසන ලදී.
- **අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් කිරීම:** අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් කිරීම අධ්‍යාපන කොමිෂන් සභාව සතු වගකීමක් වන බවත්, විෂයමාලා රාමුව (Curriculum framework) පමණක් මෙම ආයතනය සකස් කරන බවත් ආයතනය පවසන ලදී.

- **<u>අර්ධ රාජ්‍ය හා පෞද්ගලික පාසල්වල 1 ශ්‍රේණිය සඳහා සිසුන් බඳවාගැනීම</u>:**
  උක්ත කරුණ සඳහා වන චක්‍රලේඛය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති සියලු පාසල් සඳහා නිකුත් කළද, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින රජයෙන් අවශ්‍ය පහසුකම් ලබා ගන්නා අර්ධ රාජ්‍ය හා පෞද්ගලික පාසල් පිළි නොගැනීම පිළිබඳව අනු කාරක සභාව විමසන ලදී. 1961 වර්ෂයේ රජය විසින් පවරාගත් පාසල් විසින් සිසුන් අතුළත් කර ගැනීමේදී එම පාසල්වලට අනන්‍ය වූ ක්‍රමවේද භාවිතා කරන බවත්, එනමුත් එම පනත මගින් පවරාගත් සියලු පාසල් එසේ සිදු නොකරන බවත් ආයතන පැවසීය.
- **<u>ආයතනයේ ඩිජිටල් පරිවර්තනය (Digital Transformation)</u>:** ඩිජිටල්කරණය සම්බන්ධයෙන් අග්‍රාමාත්‍යවරිය විසින් පිහිටුවා ඇති කාර්ය සාධක බලකායක් මගින් පාසල් ඩිජිටල්කරණය සම්බන්ධ ප්‍රතිපත්තිය සකස් කර ජාතික අධ්‍යාපන කොමිසමට ඉදිරිපත් කර ඇති බවත්, එය කඩිනමින් අමාත්‍ය මණ්ඩලයට යොමු කරන බවත්, සමස්ත පාසල් පද්ධතිය ඩිජිටල්කරණ සැලැස්ම ලබන වසරේ සිට ක්‍රියාත්මක කිරීම සඳහා පළාත්වලට හා මධ්‍යම රජයට රු. බිලියන 10ක පමණ මුදලක් වෙන් කර ඇති බවත් ආයතනය පැවසීය.
- **<u>අන්තර්කරණ අධ්‍යාපනය (Inclusive Education)</u>:** අන්තර්කරණ සංස්කෘතියක් පාසල් පද්ධතිය තුල නිර්මාණය කිරීම සම්බන්ධයෙන් පර්යේෂණයක් මේ වන විට දියත් වෙමින් පවතින අතර, තෝරාගත් පළාත් 03ක UNICEF ආධාර හා උපදේශනය යොදාගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන බවත් ආයතනය පැවසීය.
- **<u>ආයතනය විසින් පවත්වාගෙන යන ස්ථාවර තැන්පතු</u>:** මෙම ආයතනය විසින් උපයාගන්නා මුදල් ආයතනයේ සංවර්ධනය සඳහා තැන්පතු ලෙස පවත්වා ගෙන යන බවත්, අනෙක් උසස් අධ්‍යාපන ආයතනවලද එසේ පවත්වාගෙන යන බවත් ආයතනය පවසන ලදී.

3. <u>ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම</u>

- **<u>ආයතනයේ 2026-2030 උපායමාර්ගික සැලැස්ම හා පනත සංශෝධනය සම්බන්ධ ගැටළු</u>:** ආයතනය විසින් විෂයමාලා සංවර්ධනය (Curriculum Development) සඳහා සම්බන්ධ වූවද, එය ආයතනයේ පනතෙහි කාර්යයක් ලෙස සඳහන් වී නොමැති වීම පිළිබඳව අවධානය යොමු වූ අතර, මෙය ආයතන කිහිපයක් ඒකාබද්ධ වී සිදු කරන කාර්යයක් බවත්, පනත සංශෝධනය පිළිබඳව විෂයමාලා සංවර්ධන ක්‍රියාවලිය විධිමත් වීමෙන් අනතුරුව සලකා බලන බවත් ආයතනය පැවසීය.

4. <u>**අනු කාරක සභාවේ නියෝග හා නිර්දේශ**</u>

1. විෂයමාලා සංවර්ධනයට අදාළව සියලු පාර්ශවවල යෝජනා ඒකමතිත්වයෙන් ස්ථාවර, දීර්ඝකාලීන වඩාත් පිළිගත හැකි ක්‍රමවේදයක් සකස් කර ගැනීමට කටයුතු කිරීම.
2. එහිදී වගකීම් නිවැරදිව ආයතනවලට පැවරෙන ආකාරයට ආයතනයේ පනත සංශෝධනය සඳහා කටයුතු කිරීම.
3. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන, පාසල්වල 1 ශ්‍රේණිය සඳහා සිසුන් බඳවාගැනීමේ චක්‍රලේඛය, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින අර්ධ රාජ්‍ය හා පෞද්ගලික පාසල් පිළිනොගැනීම සම්බන්ධයෙන් කරුණු ඇතුළත් කර ලිඛිත පැහැදිලි කිරීමක් අනු කාරක සභාවට යොමු කිරීම.

33. රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව
(අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දිනය: - 2026 සැප්තැම්බර් 08 දින

පැමිණ සිටි
ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම., (අනු කාරක සභාවේ සභාපති)
ගරු මුජීබුර් රහුමාන් මහතා, පා.ම.,

අනුකාරක සභා සභාපතිවරයාගේ අවසරය මත පැමිණ සිටි
ගරු දිනේෂ් හේමන්ත මහතා, පා.ම.,

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්
රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව 1968 අංක 24 දරන පනතින් පාසල් පෙළපොත් මුද්‍රණය කිරීමේ මූලික අරමුණ ඇතිව පිහිටුවා ඇත. 1982 වර්ෂයේදී ජපන් ආධාර යටතේ එස්.පී.සී. අභ්‍යාස පොත් (SPC Exercise Books) මුද්‍රණය සඳහා විශේෂිත කර්මාන්තශාලාවක්ද එක් වී ඇත. හෝමාගම, වටරැක ප්‍රදේශයේ හෙක්ටයාර් 20ක පමණ භූමි ප්‍රමාණයක කර්මාන්තශාලා 7කින් සමන්විත සංකීර්ණයක් ආයතනයට පවතී. පාසල් පෙළපොත් සහ අභ්‍යාස පොත්වලට අමතරව ලොතරැයි මුද්‍රණය (ආරක්ෂිත මුද්‍රණ (Security Printing)), මැතිවරණ මුද්‍රණ කටයුතු, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වාණිජ මුද්‍රණ කටයුතු සිදු කරනු ලැබේ. වසර 12ක් පාඩු ලබමින් පැවති සංස්ථාව, 2024 සහ 2025 වර්ෂ වන විට ලාභ ලබන තත්ත්වයට පත්ව ඇත.

2. අනු කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

- **ආයතනයේ උපායමාර්ගික සැලැස්ම සම්බන්ධ ගැටළු**: ආයතනයේ දැනට පවතින උපායමාර්ගික සැලැස්ම නව අධ්‍යක්ෂ මණ්ඩලය පත් වන විටත් උපදේශකයකු විසින් සකස් කර තිබූ අතර, ඉන්පසුව එය ආයතනයේ ඉහල කළමනාකාරීත්වය සම්බන්ධ වී සංශෝධනය කළ බවත් ආයතනය විසින් පවසන ලදී.
- **ආයතනයේ පනත සංශෝධනය කිරීම:** තරහකාරී වෙළඳපොල තුල ආයතනය පැවතීමට නම් වෙනස් විය යුතු දේ පවතින බවත්, අධ්‍යාපන ප්‍රකාශනවලින් 40%ක ප්‍රමාණයක් ආයතනයට මුද්‍රණය සඳහා ලබා දීමේ ප්‍රමාදය හේතුවෙන් ගැටළු මතු වී ඇති බවත්, සීමිත

කාලයක් තුළ එය සිදු කිරීම හා ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදු වීම මත මෙහිදී ගැටළු මතු වන බවත් ආයතනය විසින් පැවසීය.

- **<u>ආරක්ෂක මුද්‍රණය (Security Printing) සඳහා ඒකකයක් පිහිටුවීම</u>:** දකුණු ආසියානු කලාපය ඉලක්ක කරගත් ආරක්ෂක මුද්‍රණ ඒකකයක් ආයතනය විසින් පිහිටුවීම සම්බන්ධයෙන් අනු කාරක සභාවේ අවධානය යොමු විය. වෙනම ඒකකයක් ලෙස මෙම ඒකකය ආරම්භ කිරීමට මූලික සාකච්ඡා වට අවසන් කර මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු බවත්, මෙයට අදාළ ප්‍රාග්ධන ආයෝජනය හා තාක්ෂණය රටට ගෙන්වා ගත යුතු බවත් ආයතනය පැවසීය.
- **<u>ආයතනයේ වර්ධනය සම්බන්ධයෙන් හඳුනාගෙන ඇති උපායමාර්ග</u>:** දැනට ආයතනයේ ගුණාත්මකභාවය තක්සේරු කිරීම හා පාලනය (Quality Assessment/Quality Control) සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොවන බවත්, ආයතනය සඳහා තත්ත්ව කළමනාකරණ සැලසුම් කෙටුම්පතක් (draft quality management plan) අනුමත කර ඇති බවත්, ආරක්ෂක මුද්‍රණ දෙපාර්තමේන්තුවෙන් එම වැඩපිළිවෙල ආරම්භ කිරීමට අපේක්ෂා කරන බවත් පැවසීය.
- **<u>ආයතනික සම්පත් සැලසුම්කරණ පද්ධතිය (ERP System) ක්‍රියාත්මක කිරීම:</u>** ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් ලබා දී ඇති ERP පද්ධතිය අසාර්ථක වී ඇති බවත්, මේ සම්බන්ධ යෝජනාව ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයට ලබා දී ඒ සම්බන්ධයෙන් සාකච්ඡා වට කිහිපයක් පවත්වා තිබූ අතර ඒ පිළිබඳව ප්‍රතිචාරයක් නොලැබුණු බවත් ආයතනයේ සභාපති පැවසීය.

3. <u>ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම</u>

- **<u>ආයතනය විසින් මුද්‍රණය කරන පොත්වල ගුණාත්මකභාවය</u>:** ආයතනය විසින් මුද්‍රිත පොත්වල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් වෙළඳපොළ සමීක්ෂණයක් සිදු කර ඇති අතර එහිදී සිසුන් වැඩි ප්‍රමාණයක් (63%) එස්.පී.සී. පොත් තෝරාගෙන ඇති බවත්, එමගින් ආයතනයේ පොත්වල ගුණාත්මකභාවය තීරණය කළ හැකි බවත් ආයතනය පැවසීය.
- **<u>ආයතනයේ වාර්ෂික අය වැය සම්බන්ධ ගැටළු</u>:** ආයතනයේ අය වැයට අනුව සමස්ත අය වැයගත ආදායම හා එහි සංශෝධිත අගයේ විශාල වෙනසක් දක්නට ලැබෙන බව අවධානය යොමු වූ අතර, පෙර වසරේ සැප්තැම්බර් මස ආයතනයේ මීළඟ වසරේ අය වැය සකස් කරන විට පෙළ පොත් මුද්‍රණය මගින් ආදායම පුරෝකථනය කරන බවත්, මීළඟ

වසරේ මාස 06කට පසු ආයතනයට එමගින් ලැබෙන නිශ්චිත ආදායම සම්බන්ධයෙන් දැනුවත් වන බැවින්, ඒ අනුව අය වැය සංශෝධනය වූ බවත් ආයතනය පැවසීය.

4. <u>අනු කාරක සභාවේ නියෝග හා නිර්දේශ</u>

1. ආයතනයෙන් බාහිරව ඇති නමුත් ආයතනයට බලපෑමක් වන, ආයතනික ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමට අදාළ කරුණු පිළිබඳව ආයතනයේ SWOT විශ්ලේෂණයේ ඇතුළත් කිරීම.
2. වර්තමානයේ පවතින නව තත්ත්වයට මුහුණ දීම සඳහා අවශ්‍ය නෛතික තත්ත්වය සකස් කරගැනීම සඳහා යෝජනා ආයතනය විසින් ඉදිරිපත් කිරීම.

34. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
(විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දිනය:- 2026 සැප්තැම්බර් 10 දින

පැමිණ සිටි

ගරු දිනේෂ් හේමන්ත මහතා, පා.ම., (අනුකාරක සභා සභාපති),
ගරු ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය,පා.ම.,

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනික පසුබිම සහ පාලනය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය1985 අංක 21 දරන පනත මගින් ස්ථාපිත කරන ලද අතර එකී පනත 1994 අංක 4 හා 2009 අංක 56 දරන පනත් මගින් සංශෝධනය කර ඇත. විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම කාර්යාංශයේ ප්‍රධාන මූලික කුළුණු තුන වන්නේ විදේශ රැකියා ප්‍රවර්ධනය (Promotion), නියාමනය (Regulation) සහ සුභසාධනය (Welfare) යන්නයි.

2. අනු කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

2.1 සංයුක්ත සැලැස්ම (Corporate Plan) සකස් කිරීම: වත්මන් පස් අවුරුදු සංයුක්ත සැලැස්ම අභ්‍යන්තර නිලධාරීන්ගේ සහ, ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) වැනි ජාත්‍යන්තර ආයතනවල දායකත්වයෙන් සකස් කර තිබුණි. ඉදිරි සැලැස්ම සඳහා බාහිර උපදේශන සහ අභ්‍යන්තර දැනුම එකතු කරමින් සකස් කිරීමට ප්‍රසම්පාදන කටයුතු සිදුවෙමින් පවතී.

සංයුක්ත සැලැස්ම ආයතනය අභ්‍යන්තරයෙන්ම සකස් කිරීම යෝග්‍ය බව කාරක සභාව පෙන්වා දුන්නාය.

2.2 සැලැස්ම යාවත්කාලීන කිරීම (Rolling Plan) : සංයුක්ත සැලැස්ම Rolling Plan ලෙස යාවත්කාලීන කර නොතිබුණි. එසේම SWOT / PESTEL විශ්ලේෂණයන් ලේඛනයෙන් ඉවත් වී තිබුණි. Trust area 4ක් පමණක් හඳුනාගෙන ඇති පසුබිමක ක්‍රියාකාරී

සැලැස්ම/ප්‍රසම්පාදන සැලැස්ම තුළ trust area 5ක් යටතේ මුදල් වෙන් කර තිබුණි.
සංයුක්ත සැලැස්මේ (Corporate Plan) ඇති ප්‍රධාන Trust Areas 4 සකස් කර ඇත්තේ විගමනිකයන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (National Migration Policy) සහ එහි ප්‍රධාන අරමුණු පදනම් කරගෙනය. ආයතන පද්ධතිය පවත්වාගෙන යාමට අවශ්‍ය වන ආනුශාංගික පහසුකම් (යටිතල පහසුකම්, කාර්ය මණ්ඩල වියදම් සහ සහායක සේවා) ආවරණය කිරීම සඳහා 5 වන "Trust Area" ලෙස එය ක්‍රියාකාරී/ප්‍රසම්පාදන සැලැස්මට (Action Plan / Procurement Plan) ඇතුළත් කළ බවත් සඳහන් විය. ඉදිරියේදී සකස් කෙරෙන නව සැලැස්මට Rolling Plan ක්‍රමවේදය සහ SWOT ඇතුළු සියලුම විශ්ලේෂණයන් ඇතුළත් කිරීමට අපේක්ෂිතව සිටී.

2.3 <u>ප්‍රසම්පාදන සැලැස්ම:</u> ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් (Master Procurement Plan) අවුරුදු 3 කට සකස් කළ යුතුය. ඉදිරිපත් කර ඇති ප්‍රසම්පාදන සැලැස්ම 2025 දක්වා පමණක් සකස් කර තිබෙන අතර ප්‍රසම්පාදන සැලැස්ම තුළ 2027 සහ 2028 වසර සඳහා සංඛ්‍යාලේඛන ඇතුළත් කර නොතිබුණි.

2025 දක්වා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පමණක් පෙර සකස් කර තිබුණි. 2026 වසර සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් මත විස්තරාත්මක සැලැස්මක් සකස් කර තිබුණි. 2027 සහ 2028 වසර සඳහා පුරෝකථනයන් එහි ඇතුළත් කිරීම අපහසු වී තිබුණි. මේ වසරේ සිට ඉදිරි වසර 3 ම (2026, 2027, 2028) ආවරණය වන පරිදි Master Procurement Plan එක සකස් කරමින් පවතින බවත් සඳහන් විය.

2.4 <u>ශිෂ්‍යත්ව සහ පාසල් උපකරණ ලබාදීමේ වැඩසටහන:</u> විදේශගත ශ්‍රමිකයන්ගේ දරුවන්ට ලබාදෙන ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවීම හා අයදුම්පත් භාරගන්නා ක්‍රමවේදය අනුව පුවත්පත්, වෙබ් අඩවි, සමාජ මාධ්‍ය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිටින සංවර්ධන නිලධාරීන් හරහා මේ සම්බන්ධ දැනුවත් කිරීම් සිදු කරනු ලබයි. මාර්ගගත ක්‍රමවේද මෙන්ම භෞතිකවද අයදුම්පත් ඉදිරිපත් කිරීමට පහසුකම් සලසා ඇත. සුදුසුකම් ලබන සියලුම දරුවන්ට ශිෂ්‍යත්ව ලබාදීමට කටයුතු කරනු ලබයි.

2.5 <u>විදේශගත ශ්‍රමිකයන්ගේ ඉලක්ක සංඛ්‍යාව සංශෝධනය කිරීම</u> මීට පෙර පැවති ලක්ෂ 3 ක විදේශගත ශ්‍රමිකයන්ගේ ඉලක්කය ලක්ෂ 2.5 දක්වා අඩු කර තිබුණි.

මැදපෙරදිග පවතින ගෝලීය යුද්ධය තත්ත්වයන්, කොවිඩ් පශ්චාත් කාලයේ තිබූ අධික ඉල්ලුම සාමාන්‍ය තත්ත්වයට පත්වීම සහ පැමිණීමේ වීසා (Visit Visa) මගින් ගොස් රැකියා ලබාගන්නා පිරිස් නිල දත්තවලට ඇතුළත් නොවීම මීට බලපා ඇත. ජපානය, රොමේනියාව වැනි නියෝජිත නොවන නව වෙළඳපොළවල් වෙත අවධානය යොමු කරමින් පවතී. රැකියා සඳහා තරුණ ප්‍රජාව පුහුණු වීම අඩු මට්ටමක පවතින බවත් සඳහන් විය.

2.6 <u>නීති විරෝධී / නියාමනය නොකළ විදේශගතවීම් (Informal Migration) පාලනය:</u> සංචාරක වීසා හරහා නීති විරෝධී ලෙස විදේශගතවීම් පාලනය කිරීමට, ගුවන්තොටුපළ පරිශ්‍රයේදී පරීක්ෂාවන් දැඩි කර ඇති අතර නීත්‍යානුකූල සංක්‍රමණ සඳහා අභිප්‍රේරණයක් සිදුකරනු ලබයි. ජපානය සහ රොමේනියාව වැනි රටවලට යන ශ්‍රමිකයන්ට විශේෂිත පුහුණු (Country-specific training) ලබාදීම ආරම්භ කළ බවත් නීත්‍යානුකූල නොවන විදේශගතවීම් පාලනය කිරීම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට තනිව සිදුකළ හැකි කාර්යයක් නොවන බවත් සඳහන් විය. කාර්යාංශයේ ලියාපදිංචි විගමණිකයන්ට ගෙවන රක්ෂණ වන්දිය රු. ලක්ෂ 6 සිට රු. ලක්ෂ 20 දක්වා වැඩි කිරීමටත් ඔවුන්ට ලබාදෙන බැංකු ණය පහසුකම් වැඩි කරමින් නීත්‍යානුකූල මාර්ග වෙත යොමු කරවා ගැනීමට කටයුතු කරමින් සිටින බවත් සභාපතිවරයා ප්‍රකාශ කළේය.

2.7 <u>පුහුණු ශ්‍රමිකයින් විදේශගත කරවීම:</u> ශ්‍රමිකයින් පුහුණු කිරීමට කාර්යාංශයට හැකියාවක් නොමැති අතර එය ආයතනයේ විෂය පථයට අයත් නොවේ. ආයතනයේ කාර්යභාරය වනුයේ විගමණිකයෙක් වශයෙන් විදේශගතවීමට තෝරාගත් අයෙකුට අවශ්‍ය හැඩගැසීමක් orientation සැපයීම පමණක් බව කාර්යාංශයේ සභාපතිවරයා ප්‍රකාශ කළේය.

2.8 <u>ලියාපදිංචි නොවී විදේශගත වන ශ්‍රමිකයන්ගේ පැමිණිලි සහ සුහසාධනය:</u> විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සමථ අංශය (Conciliation Division) මගින් සෘජුව පැමිණිලි භාරගනු ලබන්නේ කාර්යාංශයේ ලියාපදිංචි වූ ශ්‍රමිකයන්ගේ පමණකි. ලියාපදිංචි වී නොමැති වුවද, යමෙකු විදේශගත වීමට පෙර මුදල් දී යම් වංචාවකට ලක්ව ඇත්නම් සහ ඒ පිළිබඳ සාක්ෂි සහිතව පැමිණිලි කළහොත්,

කාර්යාංශයේ ඇති විශේෂ විමර්ශන අංශය (Special Investigation Division) මගින් ඒ පිළිබඳ පරීක්ෂණ පවත්වනු ලැබේ. ලියාපදිංචි නොවී විදේශගත වූ සියලුම ශ්‍රමිකයන්ගේ පැමිණිලි භාරගැනීම සහ විමර්ශනය කිරීම විදේශ කටයුතු අමාත්‍යාංශයේ කන්සියුලර් අංශය (Consular Division) මගින් සිදු කරනු ලබයි.

එමෙන්ම විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ විදේශ කටයුතු අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය එක්ව හඳුන්වා දී ඇති **"Lanka Connect"** යෙදවුම මගින් ඕනෑම අයෙකුට මාර්ගගත ක්‍රමයට පැමිණිලි ඉදිරිපත් කළ හැකිය.

2.9 <u>එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ඕමානය වෙත සංචාරක වීසා මත විදේශගත වීම :</u> සංචාරක වීසා මත රැකියා ගිවිසුම් රහිතව එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ඕමානය යන රටවලට ගෘහ සේවය සඳහා ශ්‍රමිකයින් විදේශගත කර තිබුණි.
එම විදේශගත කිරීම්, ගිවිසුම් රහිතව කිසිවෙකු විදේශගත කර නොමැති බවත් මෙම රැකියා, ගිවිසුම් සහිතව, සංචාරක වීසා මත විදේශගත වූ අවස්ථාවන් වන බවත් එය Tadbeer ක්‍රමවේදය යටතේ සිදුකළ බඳවාගැනීම් වන බවත් සඳහන් විය.

එමෙන්ම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ මත කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර එම ක්‍රමවේදය නීත්‍යානුකූලව විධිමත් කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

2.10 <u>විදෙස්ගත ශ්‍රමිකයින් සඳහා විදේශයන්හිදී සහන සැලසීම:</u> විදේශයන්හිදී ගැටලු හා කරදරවලට මුහුණ පාන ශ්‍රමිකයින් සඳහා සුහසාධන සහන සපයනු ලැබේ. විදේශයන්හිදී ගැටලුවලට මුහුණ පාන ශ්‍රමිකයින් සඳහා තානාපති කාර්යාල යටතේ පවත්වාගෙන යනු ලබන "සුරක්ෂා"නිවාස මගින් සහන සලසන අතර මෙම සුරක්ෂා නිවාස කාන්තාවන් සඳහා පමණක් සීමා වී ඇත. ලියාපදිංචි විගමණිකයින් පමණක් එම ව්‍යාපෘතියට ඇතුළත් කර ගන්නා බවත් ප්‍රකාශ විය.

යම් හෙයකින් ලියාපදිංචි නොවී විදේශගත වූ අයෙකු විදේශ රටකදී ගැටලුවකට මුහුණ දුන් විට, එරට තානාපතිවරයාට සෑහීමකට පත්වීමට හැකි මට්ටමේ කරුණු ඉදිරිපත්වුවහොත් පමණක් කාර්යාංශය විසින් නඩත්තු කරනු ලබන සුබසාධන කඳවුරට ඔවුන්

ඇතුළත් කරගැනීමටත් ඔවුන්ට අවශ්‍ය පහසුකම් සලසන නමුත් නීතිමය සීමාවන් හේතුවෙන් ඔවුන් ආපසු මෙරටට ගෙන්වා ගැනීමේ ගුවන් ප්‍රවේශපත්‍ර වියදම් කාර්යාංශ අරමුදල්වලින් දැරිය නොහැකි බවත් සඳහන් විය.

35. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
(අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දිනය- 2026 සැප්තැම්බර් 10 දින

පැමිණ සිටි
ගරු දිනේෂ් හේමන්ත මහතා පා.ම., (සභාපති),
ගරු ලක්මාලි හේමවන්ද මෙනෙවිය

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනික පසුබිම සහ ඉතිහාසය

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය වසර 55ක දීර්ඝ ඉතිහාසයක් සහිත ආයතනයක් වන අතර, 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත මගින් පිහිටුවා ඇත. ජාතික ආධුනිකත්ව පුහුණු කිරීම් වැඩසටහන් පැවැත්වීම, ජාතික නිපුණතා ප්‍රමිතීන් (National Standards of Competency) සකස් කිරීම, පාඨමාලා සැලසුම් කිරීම, පරීක්ෂණ පැවැත්වීම සහ NVQ සහතික නිකුත් කිරීමේ ව්‍යවස්ථාපිත බලතල ආයතනය සතු වේ.

2. අනු කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

2.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා පස් අවුරුදු උපායමාර්ගික සැලසුම අතර පවතින නොගැලපීම: පස් අවුරුදු උපායමාර්ගික සැලසුමේ (Strategic Plan) කර්මාන්ත පදනම් කරගත් පුහුණු ඉලක්කය 1,350ක් ලෙසත්, වාර්ෂික ක්‍රියාකාරී සැලසුමේ එය 27,070ක් ලෙසත් සඳහන් වී තිබුණි.

2.2 උපායමාර්ගික සැලසුම සකස් කිරීම (Formation of Strategic plan): ආයතනික සැලසුම් පෞද්ගලික අංශය, දෙමාපියන්, කර්මාන්තකරුවන් සහ ආයතනයේ ඉහළ සිට පහළ සියලු නිලධාරීන්ගේ ස්වේච්ඡා දායකත්වයෙන් ආයතනය විසින්ම සකස් කර තිබුණි.

2.3 විදේශ රැකියා අවස්ථා සහ සුදුසුකම් ලත් ශ්‍රමිකයින්ගේ හිඟය: වෙල්ඩර්වරුන්ගේ හිඟයක් පවතින අතර ඒ සඳහා අවශ්‍ය සුදුසුකම් ලත් පිරිසක් (Qualified team) නොමැත. ඒ සඳහා භාෂා සහ තාක්ෂණික සුදුසුකම් සපිරීම සඳහා ජපන්-ටෙක් හි ජපන් භාෂා සහ ඉංග්‍රීසි පාඨමාලා ආරම්භ කර තිබුණි. තවද, කටුබැද්ද කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ වෙල්ඩින් පාඨමාලාව සඳහා ධාරිතාව වැඩි කර මාස 2-3ක

මූලික පුහුණුවක් ලබා දී කර්මාන්ත වෙත යොමු කිරීමට ද කටයුතු කරමින් සිටී.

2.4. <u>ජපන්-ටෙක් / ජර්මන්-ටෙක් වැනි ආයතන තවදුරටත් ස්ථාපනය කිරීමට කටයුතු කිරීම</u>: දැනට පවතින පුහුණු මධ්‍යස්ථාන 42 ඇගයීම් මධ්‍යස්ථාන (Assessment Centers) බවට පත්කිරීමටත්, ලබන වසරේ අයවැයෙන් ජාතික මට්ටමේ විශේෂිත මධ්‍යස්ථාන 2ක් (National Special Centers) බිහි කිරීමටත්, අමාත්‍යාංශය සමඟ එකතු වී නව සැලසුම් සකස් කරමින් සිටී.

2.5. <u>පාසල් අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව සම්බන්ධ කිරීම</u>: නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ පාසල්වල 8, 9, 10 වසරවල සිටම වෘත්තීය අධ්‍යාපනයට දරුවන් යොමු කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණයක් පවත්වාගෙන ගනිමින් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා NAITA ආයතනයේ සම්පූර්ණ සහය ලබාදෙයි. අ.පොෂ (සා.පෙළ) විභාගයෙන් පසුව ශිෂ්‍යයින් ආධුනිකත්ව පුහුණු සඳහා යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව සභාපතිවරයා ප්‍රකාශ කළේය. එම නිසා පාසල් මට්ටමේදී මූලික මඟපෙන්වීම ලබා දී පසුව ආධුනිකත්වයට යොමු කිරීමට සැලසුම් කර ඇත. ඉදිරියේදී නව තාක්ෂණය හරහා විශාල රැකියා ප්‍රමාණයක් ජනිතවන බැවින් එම රැකියා වෙළඳපොළ ඉලක්ක කරගනිමින් නව තාක්ෂණය සඳහා විශාල ආයෝජනයක ඇති අවශ්‍යතාවය හඳුනාගෙන ඇත.

2.6 <u>නේවාසිකාගාර පහසුකම්:</u> ග්‍රාමීය ප්‍රදේශවලින් ආධුනිකත්ව පුහුණුව සඳහා පැමිණෙන ශිෂ්‍යයින්ට නේවාසිකාගාර පහසුකම් ආයතනය සතුව පවතී.

2.7 NAITA <u>ආයතනය පිහිටුවා ඇති 1990 අංක 20 දරන පනත සංශෝධනය කිරීම:</u> 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත සංශෝධනය කිරීමට හා ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘතියක් යටතේ ඉදිරි අවුරුදු 10 සඳහා සැලැස්මක් සකස් කිරීමේදී TVET ක්ෂේත්‍රයේ සියලුම ආයතනවල පනත් යාවත්කාලීන කිරීමට යෝජනා වී ඇත.

2.8 <u>කාර්ය මණ්ඩල පුරප්පාඩු සහ වැටුප් සම්බන්ධයෙන් පවතින ගැටලු:</u> කාර්ය මණ්ඩල පුරප්පාඩු 453 ක් පවතින අතර (පරීක්ෂකවරුන් සහ උපදේශකවරුන්) වැටුප් විෂමතා පිළිබඳ ගැටලුද පවතී.

කථිකාචාර්ය (Lecturer), උපදේශක (Instructor) හා පරීක්ෂක (Inspector) යන අධ්‍යයන කාර්යමණ්ඩලය විශාල වශයෙන් ආයතනය හැරයන අතර පෞද්ගලික අංශයට සාපේක්ෂව රාජ්‍ය අංශයේ වැටුප් මට්ටම ඉතා අඩු මට්ටමක පැවතීම ඊට හේතු වී තිබුණි.

<u>කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ කරුණු දැක්වීම.</u>

වැටුප් විෂමතා සම්බන්ධ ගැටලුව නිරාකරණය කර ගැනීම සඳහා බඳවා ගැනීමේ පටිපාටි සංශෝධනය කළ යුතු බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් පැමිණ සිටි නිලධාරිනිය සඳහන් කළාය.

2.9 <u>ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) සඳහා ඇති පිළිගැනීම</u> : NVQ 4 සුදුසුකම උසස් පෙළට සමාන ලෙස සැලකෙන නමුත් යම් රැකියාවක් සඳහා බඳවා ගැනීමේ දී එම කරුණ සැලකිල්ලට නොගැනීම.

ඒ සම්බන්ධ යෝජනාවක් හා සියලුම ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විශේෂ දීමනාවක් (Special allowance) ලබාදීම සඳහා අමාත්‍යාංශය හරහා යෝජනාවක් ඉදිරිපත් කර තිබුණි.

2.10 <u>ලංකා ගමනාගමන මණ්ඩලය (CTB) සඳහා කාර්මික ශිල්පීන් සැපයීම හා රෝහල් සඳහා සාත්තු සේවකයින් සැපයීම:</u> ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීම් අධිකාරිය හරහා ලංකා ගමනාගමන මණ්ඩලය වැනි ආයතන වෙත ද ආධුනිකයින් පුහුණු කිරීම සඳහා යොමුකිරීමට හා රෝහල්වල සාත්තු සේවක තනතුරු සඳහා පුහුණු කිරීමට රාජ්‍ය මට්ටමේ ප්‍රතිපත්තිමය තීරණයක් ලබා ගත යුතු බව අවධාරණය විය.

2.11 <u>මූල්‍ය ප්‍රතිපාදන භාවිතය සහ ප්‍රගතිය :</u> මෙවර රජයේ වාර්ෂික අයවැයෙන් වෙන්කළ මිලියන 431න් දැනටමත් මිලියන 224ක මිලදී ගැනීමේ නියෝග (Purchase orders) නිකුත් කර තිබුණි. වසර අවසන් වන විට 90%කට වඩා වැඩි ප්‍රගතියක් ලබාගත හැකි බව නිරීක්ෂණය විය.

3. <u>අනුකාරක සභාව විසින් ලබා දුන් නිර්දේශ</u>

- **<u>සමාජ ආකල්ප (Social Stigma) වෙනස් කිරීම:</u>** NAITA හරහා සාර්ථක වූ පුද්ගලයන්ගේ අත්දැකීම් (Success stories) වීඩියෝ/Zoom තාක්ෂණය මගින් විදුහල්පතිවරුන් සහ දෙමාපියන් සමග බෙදාගනිමින් ඍණාත්මක ආකල්ප දුරු කිරීමට ප්‍රචාරණ පියවර ගැනීම.

- **<u>NVQ පිළිගැනීම සහ විශේෂ දීමනාව</u>:** NVQ 4 සුදුසුකම රැකියා බඳවාගැනීම්වලදී සලකා බැලීම සඳහා වන යෝජනාවක් අනු කාරක සභාවේ නිර්දේශයක් ලෙස අදාළ අංශ වෙත යොමු කිරීම සඳහා ඉදිරිපත් කිරීම.

- **<u>රාජ්‍ය ආයතන සඳහා පුහුණු ශ්‍රමිකයන් සැපයීම</u>:** ලංකා ගමනාගමන මණ්ඩලයේ (CTB) ඩිපෝවල පවතින කාර්මික ශිල්පීන්ගේ හිඟයට සහ රෝහල් සඳහා සාත්තු සේවක (Caregiver) තනතුරු සඳහා ආධුනිකයන් පුහුණු කර යොමු කිරීම පිළිබඳව ප්‍රතිපත්තිමය තීරණයක් සඳහා අමාත්‍යාංශය හරහා යෝජනාවක් ඉදිරිපත් කිරීම.

36. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ත අධිකාරිය

(බලශක්ති අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දිනය: 2026 සැප්තැම්බර් 11 දින

පැමිණ සිටි:
ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම., (අනුකාරක සහා සභාපති)
ගරු ජගත් මනුවර්ණ මහතා, පා.ම.,

අනුකාරක සහා සභාපතිවරයාගේ අවසරය මත පැමිණ සිටි
ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම.,
ගරු දිනේෂ් හේමන්ත මහතා. පා.ම.,

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ප්‍රධාන උපායමාර්ගික ඉලක්ක හා වත්මන් තත්ත්වය

- **පසුබිම සහ සංවර්ධන සැලැස්ම (2025–2030):** 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනත යටතේ මෙම ආයතනය පිහිටුවා ඇත. 2025-2026 කාල සීමාව තුළ වහල මත සූර්ය බලශක්තිය මෙගාවොට් 2502ක් සහ භූමිය මත සවිකළ සූර්ය බලශක්තිය මෙගාවොට් 461ක් පද්ධතියට එකතු කර ඇත. මෙමඟින් රැකියා 51,000ක් නිර්මාණය වී, වසරකට ඩොලර් බිලියන 1.5ක පමණ විදේශ විනිමය ඉතිරියක් සිදුවේ.
- **සංයුක්ත සැලැස්ම සහ අයවැය (2026):** පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය, ඉල්ලුම කළමනාකරණය, අඩු කාබන් පරිවර්තනය, මූල්‍යකරණය සහ පර්යේෂණ ප්‍රවර්ධනය ඇතුළු ප්‍රධාන ඉලක්ක 7ක් යටතේ සංයුක්ත සැලැස්ම සකසා ඇත. 2026 වසර සඳහා සමස්ත ඇස්තමේන්තුගත ආදායම රුපියල් මිලියන 656.01ක් වන අතර, ශුද්ධ වියදම වන රුපියල් මිලියන 2,772.25ක මුදල රජයේ ප්‍රතිපාදන සහ 66%ක් පමණ වන විදේශ ප්‍රදාන මගින් මූල්‍යනය කෙරේ.
- **ප්‍රධාන අභියෝග:** බැටරි බලශක්ති ගබඩා පද්ධති (BESS) ස්ථාපනය කිරීම, උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල විදුලි සම්ප්‍රේෂණ මාර්ග ශක්තිමත් කිරීම, පුරෝකථන පද්ධති ස්ථාපනය කිරීම සහ ස්මාර්ට් මීටර් පද්ධති ව්‍යාප්ත කිරීම වැනි අභියෝග පවතී.

2. කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

- **2030 බලශක්ති ඉලක්කය සහ අභියෝග:** 2026 වසරේ වාර්ෂික සුනිත්‍ය බලශක්ති සැපයුම 60%ක් පමණ වන බවත්, 2030 වන විට එම අගය 70% දක්වා වර්ධනය කරගැනීමේ නිත්‍ය ඉලක්කයක් පවතින අතර එම අගය 90% දක්වා වර්ධනය කරගැනීමේ අවස්ථා ආයතනය මගින්

හඳුනාගෙන ඇති බවත් ඊට බලපාන අභියෝග මඟ හරවා ගැනීමට අදාළ සාකච්ඡා සිදු කරමින් පවතින බවත් ආයතනය පැවසීය.

- **<u>බලශක්ති පිරිවැය සංසන්දනය</u>:** එක් විදුලි ඒකකයක් ජනනය කිරීම සඳහා ඩීසල් මගින් රුපියල් 120ක් පමණ මුදලක් සහ නැප්තා/ෆර්නස් භාවිතයෙන් රුපියල් 60-70ක් පමණ මුදලක් වැයවන බවත්, ජල විදුලියෙන් එම අගය රුපියල් 2-3 ක් පමණ, සුළං බලයෙන් රුපියල් 15 ක් පමණ සහ සූර්ය බලයෙන් රුපියල් 20 ක් පමණ අඩු මුදලක් බවත් ආරම්භක ආයෝජන පිරිවැය ආවරණය වූ පසු ඉන්ධන පිරිවැයක් නොමැති බැවින් දීර්ඝකාලීනව ලාභදායී වන්නේ පුනර්ජනනීය බලශක්තිය බවත් ආයතනය ප්‍රකාශ කරන ලදී.
- **<u>ප්‍රජාශක්ති හා සමූපකාර කුඩා විදුලි ජාල(Cooperative Mini-grids):</u>** ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීම සඳහා ගම්මාන මට්ටමින් වහල මත සූර්ය පැනල සහ පොදු බැටරි පද්ධති සමූපකාර/ප්‍රජාශක්ති ආකෘතියකට සවි කිරීමට අනුකාරක සභාව යෝජනා කළ අතර ඊට අවශ්‍ය තාක්ෂණික සහය, ටෙන්ඩර් ලේඛන සහ උපදෙස් ලබා දීමට ආයතනය සූදානම් බව ප්‍රකාශ කරන ලදී.
- **<u>ආයතනික අරමුදල්</u>:** පනතින් අනුමත කර ඇති ඩීසල් ලීටරයකින් සෙස් බද්ද අය කර ගැනීමට අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අමාත්‍යාංශයට යොමු කළ බවත් වර්තමානයේ වෙළඳපොල තුළ මිල උච්චාවචනයක් පවතින බැවින් පසුකාලීනව නැවත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමු කිරීමට උපදෙස් ලැබී ඇති බවත් සුනිත්‍ය බලශක්ති ව්‍යාපෘතිවලින් 1%ක රාජ්‍ය භාගය (Royalty) ලබා ගැනීමේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව යොමු කිරීමට කටයුතු කරන බවත් ආයතනය ප්‍රකාශ කරන ලදී.
- **<u>ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීම</u>:** 2007 පැරණි ව්‍යුහය වෙනුවට සමස්ත ආයතනයම ප්‍රතිව්‍යුහගත කර වර්තමාන තාක්ෂණික අවශ්‍යතාවලට ගැළපෙන ලෙස ආයතනික කාර්ය මණ්ඩලය යාවත්කාලීන කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමි වී ඇති බව ආයතනය පැවසීය.

3. <u>ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම</u>

- **<u>සමාලෝචන යාන්ත්‍රණය</u>:** ආයතනික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම, අයවැය සහ මානව සම්පත් සැලැස්ම යන සියල්ල අධ්‍යක්ෂ මණ්ඩලය, විෂය භාර අමාත්‍යාංශය සහ විගණන හා කළමනාකරණ කමිටු ආදී අදාළ ආයතන මගින් නිරන්තරයෙන් සමාලෝචනය විය යුතු බව.
- **<u>ව්‍යාපෘති ප්‍රගතිය</u>:** ව්‍යාපෘති ප්‍රගතියේ පවතින අඩුපාඩු ලෙස රුපියල් මිලියන 7ක වටිනාකමකින් යුත් ව්‍යාපෘතිවල කිසිදු ප්‍රගතියක් පෙන්නුම් කර නොමැති අතර ප්‍රතිශතාත්මකව 1% ත් 20% ත් අගයන් අතර ප්‍රගතියක් පෙන්නුම් කරන එක් ව්‍යාපෘතික් ද රුපියල් මිලියන 19.6ක

වටිනාකමකින් යුත් ව්‍යාපෘති 6ක ප්‍රගතිය 21% ත් 40% ත් අතර මට්ටමක ද රුපියල් මිලියන 62.5ක ව්‍යාපෘතිවල ප්‍රගතිය 41% ත් 60% ත් අතර ද පවතින බවත්, රුපියල් මිලියන 2,603ක වටිනාකමකින් යුත් ව්‍යාපෘතිවල 81% ත් 100% ත් අතර ප්‍රශස්ථ ප්‍රගතියක් වාර්තා වී ඇති බවත් ප්‍රකාශ විය.

- **<u>පූර්ව සූදානම් හා ප්‍රසම්පාදන සැලසුම්</u>:** ව්‍යාපෘතියක් ආරම්භයේ සිට අවසාන ප්‍රතිඵලය දක්වා මාර්ග සිතියම පෙන්නුම් කරන සූදානම් වීමේ ක්‍රියාකාරකම් ඇතුළත් සැලසුම් සකස් විය යුතු බව හා ප්‍රසම්පාදන සැලැස්මේ හදිසි සහ ප්‍රමුඛතා ප්‍රසම්පාදනයන් වෙන්කර හඳුනාගෙන අමාත්‍යාංශයට සහ ප්‍රසම්පාදන කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු බව හා නිල වෙබ් අඩවියේ පළවිය යුතු බව.

4. <u>අනුකාරක සභාවේ ප්‍රධාන නිර්දේශ</u>

- ග්‍රාමීය ජනතාවගේ ආදායම් මාර්ග වර්ධනය කිරීම සඳහා සහනයක් ලෙස, ගම්මාන මට්ටමින් වහල මත සූයී පැනල සවි කර ප්‍රජාශක්ති හෝ සමුපකාර ආකෘතියේ කුඩා විදුලි ග්‍රිඩ් සහ බැටරි ගබඩා පද්ධති ස්ථාපනය කිරීමට පියවර ගැනීම උචිත බව.
- සුනිත්‍ය බලශක්තිය ජාතික මෙහෙයුමක් බවට පත්කර ගැනීමට අවධානය යොමු කිරීම වැදගත් බව.
- ආයතනික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, අයවැය, ප්‍රසම්පාදන සැලැස්ම සහ මානව සම්පත් සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ, විෂය භාර අමාත්‍යාංශයේ සහ විගණන හා කළමනාකරණ කමිටුවල නිරන්තර සමාලෝචනයට ලක්විය යුතු බව.
- ව්‍යාපෘති ආරම්භයේ සිට අවසන් ප්‍රතිඵලය දක්වා ගමන් කරන මාර්ග සිතියම පැහැදිලි වන පරිදි පූර්ව සූදානම් ක්‍රියාකාරකම් සහ ක්‍රියාත්මක කිරීමේ සැලසුම් සකස් විය යුතු බව.
- ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම ආයතනික සැලැස්මට අනුකූලව සකස් විය යුතු අතර, හදිසි සහ ප්‍රමුඛතා ප්‍රසම්පාදනයන් වෙනම හඳුනාගෙන ඒවා අමාත්‍යාංශයට, ප්‍රසම්පාදන කොමිෂන් සභාවට ඉදිරිපත් කර ආයතනික වෙබ් අඩවියේ පළ කිරීමට කටයුතු කළ යුතු බව.

37. වී අලෙවි මණ්ඩලය
(කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය)

පරීක්ෂා කළ දිනය: - 2026 සැප්තැම්බර් 11 දින

පැමිණ සිටි:
ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම. (අනුකාරක සභා සභාපති)
ගරු ජගත් මනුවර්ණ මහතා**,** පා.ම.**,**

අනුකාරක සභා සභාපතිවරයාගේ අවසරය මත පැමිණ සිටි
ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**,** පා.ම.**,**
ගරු දිනේෂ් හේමන්ත මහතා. පා.ම.**,**

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

- **පසුබිම හා ගබඩා පහසුකම්:** 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනතින් පිහිටුවන ලද වී අලෙවි මණ්ඩලය, ගොවීන්ගෙන් වී මිලදී ගැනීම, ගබඩා කිරීම හා සංරක්ෂණය, පාරිභෝගිකයාට සහල් අලෙවිය සහ සහල් වෙළඳපොළ නියාමනය සිදු කරයි. අනුමත සේවක සංඛ්‍යාව 230ක් වුවද දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 134කි. දිවයින පුරා ගබඩා 306ක් පවතින අතර, මෙට්‍රික් ටොන් 171,343ක වී තොග ගබඩා කර ඇත.
- **සංයුක්ත සැලැස්ම හා ඩිජිටල්කරණය:** 2026-2030 සංයුක්ත සැලැස්ම යටතේ ආයතනික ශක්තිමත් කිරීම, ඩිජිටල්කරණය, ගබඩා පහසුකම් ප්‍රතිසංස්කරණය සහ වෙළඳපොළ මැදිහත්වීම යනාදිය ඉලක්ක කර ඇත. තත්‍ය කාලීන දත්ත සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය ඇතුළු ආයතන සමඟ එක්ව 'COPIX' ඩිජිටල් දත්ත පද්ධතිය සකස් කරමින් පවතී.
- **මූල්‍ය කාර්යසාධනය හා ප්‍රසම්පාදනය:** 2026 වසරේ වී මිලදී ගැනීමට භාණ්ඩාගාරය මඟින් රුපියල් මිලියන 15,500ක ප්‍රතිපාදන සපයා දී ඇති අතර, 2026 දී මෙට්‍රික් ටොන් 140,720ක වී ප්‍රමාණයක් මිලදී ගෙන ඇත. 2026 ප්‍රසම්පාදන සැලැස්ම සඳහා රුපියල් මිලියන 183.46ක් වෙන් කර ඇත.

2. කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

- **වෙළඳපොළ පංගුව සහ පැරණි වී තොග:** මණ්ඩලයේ වත්මන් සහල් වෙළඳපොළ පංගුව 3%ක් පමණ වන අතර, කුඩා හා මධ්‍ය පරිමාණ වී

මෝල් හිමියන්ට සහන ණය ලබා දී ශක්තිමත් කිරීම තුළින් රාජ්‍ය හා සමූපකාර මැදිහත්වීම 10% දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ. ලංකා සතොස සතු සීමිත ධාරිතාව හේතුවෙන් ගබඩාවල පැවති පැරණි වී තොග වෙළඳපොළට නිකුත් කිරීම ප්‍රමාද වූ බවත්, මෙම තොග කඩිනමින් වෙළඳපොළට නිකුත් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් සිටින බවත් ආයතනය පැවසීය.

- **<u>අක්‍රිය වී මෝල් සහ නීතිමය ගැටලු:</u>** කැකිරාව වී මෝල වැනි බදු දුන් දේපළවල බදු කාලය අවසන් වුවද ඒවාහි අනීතික ලෙස රැඳී සිටින බවත්, කොන්ත්‍රාත් පදනම මත හෝ නීති නිලධාරියෙකු බඳවාගෙන ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා හරහා ඒවා නැවත ලබා ගැනීමටත්, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ සංවර්ධනය කිරීමටත් සැලසුම් කර ඇති බව ආයතනය පැවසීය.

3. <u>ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම</u>

- **<u>සැලසුම් හා ප්‍රසම්පාදන අඩුපාඩු</u>**: 1971 පනතේ සඳහන් පොදු අරමුණු සියල්ල සංයුක්ත සැලැස්මට ඇතුළත් නොවීම, සහල් දත්ත පිළිබඳ තත්‍ය කාලීන පද්ධතියක් නොමැති වීම, ප්‍රසම්පාදන කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කර නොතිබීම සහ විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් නොකිරීම ජාතික විගණන කාර්යාලය පෙන්වා දුන්නේය. පවතින සේවක හිඟය හමුවේ අභ්‍යන්තර නිලධාරීන්ගෙන් ප්‍රසම්පාදන ඒකකයක් ස්ථාපිත කිරීමට පියවර ගන්නා බව මණ්ඩලය පිළිතුරු දුන්නේය.

4. <u>අනුකාරක සභාවේ ප්‍රධාන නිර්දේශ</u>

- ජාතික විගණන කාර්යාලය පෙන්වා දුන් නිරීක්ෂණවලට අනුකූලව ආයතනික සැලසුම් යාවත්කාලීන කිරීම.
- ඉදිරි කන්නයේ වී මිලදී ගැනීම් ආරම්භ කිරීමට පෙර දැනට ගබඩාවල පවතින පැරණි වී තොග නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- වී නිෂ්පාදනය සහ ගබඩා තොග යනාදිය පිළිබඳ තත්‍ය කාලීන දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම.
- කොන්ත්‍රාත් පදනම මත හෝ නීති නිලධාරියෙකු අනුයුක්ත කර මණ්ඩලයේ දේපළ නැවත ලබා ගැනීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.
- පවතින සේවක පුරප්පාඩු කඩිනමින් පූරණය කිරීමට කටයුතු කිරීම.

38. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
(බලශක්ති අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දිනය: 2026 සැප්තැම්බර් 22 දින

පැමිණ සිටි:
ගරු සුජීව දිසානායක මහතා, පා.ම., (අනුකාරක සභා සභාපති)
ගරු රුවන් මාපලගම මහතා, පා.ම.,

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

- **පසුබිම හා නීතිමය පදනම:** 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ (CPC) ප්‍රධාන අරමුණ වන්නේ ඛනිජ තෙල් ආනයනය කිරීම, ගබඩා කිරීම, බෙදාහැරීම, විකිණීම සහ ඛනිජ තෙල් ගවේෂණ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාමයි.
- **ආයතනික ව්‍යුහය හා හිමිකාරිත්වය:** සංස්ථාව යටතේ ප්‍රධාන අනුබද්ධ සමාගම් 02ක් ක්‍රියාත්මක වේ. ඒ අනුව ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ (CPSTL) 67%ක හිමිකාරිත්වය සහ ත්‍රිකුණාමලයේ පිහිටි Trinco Petroleum Terminal Limited (TPTL) හි 51%ක හිමිකාරිත්වය සංස්ථාව සතුවේ.
- **මෙහෙයුම් හා ජාලකරණය:** දිවයින පුරා ඉන්ධන පිරවුම්හල් 887ක් ක්‍රියාත්මක වන අතර, ඩෙල්ෆ් දූපත වැනි දුරස්ථ ප්‍රදේශවල ද ජාතික වගකීමක් ලෙස සේවාව පවත්වාගෙන යයි. මීට අමතරව ගුවන් යානා ඉන්ධන, නැව් ඉන්ධන සැපයුම, ලිහිසි තෙල්, කෘෂි රසායනික ද්‍රව්‍ය, විද්‍යුත් වාහන ආරෝපණය සහ තිරසාර ඉන්ධන අංශ ඔස්සේ ව්‍යාපාරික කටයුතු ව්‍යාප්ත කර ඇත.
- **මූල්‍ය හා මෙහෙයුම් කාර්යසාධනය (2025):** 2025 වසරේදී මුළු ආදායම රුපියල් බිලියන 841ක්, ශුද්ධ ලාභය රුපියල් බිලියන 36ක් සහ මුළු වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 247ක් විය. අලෙවි කළ මුළු ඉන්ධන පරිමාව ලීටර් මිලියන 4,145ක් වූ අතර, පිරිපහදුව මඟින් ලීටර් මිලියන 2,116ක් නිෂ්පාදනය කර ඇත.
- **ආයතනික සැලැස්ම (2025–2030):** උපායමාර්ගික සැලැස්ම ප්‍රධාන ඉලක්ක 07ක්, අරමුණු 16ක් සහ ක්‍රියාකාරකම් 48කින් සමන්විත වේ.

2. <u>කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම</u>

- **<u>පනත හා සේවක අනුකූලතාව</u>:** 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත 2003 සහ 2022 වසරවලදී සංශෝධනය වී ඇති අතර වර්තමාන තාක්ෂණික ප්‍රමිතීන්ට ගැලපෙන පරිදි කායී මණ්ඩලය විධිමත් කර ඇති බවත් බලශක්ති ආරක්ෂණයට ගැළපෙන පරිදි සංශෝධනයන් කිරීමට සිදු වන බවත් ආයතනය පැවසීය.
- **<u>ගුවන්යානා ඉන්ධන හා ණය පාලනය</u>:** පැවති ණය කළමනාකරණය කර ඇති බවත්, ගුවන්යානා ඉන්ධන කලාපයේ අඩුම මිලට ලබාදීමට කටයුතු කර ඇති බවත් ආයතනය ප්‍රකාශ කරන ලදී.
- **<u>ඉන්ධන පිරිපහදුව සහ අතුරු නිෂ්පාදන</u>:** පිරිපහදුවෙන් ඉතිරිවන සල්ෆර් භාවිතයෙන් සල්ෆියුරික් අම්ලය නිපදවා ත්‍රිපල් සුපර් පොස්පේට් පොහොර සෑදීම සහ හරිත හයිඩ්‍රජන් (Green Hydrogen) / LNG භාවිතයෙන් ඉදිරියේදී යූරියා නිපදවීමට ඇති හැකියාව සම්බන්ධයෙන් ආයතනය අදහස් දක්වන ලදී.

3. <u>ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම</u>

- **<u>ප්‍රාග්ධන ව්‍යයදම්වල ප්‍රගතිය</u>:** 2026 අගෝස්තු 31 වන විට ප්‍රාග්ධන ව්‍යයදම් ලෙස රුපියල් මිලියන 184,800ක් පමණ පුරෝකථනය කර තිබුණද, සැබෑ මූල්‍ය ව්‍යයදම ලෙස සටහන් වී ඇත්තේ රුපියල් මිලියන 18,273ක් බව.
- **<u>ක්‍රියාත්මක නොවන පැරණි ව්‍යාපෘති</u>:** 2015/16 වසරවල සිට කිසිදු ව්‍යයදමක් නොමැතිව ඉදිරියට ගෙන එන ලද ව්‍යාපෘති 213ක් හඳුනාගෙන ඇති අතර ඒවා නැවත සමාලෝචනය කර පද්ධතියෙන් ඉවත් කිරීමට පියවර යුතු බව.
- **<u>සැලසුම් අතර අනුකූලතාව</u>:** ආයතනික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම සහ අයවැය එකිනෙකට අනුකූලවන පද්ධතියක් පවතින්නේ නම් නිරීක්ෂණ කටයුතු පහසුවන බව.

4. <u>අනුකාරක සභාවේ ප්‍රධාන නිර්දේශ</u>

- ආයතනය සඳහා පැහැදිලි ප්‍රසම්පාදන සැලැස්මක් නිර්මාණය කළයුතු බවත් ප්‍රධාන ව්‍යාපෘති, හදිසි ව්‍යාපෘති සහ සාමාන්‍ය ව්‍යාපෘති ලෙස නිසි ව්‍යාපෘති වර්ගීකරයක් අවශ්‍ය බව හා නිසි ව්‍යාපෘති කාල රාමුවක් අවශ්‍ය බව.
- 2025 සිට 2028 දක්වා නිර්මාණය කර ඇති උපායමාර්ගික සැලැස්ම 2026-2030 ලෙස නිර්මාණය කිරීම උචිත බව.
- පවත්වාගෙන යන ව්‍යාපෘති සඳහා වෙන්කළ මුදල හා වාර්ෂික ඛනිජ තෙල් ආනයන මුදල මූල්‍ය අයවැයට ඉදිරිපත් කර අනුමැතිය ගැනීම උචිත බව.

- ආයතනික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම සහ අයවැය යන සියල්ල එකිනෙක හා සම්බන්ධ වන පද්ධතියක් පරිදි සකස්කර අධීක්ෂණය පහසු කිරීම.

39. ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම
(බලශක්ති අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දිනය: 2026 සැප්තැම්බර් 22 දින

පැමිණ සිටි:
ගරු සුජීව දිසානායක මහතා, පා.ම. (අනුකාරක සභා සභාපති)
ගරු රුවන් මාපලගම මහතා, පා.ම

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

- **පසුබිම හා මෙහෙයුම් ව්‍යුහය:** 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතින් පිහිටුවන ලද මෙම සමාගම, කොළොන්නාව සහ මුතුරාජවෙල පර්යන්ත 2කින්, ඩිපෝ 11කින් සහ බවුසර් රථ 600කින් සමන්විත වේ. මෙහි හිමිකාරීත්වයෙන් 2/3ක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවටද (CPC), 1/3ක් ලංකා ඉන්දියන් තෙල් සමාගමටද හිමි වේ. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ඉන්ධන බෙදාහැරීමේ සමාගම් 4 සඳහා පොදු පහසුකම් සපයන්නා ලෙසද කටයුතු කරයි.
- **සංයුක්ත සැලැස්ම හා ඩිජිටල්කරණය:** 2025–2029 උපායමාර්ගික සැලැස්ම ප්‍රධාන ඉලක්ක 5කින් සහ අරමුණු 22කින් සමන්විත වන අතර, සමස්ත පද්ධතිය ඩිජිටල්කරණය කිරීම මඟින් කාර්යක්ෂමතාව ඉහළ නංවා ගැනීමට සැලසුම් කර ඇත.
- **මූල්‍ය කාර්යසාධනය හා ප්‍රාග්ධන ව්‍යාපෘති:** 2025 වසරේදී රුපියල් බිලියන 20.52ක ලාභයක් සහ රුපියල් බිලියන 3.84ක ශුද්ධ ලාභයක් ලබා ඇත. 2026 වසර සඳහා අපේක්ෂිත ශුද්ධ ලාභය රුපියල් බිලියන 3.28ක් වන අතර, මුතුරාජවෙල ගබඩා ටැංකි ඉදිකිරීම සහ SAP ERP පද්ධතිය වැඩිදියුණු කිරීම ඇතුළු ව්‍යාපෘති 11ක් ක්‍රියාත්මක වේ.

2. කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

- **පෞද්ගලික සමාගම් ඉන්ධන බෙදාහැරීම සහ ආපදා කළමනාකරණය:** පෞද්ගලික ඉන්ධන සමාගම් ඩීසල් ආනයනය නොකරන අවස්ථාවලදී CPC හරහා අතිරේකව ඉන්ධන ගෙනැවිත් බෙදාහරින බවත්, පෞද්ගලික පිරවුම්හල් පිහිටි ප්‍රදේශ හදුනාගෙන ඊට ආසන්න CPC පිරවුම්හල් වෙත අතිරේක ඉන්ධන තොග ලබා දී ප්‍රදේශයේ ඉන්ධන හිඟයන් වළක්වන බවත් ආයතනය පැවසීය. ගංවතුර වැනි ආපදා අවස්ථාවලදී GPS ලුහුබැඳීමේ පද්ධති සහ ගෝලීය සිතියම්ගත කිරීමේ ක්‍රම මඟින් බවුසර් රථ

විකල්ප මාර්ග ඔස්සේ යොදවා ඉන්ධන බෙදාහැරීම බාධාවකින් තොරව සිදු කරන බව සඳහන් කළේය.

- **<u>දීර්ඝකාලීන සැලසුම් සහ බංකරින් සේවා</u>:** ආසියාවේ විශාලතම පර්යන්තය වීම වෙනුවට සේවා ගුණාත්මකභාවය ඉහළ නංවමින් බංකරින් (Bunkering) සේවා සහ ගුවන්යානා ඉන්ධන අලෙවිය වර්ධනය කිරීමටත්, ඉදිරි වසර දෙක තුළ ගබඩා ධාරිතාව තවත් ඝන මීටර් 126,000කින් එකතු කිරීමටත් අපේක්ෂා කෙරේ.
- **<u>ප්‍රධාන තනතුරුවල පුරප්පාඩු පිරවීම</u>:** ප්‍රධාන තනතුරු රැසක වැඩබැලීමේ තනතුරු පැවතීම සම්බන්ධයෙන් කාරක සභාව විමසූ අතර, 1991 පැරණි බඳවා ගැනීමේ පටිපාටිය වර්තමාන තාක්ෂණික අවශ්‍යතාවලට ගැලපෙන ලෙස යාවත්කාලීන කර කැබිනට් අනුමැතිය ලබාගෙන ඇති බවත්, සේවකයින් 1035 දෙනෙකුගෙන් බහුතරයකගේ පුරප්පාඩු සහ උසස්වීම් පිරවීමෙන් අනතුරුව සෙසු තනතුරු සඳහා ද ඉදිරියේදී බඳවා ගන්නා බවත් ආයතනය පැහැදිලි කළේය.
- **<u>විද්‍යුත් වාහන බලපෑම සහ ඉන්ධන ප්‍රවාහනය</u>:** වෙළඳපොළට විද්‍යුත් (Electronic) වාහන පැමිණීමෙන් ඉන්ධන අලෙවියට තවමත් එතරම් බලපෑමක් වී නැති බවත්, කොරෝනා වසංගතය හා ක්ෂේත්‍ර භාවිතය හේතුවෙන් ඉන්ධන පරිභෝජනය යම් මට්ටමක ස්ථායී වී ඇති බවත් ආයතනය සඳහන් කළේය. එසේම, දුම්රිය ඔස්සේ ඉන්ධන ප්‍රවාහනය කිරීමෙන් බවුසර් ප්‍රවාහනයට වඩා සුවිශේෂී වාසියක් නොමැති බැවින් මිල උච්චාවචනයන් සලකා බලා අවස්ථානුකූලව කටයුතු කරන බව ප්‍රකාශ විය.

3. <u>ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම</u>

- **<u>විගණන නිරීක්ෂණ</u>:** ප්‍රධාන ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා සූදානම් වීමේ සැලැස්මක් (Preparedness Plan) නොතිබීම, සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් නොමැති වීම සහ ආයතනික සැලසුම් එකිනෙක සම්බන්ධ වන ක්ෂේත්‍ර පද්ධතියක් (Aligned Coding System) නොමැති වීම ජාතික විගණන කාර්යාලය ප්‍රධාන වශයෙන් පෙන්වා දුන්නේය. නළ මාර්ග වැනි විශේෂිත තාක්ෂණික ක්ෂේත්‍ර සඳහා දේශීයව ඉංජිනේරුවන් සහ ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් සොයා ගැනීමේ අපහසුව ව්‍යාපෘති ප්‍රමාද වීමට හේතු වූ බව ආයතනය පිළිතුරු දුන්නේය.

4. <u>අනුකාරක සභාවේ ප්‍රධාන නිර්දේශ</u>

- පවතින ආයතනික සැලසුම් 2026-2030 ලෙස යාවත්කාලීන කිරීම සහ ලබන වසරේ සිට 2027-2031 ආදී ලෙස අඛණ්ඩව සංයුක්ත සැලසුම් නිර්මාණය කිරීම.

- ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම හා රටේ සම්පත් ප්‍රයෝජනයට ගනිමින් රජයේ ප්‍රතිපත්තීන්ට අනුකූලව සෙසු වෙළඳපොළ තරඟකාරීත්වයට මුහුණ දෙමින් ආයතනික දියුණුව ළඟා කර ගැනීම.

40. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

(වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දිනය - 2026 සැප්තැම්බර් 22 දින

පැමිණ සිටි:
ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය (අනුකාරක සභා සභාපති), පා.ම.,
ගරු අබූබකර් අතම්බාවා මහතා, පා.ම.

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

- **උපායමාර්ගික සැලැස්ම හා කුළුණු:** 2026.07.07 දින පැවති කාරක සභා රැස්වීමේදී ලබා දුන් උපදෙස් මත පාරිභෝගික සුරක්ෂිතතාව, සාධාරණ තරඟකාරීත්වය හා ඩිජිටල් පාලනය අරමුණු කර ගනිමින් පස් අවුරුදු සැලැස්ම සකස් කර ඇත. නියාමනය, නීතිය ක්‍රියාත්මක කිරීම, මානව සම්පත් සංවර්ධනය හා පර්යේෂණ ඇතුළු ප්‍රධාන උපායමාර්ගික කුළුණු 9ක් මෙයට ඇතුළත් වේ.

- **ආහාර සුරක්ෂිතතාව හා පරීක්ෂණ:** මෙම වසර තුළ ආහාර සාම්පල 265ක් පරීක්ෂා කර ඇති අතර, වෙළඳපොළෙන් ගත් බූන්දි සාම්පල 16න් 13කම හානිකර රසායනික අඩංගු බව තහවුරු වී ඇත. ආනයනික අයිස්ක්‍රීම්, කිරි තේ හා සිරප් වර්ගවල ක්ෂුද්‍රජීවී සීමා ඉක්මවා යාම හේතුවෙන් අයිස්ක්‍රීම් සාම්පල 21ක් ITI ආයතනයට යොමු කර ඇති අතර, ටින් මාළු හා බෝතල් කළ ජල කර්මාන්තශාලා පරීක්ෂාවට පියවර ගෙන ඇත.

- **නියාමනය හා මානව සම්පත්:** දියර කිරිවල ඇෆ්ලටොක්සින් සීමා නියාමනය කර ගැසට් නිවේදනයක් නිකුත් කර ඇති අතර, රූපලාවන්‍ය ක්‍රීම්වල රසදිය පරීක්ෂාවට එක්සත් ජාතීන්ගේ සංවර්ධන ආයතනය වෙතින් රුපියල් ලක්ෂ 35ක උපකරණ ලබා දී ඇත. භාණ්ඩ 50කට SLS ප්‍රමිතීන් අනිවාර්ය කර ඇති අතර, සනීපාරක්ෂක තුවා, ප්ලාස්ටික්/කිරි බෝතල් සඳහාද අලුතින් SLS ප්‍රමිතීන් පනවා ඇත. 240ක පුරප්පාඩු අතරින් නිලධාරීන් 210ක් බඳවා ගැනීමට අනුමැතිය ලැබී නිලධාරීන් 34දෙනෙකු බඳවාගෙන ඇත.

2. කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

- **සැලැස්මේ කාලරාමුව හා අනුමැතිය:** ඉදිරිපත් කළ සැලැස්ම 2027-2031 ලෙස තිබීම සම්බන්ධයෙන් කාරක සභාව විමසූ අතර, 2026 වසරේ ඉතිරි කාලය තුළ නව සැලැස්ම ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම හේතුවෙන් එසේ යොදා ගත් බවත්, උපදෙස් පරිදි එය 2026-2030 ලෙස සංශෝධනය

කරන බවත් ආයතනය ප්‍රකාශ කළේය. බාහිර සම්පත්දායකයෙකුගේ තාක්ෂණික සහයෙන් සියලු අංශ සාකච්ඡා කර සැලැස්ම සකස් කළ බවත්, දෙසැම්බර් මාසයට පෙර අධ්‍යක්ෂ මණ්ඩල නිල අනුමැතිය ලබා ගැනීමට නියමිත බව ආයතනය පැවසීය.

- **<u>පූර්ව සැලසුම්කරණය හා මූලික කාර්යසාධන දර්ශක (KPIs)</u>:** අධිකාරිය ක්ෂණික ගැටලුවලට පමණක් මැදිහත් නොවී, 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත මඟින් පැවරී ඇති කාර්යභාරයට අනුව පැහැදිලි දත්ත මත පදනම් වූ පූර්ව සැලසුම් සකස් කළ යුතු බවත්, කාර්යසාධන දර්ශක (KPIs) මත අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් ප්‍රගතිය අධීක්ෂණය කළ යුතු බවත් කාරක සභාව උපදෙස් දුන්නාය.

3. <u>ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම</u>

- **<u>ප්‍රගති වාර්තා හා පරීක්ෂණ ගාස්තු</u>:** 2025/2026 වර්ෂ සඳහා ප්‍රගති වාර්තා හා මූලික කාර්යසාධන දර්ශක (KPIs) කාලීනව රේඛීය අමත්‍යාංශයට යොමු කර නොමැති බව නිරීක්ෂණය විය. පනතේ 12 වගන්තිය අනුව SLS ප්‍රමිතීන් අනිවාර්ය කිරීමට බලය තිබුණද, පරීක්ෂණ ගාස්තු අධික වීම සහ ප්‍රතිපාදන සීමිත වීම හේතුවෙන් සාම්පල පරීක්ෂා කිරීම සීමා වී ඇති බව ආයතනය පැහැදිලි කළේය.

4. <u>කාරක සභාවේ ප්‍රධාන නිර්දේශ</u>

I. ආයතනික සැලැස්මේ අඛණ්ඩතාව පවත්වා ගැනීම සඳහා පස් අවුරුදු උපායමාර්ගික සැලැස්මේ කාලරාමුව 2027–2031 වෙනුවට 2026–2030 දක්වා සංශෝධනය කිරීමට කටයුතු කිරීම.

II. 2025/2026 වර්ෂය සඳහා වූ සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සහ දැනට සපුරාගෙන ඇති ප්‍රගතිය පිළිබඳ වාර්තාව මාසයක් ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කිරීම.

III. උපායමාර්ගික සැලැස්මට සහ ක්‍රියාකාරී සැලැස්මට අදාළව මැනිය හැකි නිශ්චිත කාර්යසාධන දර්ශක (KPIs) සකස් කර මාසයක් ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

41. නාගරික සංවර්ධන අධිකාරිය

(ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය)

පරීක්ෂා කරන ලද දිනය - 2026 සැප්තැම්බර් 22 දින

පැමිණ සිටි:
ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය (අනුකාරක සභා සභාපති), පා.ම.,
ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා, පා.ම.,
ගරු අබූබකර් අතම්බාවා මහතා, පා.ම.

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

1. ආයතනයේ කාර්යභාරය හා ක්‍රියාකාරකම්

- **පසුබිම හා නාගරික බලප්‍රදේශ:** 1978 අංක 41 දරන පනතින් පිහිටුවන ලද අධිකාරිය, පළාත් පාලන ආයතන 283ක් නාගරික බලප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කර වර්ග කි.මී. 27,000ක් හා මිලියන 14ක ජනගහනයක් ආවරණය කරයි. අධිකාරිය සතුව හෙක්ටයාර් 950ක පරම අයිතිය සහිත ඉඩම් ද, නිවාස 14,000ක් නිම කර තවත් 6,800ක් ඉදිකරමින් ද පවතී.

- **සංයුක්ත සැලැස්ම හා ඩිජිටල්කරණය:** 2025–2030 සංයුක්ත සැලැස්ම 2026 මාර්තු මස අනුමත කර ඇති අතර එහි ප්‍රගතිය 84%කි. ගොඩනැගිලි සැලසුම් සඳහා My Zone මාර්ගගත පද්ධතියත්, මහජන අදහස් සඳහා Mother Lanka ඩිජිටල් වේදිකාවත්, 'ජීවන නගර' වැඩසටහනත් සක්‍රිය කර ඇත.

- **මූල්‍ය කාර්යසාධනය හා ප්‍රසම්පාදනය:** භාණ්ඩාගාර ප්‍රතිපාදන නොලබන ස්වයංමූල්‍යකරණ ආයතනයක් වන අධිකාරිය, 2026 සඳහා රුපියල් මිලියන 7,544ක ආදායමක් හා රුපියල් මිලියන 1,953ක ලාභයක් ඉලක්ක කර අගෝස්තු වන විට රුපියල් මිලියන 1,339ක ලාභයක් ලබා ඇත. රුපියල් මිලියන 5,800ක් වටිනා ප්‍රසම්පාදන 322න් 110ක් අවසන් කර ඇත.

2. කාරක සභාවේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම

- **නගර නඩත්තුව හා පාරිසරික රෙගුලාසි:** නිදහස් චතුරස්‍රය වැනි ස්ථානවල නඩත්තුව සඳහා පෞද්ගලික ආයතන හා නගර සභා එකතු කර ගනිමින් සිංගප්පූරු මොඩලය (Singapore Model) පදනම් කරගත් පද්ධතියක් සකස් කරමින් පවතින බවත්, ගොඩනැගිලි අනුමත කිරීමේදී 35%-50% දක්වා විවෘත ඉඩකඩ තැබීම හා ශාක වැවීම අනිවාර්ය කිරීමට නව රෙගුලාසි සකස් කරන බවත් ආයතනය පැවසීය.

- **<u>ප්‍රාග්ධන ව්‍යාපෘති ප්‍රමාදයන්</u>:** රුපියල් මිලියන 2,399.5ක ප්‍රතිපාදන ඇති ප්‍රධාන ව්‍යාපෘති 14ක ප්‍රමාදයන් සම්බන්ධයෙන් පැහැදිලි කරමින්, 'ජීවන නගර' ව්‍යාපෘතිය මාර්තු මස ඇරඹීම හේතුවෙන් ටෙන්ඩර් කැඳවීමට කාලයක් ගත වූ බවත්, ගාල්ල කොටුව තැපැල් කාර්යාලය පෞද්ගලික ආයෝජනයකට පැවරීමට කැබිනට් අනුමැතිය ලැබී ඇති බවත් ආයතනය පැවසීය.

3. <u>ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ හා ආයතනික පැහැදිලි කිරීම</u>

- **<u>ප්‍රසම්පාදන සැලසුම් අනුමැතිය</u>:** සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය සඳහා යොමු කර ඇති බවත්, අදාළ අනුමැතිය ලද පසු මුදල් අමාත්‍යාංශයට සහ විගණකාධිපති වෙත ලබා දීමට කටයුතු කරන බවත්, ජාතික විගණන කාර්යාලයේ විමසීම්වලට පිළිතුරු දෙමින් ආයතනය ප්‍රකාශ කළේය.

4. <u>කාරක සභාවේ ප්‍රධාන නිර්දේශ</u>

IV. ව්‍යාපෘති ඉදිකර අවසන් කිරීමෙන් පසුව ඒවා විනාශ වීමට නොදී පවත්වාගෙන යාම සඳහා විධිමත් නඩත්තු සැලසුමක් සකස් කොට පළාත් පාලන ආයතන (නගර සභා/ප්‍රාදේශීය සභා) සමඟ ඒකාබද්ධ වී අවම වශයෙන් මාස 3කට වරක්වත් පසු විපරම් (Review) කිරීම සඳහා ඉවහල් වන පද්ධතියක් සංයුක්ත සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු කිරීම.

V. නාගරික සැලසුම් අනුමත කිරීමේදී ගොඩනැගිලිවලට අමතරව පරිසරය සුරැකීම, ගස්කොළන් වගා කිරීම, විවෘත ඉඩකඩ (Open spaces) තැබීම සහ ජලය පොළොවට උරාගන්නා ක්‍රමවේද අනිවාර්ය කෙරෙන නීති/රෙගුලාසි ඇතුළත් කිරීම අදාළ නාගරික සැලසුම්වල ප්‍රධාන කරුණක් ලෙස සැලසුමට ඇතුළත් කිරීමට කටයුතු කිරීම.

VI. සංයුක්ත සැලැස්මේ අඩංගු නමුත් මෙතෙක් ක්‍රියාත්මක නොවූ යෝජනා, නව යෝජනා සහ අයවැය ප්‍රගතිය පිළිබඳව මාසයක් ඇතුළත සමාලෝචන වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

VII. නාගරික සැලසුම් හා නිවාස ව්‍යාපෘති සකස් කිරීමේදී නිලධාරී මට්ටමින් පමණක් තීරණ නොගෙන, ජනතාවගේ බිම් මට්ටමේ (Ground-level) අවශ්‍යතා හා අදහස් විමසීමට කටයුතු කිරීම සහ ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර සමාජ විද්‍යාඥයින් යොදවා

සමාජ සමීක්ෂණ (Social Surveys) සහ පාරිසරික අධ්‍යයන සිදු කර, ප්‍රාදේශීය නායකයින් හා ජනතාව සහභාගි කරගනිමින් සැලසුම් සකස් කිරීමේ පදනම සකසා ගැනීමට කටයුතු කිරීම.

VIII. **වාර්ෂික අයවැයේ ප්‍රගතිය සම්බන්ධයෙන් සමාලෝචනයක් කාරක සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.**

IX. **ආයතනයේ මූලික කාර්යසාධන දර්ශකවල (KPIs) ප්‍රගතිය කාරක සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.**

<u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ III වැනි අනුකාරක සභාව හමුවේ පළමු අදියර ලෙස සිය ආයතනික සැලසුම් ඉදිරිපත් කළ ආයතන 41හි සංයුක්ත සහ ක්‍රියාකාරී සැලසුම්වල ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) පිළිබඳ ප්‍රගති සමාලෝචන රැස්වීම</u>

2026 ඔක්තෝබර් මස 22 වැනි දින

පැමිණි සිටි:
ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා, පා.ම., (සභාපති)
ගරු සුදත් බලගල්ල මහතා, පා.ම.,
ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා, පා.ම.,
ගරු රුවන් මාපලගම මහතා, පා.ම.,
ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම.,
ගරු දිනේෂ් හේමන්ත මහතා, පා.ම.,

සහයට පැමිණි සිටි:
විගණකාධිපති සමුදිකා ජයරත්න මහත්මිය ඇතුළු ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ඩී.සී. ජයදේව මහත්මිය ඇතුළු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් චම්පිකා පතිරණ මහත්මිය ඇතුළු කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ඩී.ඒ.ඒ.යූ. ගුණසේකර මහතා ඇතුළු ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්

<u>රැස්වීමේ අරමුණ හා පසුබිම</u>

2026 ඔක්තෝබර් මස 22 වැනි දින පෙ.ව. 10.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කාරක සභා අංක 01 හිදී පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා, පා.ම., ගේ ප්‍රධානත්වයෙන් මෙම රැස්වීම පැවැත්විණි.

2026 ජූලි මස 07 වැනි දින සිට 2026 සැප්තැම්බර් මස 25 වැනි දින දක්වා කාලය තුළ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ III වැනි අනුකාරක සභාව හමුවේ සිය ආයතනික සැලසුම් ඉදිරිපත් කරන ලද ආයතන 41හි සංයුක්ත හා ක්‍රියාකාරී සැලසුම්වල අන්තර්ගත ප්‍රධාන කාර්යසාධන දර්ශක (Key Performance Indicators – KPIs) ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම මෙම රැස්වීමේ මූලික අරමුණ විය.

එහිදී අදාළ ආයතනවල සැලසුම්ගත අරමුණු, කාර්යසාධන දර්ශක, ඒවා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සහ රාජ්‍ය ආයතනවල කාර්යක්ෂමතාව හා වගවීම ඉහළ නැංවීම

සම්බන්ධයෙන් විවිධ පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරන ලද අදහස් හා නිරීක්ෂණ පහත පරිදි වේ.

1. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා, පා.ම., විසින් ඉදිරිපත් කරන ලද අදහස් හා නිරීක්ෂණ

- **කාරක සභාවේ නව ප්‍රවේශය සහ මූල්‍ය විනය තහවුරු කිරීම**

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් අනුගමනය කරනු ලබන නව ක්‍රියාකාරී ප්‍රවේශය ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම මත පදනම්ව, රාජ්‍ය ආයතන සමඟ සහයෝගයෙන් හා සුහදශීලීව කටයුතු කරමින් එම ආයතනවල මූල්‍ය විනය, කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව ඉහළ නැංවීම අරමුණු කරගත් වැඩපිළිවෙළක් බව සභාපතිවරයා අවධාරණය කරන ලදී.

- **නීත්‍යානුකූල බලතල සහ ආයතනික වගකීම්**

ඕනෑම රාජ්‍ය ආයතනයක් විසින් සිදු කරනු ලබන කාර්යයක් සඳහා අදාළ පනතකින්, චක්‍රලේඛයකින් හෝ වෙනත් ලිඛිත නීතියකින් නීත්‍යානුකූල බලය පැවරී තිබේද යන්න විගණන ක්‍රියාවලියේදී මූලික වශයෙන් සලකා බැලිය යුතු බව පෙන්වා දෙන ලදී. එසේම, නීත්‍යානුකූල බලයක් නොමැතිව කටයුතු කිරීම මෙන්ම පවරා ඇති බලතල නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම ද ආයතනික අකාර්යක්ෂමතාව හා පාලන දුර්වලතා ඇති කිරීමට හේතු වන බව අවධාරණය කරන ලදී.

- **ආයතනික සැලසුම් සකස් කිරීමේ අවශ්‍යතාව**

අතීතයේ සිදු වූ සිදුවීම් හා අක්‍රමිකතා සම්බන්ධයෙන් පසු විපරම් කිරීමෙන් ඔබ්බට ගොස්, කාරක සභාව විසින් අධීක්ෂණය කරනු ලබන රාජ්‍ය ආයතන 457 සඳහාම සංයුක්ත සැලසුම්, ක්‍රියාකාරී සැලසුම්, ප්‍රසම්පාදන සැලසුම් සහ අයවැය සැලසුම් ක්‍රමානුකූලව සකස් කිරීමේ අවශ්‍යතාව කාරක සභාව විසින් අවධාරණය කර ඇති බව සඳහන් කරන ලදී. එම සැලසුම් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලද ආයතන සඳහා ඒවා කාරක සභාව හමුවේ ඉදිරිපත් කර පැහැදිලි කිරීමේ අවස්ථාව ද ලබා දී ඇති බව වැඩිදුරටත් සඳහන් කරන ලදී.

- **අභ්‍යන්තර විගණනයේ කාර්යභාරය පුළුල් කිරීම**

අභ්‍යන්තර විගණනය යනු ආයතනයක කටයුතු සිදු කිරීමෙන් අනතුරුව ඒවා පරීක්ෂා කිරීමකට පමණක් සීමා නොවිය යුතු බවත්, ආයතනයේ ඉදිරි සැලසුම් හා ක්‍රියාකාරකම් පූර්වයෙන් සමාලෝචනය කරමින් ඇතිවිය හැකි ගැටලු, අවදානම් සහ නීතිමය බාධා කල්තියා හඳුනාගෙන කළමනාකරණයට අවශ්‍ය මඟපෙන්වීම් ලබා දෙන සක්‍රීය ක්‍රියාවලියක් බවට පත් විය යුතු බවත් සභාපතිවරයා පෙන්වා දෙන ලදී.

- **රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය**

එකිනෙකට සම්බන්ධිත රාජ්‍ය ආයතන අතර ප්‍රමාණවත් සම්බන්ධීකරණයක් නොමැති වීම සහ ඒ ඒ ආයතනවල සැලසුම් අතර නිසි ගැළපීමක් නොපැවතීම හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමාදයන් ඇති වන බව පෙන්වා දෙන ලදී. එබැවින්, අදාළ ආයතන අතර මනා සම්බන්ධීකරණයක් සහ ඒකාබද්ධ සැලසුම්කරණයක් පවත්වාගෙන යාමේ වැදගත්කම අවධාරණය කරන ලදී.

2. විගණකාධිපති සමුදිකා ජයරත්න මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද අදහස් හා නිරීක්ෂණ

- **ආයතනික පරමාර්ථ හා උපායමාර්ගික සැලසුම් අතර සම්බන්ධතාව**

සෑම රාජ්‍ය ආයතනයක්ම තමන් පිහිටුවීමේ මූලික අරමුණු හා ව්‍යවස්ථාපිත කාර්යභාරය පැහැදිලිව හඳුනාගත යුතු බව පෙන්වා දෙන ලදී. එම මූලික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මැනිය හැකි ඉලක්ක සහිත උපායමාර්ගික සැලසුම් හා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම අත්‍යවශ්‍ය බව ද අවධාරණය කරන ලදී.

- **ප්‍රතිදාන කාර්යසාධන දර්ශක වෙනුවට ප්‍රතිඵල හා බලපෑම් මත පදනම් වූ කාර්යසාධන දර්ශක භාවිත කිරීම**

ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) සකස් කිරීමේදී හුදෙක් සිදු කරන ලද කාර්යයන් හෝ ලබා දුන් සේවාවන් ප්‍රමාණාත්මකව දැක්වීමෙන් ඔබ්බට ගොස්, එම කාර්යයන් තුළින් ජනතාවට සහ රටට අත් වූ සැබෑ ප්‍රතිඵල හා බලපෑම් මැනිය හැකි දර්ශක හඳුන්වා දීමේ අවශ්‍යතාව අවධාරණය කරන ලදී.

උදාහරණයක් ලෙස, වැවකින් ඉවත් කරන ලද රොන්මඩ ප්‍රමාණය වැනි ප්‍රතිදාන දර්ශකයකට පමණක් සීමා නොවී, එමඟින් වැවේ ජල ධාරිතාව වැඩිවීම සහ ඒ හේතුවෙන් අලුතින් වගා කළ හැකි වූ භූමි ප්‍රමාණය වැනි අවසාන ප්‍රතිඵල මැනීම සඳහා දර්ශක සකස් කළ යුතු බව පෙන්වා දෙන ලදී.

- **තරඟකාරී හා ඒකාධිකාරී රාජ්‍ය ආයතන සඳහා කාර්යසාධන දර්ශකවල වැදගත්කම**

පෞද්ගලික අංශය සමඟ තරඟකාරී පරිසරයක ක්‍රියාත්මක වන බැංකු හා රක්ෂණ ආයතන වැනි රාජ්‍ය ආයතනවල කාර්යසාධනය ඇගයීම සඳහා නිසි කාර්යසාධන දර්ශක භාවිත කිරීමේ වැදගත්කම පෙන්වා දෙන ලදී. එසේම, ලංකා ගමනාගමන මණ්ඩලය සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වැනි ඒකාධිකාරී හෝ සීමිත තරඟකාරී පරිසරයක ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතනවල ද ආයතනික අරමුණු ඉටු කර ගැනීමේ ප්‍රගතිය මැනීම සඳහා විධිමත් කාර්යසාධන දර්ශක පද්ධතියක් පැවතීම අත්‍යවශ්‍ය බව අවධාරණය කරන ලදී.

- **විගණන වාර්තා තුළ ආයතනික මූලික අරමුණු සාක්ෂාත් කිරීම ඇගයීම**

පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන විගණන වාර්තාවලට අදාළ ආයතනය පිහිටුවීමේ මූලික අරමුණු සහ එම අරමුණු සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය පිළිබඳ විශේෂ ඡේදයක් ඇතුළත් කිරීම සඳහා ජාතික විගණන කාර්යාලය විසින් පියවර ගෙන ඇති බව විගණකාධිපතිවරිය විසින් සඳහන් කරන ලදී.

3. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ කේ.වී.සී. දිල්රුක්ෂි මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද අදහස් හා නිරීක්ෂණ

- **ජාතික ප්‍රතිපත්ති හා තිරසාර සංවර්ධන අරමුණු සමඟ අනුගත වීම**

රාජ්‍ය ආයතන සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශක සකස් කිරීමේදී අදාළ ආයතනයට පැවරී ඇති බලතල හා කාර්යභාරය පමණක් නොව, එම ආයතනය අයත් අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිමය දිශානතිය, ජාතික ප්‍රතිපත්ති සහ තිරසාර සංවර්ධන අරමුණු (SDGs) සමඟ ද අනුගත වන පරිදි එම දර්ශක සකස් කළ යුතු බව පෙන්වා දෙන ලදී.

- **සාමූහික අභිප්‍රාය ප්‍රකාශන සහ නව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ නීතිමය රාමුව**

2028 වර්ෂය වන විට රාජ්‍ය ව්‍යාපාර සමඟ සාමූහික අභිප්‍රාය ප්‍රකාශන (Statement of Corporate Intent – SCI) සම්බන්ධ ගිවිසුම්වලට එළඹීම සඳහා කටයුතු කරමින් පවතින බව සඳහන් කරන ලදී. තවද, නව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ රාජ්‍ය ආයතන විසින් සිය උපායමාර්ගික සැලසුම්, අයවැය සැලසුම් සහ ප්‍රසම්පාදන සැලසුම් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම අනිවාර්ය වන බව ද පෙන්වා දෙන ලදී.

- **සැලසුම් හා ප්‍රගති වාර්තාකරණය අතර අනුකූලතාව පවත්වා ගැනීම**

රාජ්‍ය ආයතන විසින් සකස් කරනු ලබන ක්‍රියාකාරී සැලසුම්, අයවැය ඇස්තමේන්තු සහ කාරක සභාව වෙත ඉදිරිපත් කරනු ලබන ප්‍රගති වාර්තා අතර පැහැදිලි අනුකූලතාවක් හා සම්බන්ධතාවක් පැවතිය යුතු බව අවධාරණය කරන ලදී. එසේම, ආයතනවල මූල්‍ය කාර්යසාධනය පමණක් නොව, රාජ්‍ය ආයතන ලෙස සමාජය වෙත ලබා දෙන දායකත්වය සහ එමඟින් අත්කර දෙන ප්‍රතිලාභ ද කාර්යසාධන වාර්තාකරණයට ඇතුළත් කළ යුතු බව පෙන්වා දෙන ලදී.

4. කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ

ඉහත සාකච්ඡාවලදී ඉදිරිපත් වූ කරුණු සැලකිල්ලට ගනිමින්, රාජ්‍ය ආයතනවල ආයතනික සැලසුම් හා ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) සම්බන්ධයෙන් කාරක සභාව විසින් පහත කරුණු අවධාරණය කරන ලදී.

1. රාජ්‍ය ආයතනවල මූලික අරමුණු හා ව්‍යවස්ථාපිත කාර්යභාරයට අනුකූලව සංයුක්ත හා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම.
2. හුදෙක් ඉටු කරන ලද කාර්යයන් ප්‍රමාණය මැනීම වෙනුවට, එමඟින් අත්කරගත් ප්‍රතිඵල හා ජනතාවට ලැබුණු ප්‍රතිලාභ මැනිය හැකි පරිදි ප්‍රධාන කාර්යසාධන දර්ශක සකස් කිරීම.
3. ආයතනික සැලසුම්, අයවැය සහ ප්‍රසම්පාදන සැලසුම් අතර අනුකූලතාව පවත්වා ගැනීම.
4. සැලසුම්ගත ඉලක්කවලට සාපේක්ෂව අත්කරගෙන ඇති ප්‍රගතිය අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ ප්‍රගති වාර්තා නිසි පරිදි යාවත්කාලීන කිරීම.
5. අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය ශක්තිමත් කරමින්, ආයතනික අවදානම් හා ක්‍රියාත්මක කිරීමේ බාධා කල්තියා හඳුනා ගැනීම.
6. අදාළ රාජ්‍ය ආයතන, අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු අතර මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම.
7. මූල්‍ය කාර්යසාධනයට අමතරව රාජ්‍ය ආයතනවල සමාජීය දායකත්වය හා සේවා සැපයීමේ ගුණාත්මකභාවය ද කාර්යසාධන ඇගයීමේදී සැලකිල්ලට ගැනීම.

5. ඉදිරි ක්‍රියාමාර්ග

ඒ අනුව, අදාළ ආයතන විසින් තම ප්‍රධාන කාර්යසාධන දර්ශක නැවත සමාලෝචනය කර, මැනිය හැකි ඉලක්ක හා කාලසීමා සහිතව ප්‍රගතිය වාර්තා කිරීමේ ක්‍රමවේදයක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාව අවධාරණය කරන ලදී.

තවද, අදාළ ආයතනවල KPI ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා ජාතික විගණන කාර්යාලය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුව අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීමේ වැදගත්කම ද පෙන්වා දෙන ලදී.

6. නිගමනය

රාජ්‍ය ආයතනවල කාර්යසාධනය ඇගයීම අතීත කාර්යසාධනය පරීක්ෂා කිරීමට පමණක් සීමා නොකර, සැලසුම්ගත ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය අඛණ්ඩව අධීක්ෂණය කරන ක්‍රියාවලියක් බවට පත් කිරීමේ අවශ්‍යතාව මෙම රැස්වීමේදී අවධාරණය විය. ඒ තුළින් රාජ්‍ය ආයතනවල කාර්යක්ෂමතාව, ඵලදායිතාව, විනිවිදභාවය හා වගවීම ඉහළ නැංවීම අපේක්ෂා කරන ලදී.

ඇමුණුම 01

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග

120 - පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

120. (1) තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන් නොවන සාමාජික මන්ත්‍රීවරයන් දහසය දෙනෙකුගෙන් සමන්විත පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) රාජ්‍ය සංස්ථා සහ මුළුමනින්ම හෝ කොටසක් ආණ්ඩුව විසින් අරමුදල් සපයනු ලබන ආයතනවල ගිණුම් සහ යම් ලිඛිත නීතියක් මඟින් ආණ්ඩුවට පවරා ගන්නා ලද යම් ව්‍යාපාරයක් හෝ වෙනත් පැවරීමක් සම්බන්ධව පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන ගිණුම්, විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යය විය යුත්තේ ය.

(3) යම් රාජ්‍ය සංස්ථාවක හෝ යම් ලිඛිත නීතියක් මගින් ආණ්ඩුවට පවරන ලද ව්‍යාපාරයක හෝ වෙනත් පැවරීමක පරීක්ෂා කරන ලද ගිණුම් සම්බන්ධයෙන් සහ ඉන් පැන නඟින යම් කාරණයක් සම්බන්ධයෙන් අයවැය හා වාර්ෂික ඇස්තමේන්තු, මූල්‍ය, මූල්‍ය කාර්ය පටිපාටිය, කාර්ය සාධනය හා සාමාන්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින්, සෑම මාස තුනකට වරක්, පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුත්තේ ය. රාජ්‍ය මූල්‍ය නිසි පරිදි පරිහරණය කිරීම සහතික කරලනු වස්, ඊට අදාළ කාරණාවලට විසඳුම් සැපයෙන ක්‍රියාමාර්ග පිළිබඳ නිරීක්ෂණ සහ නිර්දේශ මෙම වාර්තාවට අඩංගු විය යුත්තේ ය.

(4) පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ යම් වාර්තාවක් මුදල් විෂය භාර අමාත්‍යවරයාට සහ ආයතන භාර අමාත්‍යවරයන්ට යොමු කරනු ලැබිය යුතු අතර, එවිට, මුදල් විෂය භාර අමාත්‍යවරයා සහ ආයතන භාර අමාත්‍යවරයන් විසින් ඒ සම්බන්ධයෙන් සිය නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර සති අටක් ඇතුළත දී, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම නිරීක්ෂණ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම හෝ එම නිර්දේශ සම්පූර්ණ කළ නොහැකි බව අමාත්‍යවරයාගේ අදහස නම්, රාජ්‍ය මුදල් නිසි ලෙස භාවිතා කිරීම පිළිබඳ ගතයුතු විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ ලිඛිතව හේතු පැහැදිලි කළ යුතු අතර, කාරක සභාවට අවශ්‍ය වන්නේ නම් අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිලි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට ආරාධනාවක් කළ හැකි අතර එවැනි කාරණා වලින් පැන නඟින ප්‍රශ්නවලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුත්තේ ය.

පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී, එකී වාර්තාව නීතිපතිවරයාගේ නිරීක්ෂණ සහ අවශ්‍ය කටයුතු සඳහා යොමු කරනු ලැබිය හැකි ය.

*පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා පරීක්ෂා කිරීමේ දී බරපතල මූල්‍ය වංචා, අල්ලස් හෝ දූෂණ ක්‍රියාවන් සිදුව ඇති බවට කාරක සභාව නිගමනය කළහොත් ඒ පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ පසු පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවකදී, එකී සිද්ධීන් සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම සඳහා එකී සිද්ධීන් සෘජුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හෝ පොලිස්පතිවරයාට කාරක සභාව විසින් යොමු කරනු ලැබිය හැකි ය.

(5)(අ) **පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියම කරනු ලබන කවර හෝ රාජ්‍ය සංස්ථාවක හෝ කිසියම් ලිඛිත නීතියක් යටතේ ආණ්ඩුවට පැවරී ඇත්තා වූ යම් ව්‍යාපාරයක හෝ වෙනත් පැවරීමක සියලුම ගිණුම්, අයවැය හා වාර්ෂික ඇස්තමේන්තු මූල්‍ය තත්ත්වය සහ කළමනාකාරිත්වය පරීක්ෂාකර කාරක සභාවට වාර්තා කරනු ලැබීම පිණිස පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට අවශ්‍ය යැයි හැඟී ගිය අවස්ථාවක දී, කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත අනු කාරක සභා පත්කරනු ලැබිය හැකි ය.**

(ආ) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ හෝ කාරක සභාව විසින් පත් කරන ලද ඕනෑම අනු කමිටුවක් අවශ්‍ය පරිදි පාර්ලිමේන්තුවේ හෝ කාරක සභාව විසින් තීරණය කරනු ලබන ඕනෑම අදාළ ආයතනයක රැස්වීම් පැවැත්වීම සඳහා ඉඩ දෙනු ලැබිය හැකි ය.

(ඇ) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයාගේ අවසරය ඇතිව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාමාජිකයන් නොවන වෙනත් යම් මන්ත්‍රීවරයන්ට එම කාරක සභාවේ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා ඉඩ දෙනු ලැබිය හැකි ය.

(6) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් හෝ එහි යම් අනු කාරක සභාවක් විසින් සිය කාර්යය ඉටුකරනු ලැබීම සඳහා යම් තැනැත්තකු එම කාරක සභාව ඉදිරියට කැඳවනු ලැබීමට සහ ප්‍රශ්න කරනු ලැබීමට ද යම් ලියකියවිලි, පොත්, වාර්තා හෝ වෙනත් ලේඛන ගෙන්වා ගෙන පරීක්ෂා කරනු ලැබීමට ද, ගබඩා සහ දේපලවලට ප්‍රවේශ වීමට ද බලය තිබිය යුත්තේ ය.

(7) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් පස් දෙනෙකුගෙන් සංයුක්ත විය යුත්තේ ය. පිළිගත හැකි හේතුවක් මත කාරක සභාවේ අවසර ලබා නොගෙන එහි අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණෙන යම් සාමාජික

මන්ත්‍රීවරයකු එම කාරක සභාවේ සාමාජිකත්වය අත්හැර ගියාසේ සලකනු ලැබිය යුත්තේ ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග

131 - කාරක සභා සඳහා පොදු රීති

131. (1) 85(1) (අ) ස්ථාවර නියෝගයේ සඳහන් විධිවිධානය හැර අනෙකුත් අවස්ථාවලදී මහ ලේකම්වරයා හෝ මහ ලේකම්වරයා විසින් නම් කරනු ලබන පාර්ලිමේන්තුවේ වෙනත් යම් නිලධරයකු එක් එක් කාරක සභාවේ ලේකම්වරයා විය යුත්තේ ය.

(2) එක් එක් කාරක සභාවක් විසින්, එම කාරක සභාව විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාල සීමාවක් තුළ යම් කාරණා සම්බන්ධයෙන් විභාගකර එම කාරක සභාවට වාර්තා කිරීම සඳහා සුදුසු යැයි සලකනු ලබන අවස්ථාවකදී, කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත අනු කාරක සභා පත් කරනු ලැබිය හැකි ය. එම කාරක සභා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවක දී, එම අනු කාරක සභාවල කර්තව්‍යය ඉටු කරනු ලැබීම සඳහා එම අනු කාරක සභා ඉදිරියට යම් තැනැත්තන් කැඳවා ප්‍රශ්න කරනු ලැබීමට ද යම් ලියකියවිලි වාර්තා හෝ ලේඛන ගෙන්වා ගෙන පරීක්ෂා කරනු ලැබීමට ද, ඊට යොමුකර තිබෙන කාරණා පූර්ණ වශයෙන් සලකා බැලීම සඳහා තැනින් තැනට යාමටත්, පාර්ලිමේන්තුව යම් කල් තැබීමක් කරනු ලැබ තිබීම නොසලකා රැස්වීම් පවත්වනු ලැබීමටත්, එම අනු කාරක සභාවලට බලය පවරනු ලැබිය හැකි ය.

(3) (2) ඡේදය යටතේ පත් කරනු ලබන එක් එක් අනු කාරක සභාවක්ම සභාපතිවරයකු සහ කාරක සභාව විසින් කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයන් අතුරින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුත්තේ ය. එම අනු කාරක සභාවේ සභාපතිවරයා ඇතුළු සාමාජිකයන් දෙදෙනකුගෙන් එහි ගණපූරණය සමන්විත විය යුත්තේ ය.
කාරක සභාවේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන කාර්ය මණ්ඩලයේ නිලධරයකු, එවැනි සෑම අනු කාරක සභාවක ම ලේකම්වරයා විය යුතු අතර එවැනි සෑම අනු කාරක සභාවක ම කාර්ය සටහන් පිළියෙල කර පවත්වාගෙන යනු ලැබිය යුත්තේ ය.

(4) කාරක සභාවේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන කාර්ය මණ්ඩලයේ නිලධරයකු, එවැනි සෑම අනු කාරක සභාවක ම ලේකම්වරයා විය යුතු අතර එවැනි සෑම අනු කාරක සභාවක ම කාර්ය සටහන් පිළියෙල කර පවත්වාගෙන යනු ලැබිය යුත්තේ ය.

(5) කාරක සභාවක හෝ අනු කාරක සභාවක වාර්තාව සභාපතිවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර සභාපතිවරයා පැමිණ නොසිටින අවස්ථාවකදී සභාපතිවරයා විසින් බලය පවරන ලද කාරක සභාවේ වෙනත් යම් සාමාජික මන්ත්‍රීවරයකු විසින් පිළිගන්වනු ලැබිය යුත්තේ ය.

(6) එක් අනු කාරක සභාවක සභාපතිවරයා වශයෙන් කටයුතු කරනු ලබන කාරක සභාවේ යම් සාමාජික මන්ත්‍රීවරයකු එම කාරක සභාවේම වෙනත් යම් අනු කාරක සභාවක එකම අවස්ථාවක දී, සභාපතිවරයකු වශයෙන් කටයුතු කරනු නොලැබිය යුත්තේ ය.

(7) කාරක සභාවක යම් වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කර තිබෙන අවස්ථාවක දී, සති අටක කාල සීමාවක් ඇතුළත දී, එම වාර්තාවේ අන්තර්ගතය සම්බන්ධයෙන් අදාළ අමාත්‍යවරයා විසින් ප්‍රතිචාර දක්වනු ලැබිය යුතු බවට පාර්ලිමේන්තුව විසින් නියම කරනු ලැබිය හැකි ය. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ එවැනි යම් වාර්තාවක් සම්බන්ධයෙන් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ ප්‍රතිචාරය සභාගත කරනු ලැබිය යුත්තේ ය. අනෙකුත් කාරක සභාවල වාර්තා සම්බන්ධයෙන් අදාළ අමාත්‍යවරයන් විසින් ප්‍රතිචාර දක්වනු ලැබිය යුත්තේ ය.

(8) යම් කාරක සභාවක් සහ එම කාරක සභාව විසින් පත් කරනු ලැබූ අනු කාරක සභාවක් පාර්ලිමේන්තුවෙන් පිටත රැස්වීම සඳහා කථානායකවරයාගේ අවසරය ලබා ගනු ලැබිය යුත්තේ ය.

(9) කථානායකවරයාගේ අනුමතියට යටත්ව කාරක සභාවල නියමයන්ට අනුව තොරතුරු සැපයීම හෝ සංකීර්ණ කාරණා වැඩිදුරටත් පැහැදිලි කර ගැනීම සඳහා විශේෂඥ දැනුමක් ඇති තැනැත්තන් පත් කරනු ලැබීමට සහ එම තැනැත්තන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබීමට එම කාරක සභාවට බලය තිබිය යුත්තේ ය.

(10) සෑම කාරක සභාවක් ම සහ එම කාරක සභාව විසින් ම පත් කරනු ලබන යම් අනු කාරක සභාවකට කාරක සභාව විසින් බලය පවරනු ලැබූ විට, කථානායකවරයාගේ අනුමතිය ඇතිව සිය රැස්වීම් සඳහා පිට අය ඇතුළත් කර ගැනීමට බලය තිබිය යුත්තේ ය. කාරක සභාව හෝ අනු කාරක සභාව විසින් සාකච්ඡා පවත්වනු ලබන අවස්ථාවේ දී, එම අමුත්තන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(11) පිට අය ඇතුළත් කර ගැනීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය කාරක සභාවේ හෝ අනු කාරක සභාවේ සභාපතිවරයා විසින් නිශ්චය කරනු ලැබිය යුත්තේ ය.

(12) පාර්ලිමේන්තුවේ ගැලරි සඳහා ආගන්තුකයන් ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් අදාළ රීති කාරක සභාවට හෝ අනු කාරක සභාවකට හෝ පිට අය ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් ද අදාළ විය යුත්තේ ය.

(13) කාරක සභාවක් හෝ අනු කාරක සභාවක සභාපතිවරයාට, අවස්ථාවෝචිත පරිදි, කාරක සභාවේ හෝ අනු කාරක සභාවේ රැස්වීම්වල විනය පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් කථානායකවරයාට තිබෙන බලය ම තිබිය යුත්තේ ය.